# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,854 — 1969 මැයි 15 වැනි බ්‍රහස්පතින්ද — 1969.5.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී.)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු | 743 | ආණ්ඩුවේ නොවන දැන්වීම් | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 768 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් | 774 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | 790 |
| බඩු බාහිරාදිය විකිණීම | 788 | විවිධ දැන්වීම් | 794 |


[සැලකිය යුතුය.—1965 ජූලි සිට දෙසැම්බර් දක්වා නිකුත් අංක 14,438 සිට 14,604 දක්වා ඇති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවන්ට සූචියක් මෙම ගැසට් පත්‍රයට අතිරේකයක් වශයෙන් පළවේ.]

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිය යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයෙහි සිටින්නන්ට හැර සෙසු සැමට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

සටහන් :

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිධරයින් හෝ එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. වැනි පශ්චාත් උපාධි ලබා ඇත්තාවූ අය, වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් ලැබීමට හිමිකම් ලබති ;

(ii) ගුරු අභ්‍යාස විද්‍යාලයක හෝ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක හෝ ලංකා කාර්මික විද්‍යාලයේ හෝ එවැනි උසස් තත්වයකට සමාන හෝ උසස් පිළිගත් ආයතනයක අවුරුදු 3 ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති උපාධිධරයින්ට ද වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් නියම කරනු ලැබේ ;

(iii) ඒ. එම්. අයි. සී. ඊ., ඒ. එම්. අයි. ඊ. ඊ. හෝ ඒ. එම්. අයි. යාන්ත්‍රික ඉංජිනේරු (ලන්ඩන්) වැනි සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ඇත්නම්, ඔවුන්ටද වර්ෂයකට රු. 7,320 ක ආරම්භක වැටුපක් හිමි වේ.

පිළිගත් විශ්ව විද්‍යාලයකින්, ඉංජිනේරු උපාධි ලත් II වැනි ශ්‍රේණියේ කථිකාචාර්යවරුන් ඔවුන්ගේ වැටුප් ක්‍රමයේ උපරිමය වන වර්ෂයකට රු. 8,400 වැටුප් පියවරට පැමිණ එක් අවුරුද්දක් එම වැටුප් පියවරෙහි සේවය කරනු ලැබුවේ නම්, ඔව්හු රු. 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධකයන් සහිතව, අවුරුද්දකට රු. 10,800 ක වැටුප් පියවර දක්වා වැටුප් ලැබීමට හිමිකම් ලබති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(බී) 1969.5.30 වැනිදා තමන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ) ;

(සී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු විද්‍යා විෂයයන් සහිතව ශාස්ත්‍රවේදී ඉංජිනේරු උපාධියක් (බී.එස්.සී. ඉංජිනේරු) හෝ (ii) ඒ. ඇම්. අයි. සී. ඊ. I වැනි හා II වැනි කොටස්වලින් සමත්වීම, හෝ

(iii) සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම, සහ

(iv) සිංහලෙන් ඉගැන්වීමට පුළුවන්වීම හෝ පත්වීමේ දින සිට අවුරුදු 3 ක කාලයක් ඇතුළතදී සිංහල භාෂාවේ ප්‍රවීණත්වයක් ලබා ගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.) ;

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක නැතහොත් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය ;

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය ;

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද (බී සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සමග භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මැයි මස 7 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

**5–475/1—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය**

---

**අංකය : ඒඒ 42/එක්ස්. 2086/69.**

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### විදුලි ඉංජිනේරු විද්‍යා II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ "හාඩි" ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ විදුලි ඉංජිනේරු විද්‍යා II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 මැයි මස 30 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 ජූනි මස 6 වැනිදා.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූ ද, තම ලිපිනය ලියන ලද්දා වූද, මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුයි ;

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය ;

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන ;

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—

වාර්ෂිකව රුපියල් 4,080—360—රු. 8,400.

යම්කිසි අයදුම්කරුවෙකුට ඔහුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව අනුග්‍රහයක් දීමට සුදුසුයැයි හැඟේ නම්, භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව, ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ ඉහළ ස්ථානයක ඔහු පිහිටුවනවා ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1969 මැයි මස 30 වැනිදාට තමාගේ වයස අවුරුදු විසි දෙකකට නො අඩු බව හා අවුරුදු තිස්පහට නොවැඩි බව. (රජයේ සේවයේ තනතුරු දරන්නන් කෙරෙහි මෙහි උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, සංඛ්‍යාලේඛන විද්‍යාව, ගණිතය, භූගෝල විද්‍යාව, කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව හෝ සමාජවේදය පිළිබඳ පළවෙනි හෝ දෙවෙනි පන්තියේ ගෞරව උපාධියක් ලැබූ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙක් හෝ ඉහත සඳහන් විෂයකින් පශ්චාත් උපාධියක් ලැබූවෙක් බව.

**සටහන**—

ක්‍රම සම්පාදන සේවක සංඛ්‍යාවේ නිලධාරියකු වශයෙන් සේවය කිරීමට අවශ්‍ය නිපුනත්වය ලබා ගැනීම සඳහා යෝග්‍ය පරිදි පුහුණු වීමට යම් අයදුම්කරුවකු කැමැත්තේ නම්, ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මය හෝ වෙනත් විද්‍යා විෂයකින් පළමුවැනි පන්තියේ හෝ දෙවැනි පන්තියේ ගෞරව උපාධියක් ද, එසේ නැත්නම් කලා හෝ විද්‍යා අංශයේ පළමුවැනි පන්තියේ උපාධියක් ද සුදුසුකම ලෙස සලකනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු.**—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මැයි මස 7 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
නැ. පෙ. 500.

5–475/3—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/4/73.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1970—මැලේසියානු පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

1970 මැයි මස සිට පහත සඳහන් ක්ෂේත්‍රයයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණ හෝ සඳහා මැලේසියානු රජය විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ :—

කලා විෂයයන්
විද්‍යා විෂයයන්
වෛද්‍ය විද්‍යාව
කෘෂිකර්මය
ඉංජිනේරු විද්‍යාව
ආර්ථික විද්‍යාව හා පරිපාලනය
අධ්‍යාපන විද්‍යාව

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960. 5. 16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂ්‍යය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂ්‍යය 3 :** එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය :** ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් වර්ෂ දෙකක් වන්නේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ මැලේසියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම් :** අයදුම් කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) 1970 1. 1 වැනි දිනට, වයස අවුරුදු 35 ට අඩු විය යුතුයි.

(iii) යටත් පිරිසෙයින්, හැදෑරීමට අදහස් කරන පාඨමාලාවට උචිත වන සේ පිළිගත් විශ්ව විද්‍යාලයයකින් ලබාගත් දෙවැනි පෙළ උපාධියක් තිබිය යුතුය. (ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම් පත් භාර ගනු නොලැබේ.)

(iv) ඉංග්‍රීසි භාෂාවෙහි උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

**සංලක්ෂ්‍යය 1 :** රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970. 1. 1 වැනි දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂ්‍යය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන් :** ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) මැලේසියානු අධිකාරීන් විසින් පිළියෙල කරන පරිදි ඉතාම කෙටි මගින් මැලේසියාවට යාම සහ ආපසු පැමිණීම සඳහා සංචාරක පංතියේ මුහුදු හෝ ගුවන් හෝ ගමන් පහසුකම් (ශිෂ්‍යත්වධාරියා කැටුව යන ඔහුගේ භාර්යාව හැර වෙනත් යපෙන්නන් සඳහා වියදම් ප්‍රදානයට ඇතුළත් නොවේ.)

(ආ) අනුමත කරන ලද ඉගැන්වීමේ ගාස්තු, රසායනාගාර ගාස්තු හා විභාග ගාස්තු.

(ඇ) මාස්පතා කොටස් වශයෙන් ගෙවනු ලබන මැලේසියානු ඩොලර් 6,000ක වාර්ෂික යැපීම් දීමනාවක්.

(ඈ) පොත් හා උපකරණ සඳහා වර්ෂයකට මැලේසියානු ඩොලර් 150 ක දීමනාවක්.

(ඉ) මැලේසියාව ඇතුළත අනුමත කළ ගමන් සඳහා වර්ෂයකට මැලේසියානු ඩොලර් 200 ක දීමනාවක්.

(ඊ) භාර්යාව කැටුව යන විවාහක පිරිමි ශිෂ්‍යත්ධාරීන් සඳහා වර්ෂයකට මැලේසියානු ඩොලර් 1,200 ක අතිරේක විවාහක දීමනාවක්. ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරන අවස්ථාවේ අයදුම් කරු විවාහකව සිටියේ නම් මිස ශිෂ්‍යත්ව කාලයේ ප්‍රථම වර්ෂය තුළදී මේ දීමනා ගෙවනු නොලැබේ. එසේම, භාර්යාව ශිෂ්‍යත්වයක් දරන්නී නම් හෝ, මැලේසියාවේ වැටුප් ලබන රැකියාවක යෙදී සිටින්නී නම් හෝ මේ දීමනා ගෙවනු නොලැබේ.

(උ) ශ්‍රවණ ආධාර, ඇස් කන්නාඩි හා මොනයම් අන්දමක හෝ දන්ත ප්‍රතිකාර හැර අනුමත කළ වෛද්‍ය හා ආරෝග්‍යශාලා වියදම්.

**සංලක්ෂ්‍යය :** මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය :** සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. **ගිවිසුම :** තෝරාගනු ලබන අපේක්ෂකයන් මැලේසියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය :** තෝරාගනු ලබන අපේක්ෂකයන් මැලේසියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන ප්‍රහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතා වන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1969. 6. 2 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින්ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ සිටින නිලධාරීන් සිය අයදුම් පත් තම ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් එවිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 මැයි මස 7 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

5–490—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### හෙදි තනතුරු (කාන්තා)

රාජකීය ලංකා ගුවන් හමුදාවේ, සුදුසුකම් ලත් හෙදි තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙල කර, 1969 මැයි මස 30 දිනට පෙර මට ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප්.**—වර්ෂයකට රු. 1,824 න් පටන්ගෙන, රු. 72 බැගින් වූ වාර්ෂික වේතනාධික සහිතව වර්ෂයකට රු. 2,904 ක් දක්වා වැඩිවේ. (රු. 2,400 වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් තිබේ).

තෝරා ගනු ලබන අයදුම්කාරියන් පහත සඳහන් දෑයට හිමිකම් ලැබෙනු ඇත :—

(i) වර්ෂයකට රු. 60 ක ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාවක්,

(ii) වර්ෂයකට රු. 30 ක පාවහන් සඳහා දීමනාවක්, සහ

(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෙදියන්ට නිකුත් කරන ප්‍රමාණයට නොමිලේ නිල ඇඳුම්.

3. **අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කාරියන්ට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) 30.5.69 දිනට වයස අවුරුදු 25ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 40 ට වැඩි නොවිය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ නියුතු අය කෙරෙහි ඉහළ වයස් සීමාව බල නොපානු ඇත.)

(ii) 1949 අංක 10 දරණ වෛද්‍ය (සංශෝධිත) පනත යටතේ සුදුසුකම් ලත් හෙදියක් වශයෙන් ලංකා වෛද්‍ය මණ්ඩලයේ ලියා පදිංචි වූ අය විය යුතුයි. සහ/හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ හෙදියන්ගේ ප්‍රවීණතා සහතිකය දැරිය යුතුය.

හෙදියන්ගේ ප්‍රවීණතා සහතිකයට අමතර වශයෙන් සූතිකා කර්මය පිළිබඳ සහතික දරණ ඉල්ලුම්කාරියන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(iii) මනා චරිතයකින් සහ හොඳ ශරීර සෞඛ්‍යයෙන්ද යුක්ත විය යුතුයි.

**සටහන :** වෛද්‍ය ආඥාපනතේ (105 වැනි අධිකාරයේ) (VII) වැනි ඡේදය යටතේ වින්නඹු සේවිකාවක් වශයෙන් ලියා පදිංචිවී ඇති හා සුදුසුකම් ලත් හෙදියක් ලෙස අඩු වශයෙන් අවුරුදු දෙකක්වත් සේවය කර ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

4. **බඳවා ගැනීමේ වගන්ති.**—මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. අංක 372 හා 57.4.29 දින දරණ භාණ්ඩාගාරයේ චක්‍රලේඛය අනුව, විශ්‍රාම වැටුප් සහිත තත්ත්වය ප්‍රදානය කිරීම පාලනය වනු ඇත.

5. අයදුම්කාරියන් සිය අයදුම්පත්වලට පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතිස්ම සහතික හෝ අධ්‍යාපන නීති මාලාව යටතේ පාසැල්වල භාවිතය සඳහා නිකුත් කරනු ලබන ලුහුඬු උප්පැන්න සහතිකය හෝ මේ සඳහා භාරගනු නොලැබේ).

(ආ) අයදුම්කාරියගේ චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ගෙන් මෙය අවශ්‍ය නොවේ).

(ඇ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික.

6. ඉල්ලුම් පත් කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, තැ. පෙ. 594, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලක නිලධාරි හා ගණකාධිකාරි, වෙත එවිය යුතුයි. මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට ඉල්ලුම් පත් නොඑවිය යුතුයි.

7. රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ ඉල්ලුම් පත් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ මුල පළකොට ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා කරන පත්වීම්වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සැළකිල්ල යොමු කරවනු ලැබේ.

**සටහන :** ඉල්ලුම්පත්වලට අමුණා එවන කිසිම ලියවිල්ලක් ආපසු එවනු නොලැබේ. ඉහත සඳහන් සියලුම සුදුසුකම් නොමැති අයදුම්කාරියන්ගේ ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඒ. සී. අරසරත්නම්,
සිවිල් පාලක නිලධාරි හා ගණකාධිකාරි,
ගුවන් හමුදා අණදෙන නිලධාරි වෙනුවට.

මූලස්ථානය, රා. ලං. ගු. හ.,
තැ. පෙ. 594, කොළඹ,
1969 මැයි මස 7 වැනි දින.

### ආදර්ශ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා වයස (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.

4. ජාතිය (ලාංකිකයෙකු වන්නේ පෙළපතින්ද නැතහොත් ලියාපදිංචි වීමෙන්ද යන වග සඳහන් කරන්න) :————.

5. විවාහකද අවිවාහකද යන වග :—(විවාහක නම් පහත සඳහන් තොරතුරු සපයන්න) :—

(අ) කන්‍යා නාමය (විවාහයට පෙර නම) :————.

(ආ) ස්වාමිපුරුෂයා ජීවත්ව සිටිද ? :————.

(ඇ) 1. ස්වාමිපුරුෂයා සමග ජීවත් වන්නේද යන වග : ————.

2. නීත්‍යානුකූලව වෙන්වී සිටිද යන වග :————.

3. නීත්‍යානුකූලව නොවේ නම් වෙන්වී සිටින්නේ කෙසේද ? :————.

4. ස්වාමිපුරුෂයාගේ රැකියාව :————.

5. ඔහු රැකියාව කරන ස්ථානය :————.

6. ළමයින් ගණන :—

(අ) වැඩිමහල් ළමයාගේ වයස :————.

(ආ) බාලම ළමයාගේ වයස :————.

6. දැනටමත් සේවයේ යෙදී සිටී නම්—

(අ) දැනට රැකියාව කරන ස්ථානය :————.

(ආ) සේවා කාලය අවුරුදු කීයද ? :————.

7. අධ්‍යාපනය ලැබූ පාසැල් හා විභාග සමත් වූ ස්ථාන :————.

8. හෙදි පුහුණුව ලැබූ ස්ථානය :————.

9. සූතිකා කර්මය පිළිබඳව පුහුණුව ලබා ඇතිද යන වග (සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

10. චරිත සහතික ලබා ගත්තේ යමෙකුගෙන්ද, ඒ අයගේ නම් හා ලිපිනය (මෑතකදී ලබාගත් චරිත සහතික තුනක පිටපත් අමුණන්න) :————.

11. පියාගේ හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.

12. පහත සඳහන් දෑ පිළිබඳ දැනුම :—

| | කියවීම | ලිවීම | කථා කිරීම |
|---|---|---|---|
| සිංහල | ............... | ............... | ............... |
| දෙමළ | ............... | ............... | ............... |
| ඉංග්‍රීසි | ............... | ............... | ............... |

13. මීට පෙර රජය යටතේ සේවය කර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර සපයන්න :————.

14. හෙදියක වශයෙන් ලියා පදිංචිවී ඇති අංකය (සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

මං රජයේ සේවයේ හෝ වෙනත් ආයතනයක සේවයේ අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම නොගන්වන ලද බවද, සේවයෙන් පහ නොකරන ලද බවද, සාපරාධී වරදකට උසාවියකින් වරදකාරියක් නොකරන ලද බවද, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් හෝ තොරතුරු අසත්‍ය බව සොයා ගනු ලැබුවහොත් ඊට ලැබෙන දඬුවම, වහාම මා රාජ්‍ය සේවයෙන් පහ කිරීම බව මම දනිමි.

————,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

5-491—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

16. 'අ' පරිශිෂ්ඨයේ පෙන්වා ඇති ෆෝර්මය සාමාන්‍ය ෆුල්ස්කැප් ප්‍රමාණයේ කොළයක පිටපත් කළ යුතුයි. සෑම කොටුවක්ම පැහැදිලි අකුරින් හෝ ටයිප් ගසා තිබිය යුතුයි. කිසිම කොටුවක් කපා හෝ නොපුරවා නොතිබිය යුතුයි. කාර්යාලීය ප්‍රයෝජනය සඳහා අයදුම් පත උඩ අඟල් දෙකක් හිස්ව තැබිය යුතුයි. අයදුම් පත මුලට සිටින සේ අනිකුත් පිටු එයට අමුනා එවිය යුතුයි.

17. අයදුම් පත් ගුවන් හමුදාධිපති තුමා, තැ. පෙ. 594, කොළඹ කියා ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම් පත් බහාලන කවරයේ වම් කෙලවරේ, "අයදුම් පත—පාලන/උපකරණ අංශය/කාර්මික (ඉංජිනේරු) අංශය—නිලධාරීන්" කියා සඳහන් කර තිබිය යුතුයි. (අනවශ්‍ය අංශයන් කපා හරින්න). අයදුම් පත් 1969 ජූනි මස 10 වෙනි දින 1969.6.10 දින තෙක් භාර ගනු ලැබේ.

18. අයදුම් පත් සමග පහත සඳහන් ලියකියවිලි වල පිටපත් ද ඉදිරිපත් කළ යුතුයි :—

(අ) අයදුම්කරුගේ උප්පැන්න සහතිකය.

(ආ) ලබා ගත් උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඇ) අඩු වශයෙන් අයදුම්කරු පුද්ගලිකව ඇසුරු කරන වගකිය යුතු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබා ගත් චරිත සහතික පත්‍ර.

(ඈ) අයදුම් පතෙහි සඳහන් කර ඇති යම් කරුණක් සනාථ කිරීමට සහතික පත් තිබේ නම් ඒවා.

19. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම් පත් එවිය යුත්තේ තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මාර්ගයෙනි. තෝරා ගනු ලැබුවහොත් අයදුම්කරු නිදහස් කළ හැකි බවට සහතිකයක් ද එහි තිබිය යුතුයි.

20. ඉහත සඳහන් 14 වෙනි සහ 18 වෙනි ඡේදයන්හි සඳහන් සුදුසුකම් නිසා මිස නැත්නම් වෙන මොනයම් හේතුවක් නිසාවත් අයදුම් පත් සලකා බලනු නොලැබේ.

21. කෙළින්ම හෝ වෙන යම් මාර්ගයකින් යම් අනුග්‍රහයක් ලබා ගැනීමට තැත් කිරීම නුසුදුසු කමක් බව අයදුම්කරුවන්ට විශේෂයෙන්ම දන්වා සිටිනු ලැබේ.

22. **තෝරාගැනීම සහ සම්මුඛ පරීක්ෂණ ආදිය.**—යම් අයදුම්කරුවෙකු මෙහි 14 වෙනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍ය සුදුසුකම් ඇති බව පෙනී ගොස් ඔහු සුදුස්සකු ලෙස සලකනු ලැබුවහොත්, තමාගේ වියදමින් නියමිත දිනයක සහ වේලාවක නියමිත ස්ථානයක පවත්වනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් ඉදිරිපිට පෙනී සිටීමට උපදෙස් දෙනවා ඇත.

23. ප්‍රාථමික තේරීම් මණ්ඩලය මගින් සුදුසු යයි සලකනු ලබන අයදුම්කරුවන් අවසාන තේරීම් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර ගුවන් හමුදාවේ වෛද්‍ය මණ්ඩලයක් මගින් පරීක්ෂා කරනු ලැබේ. එසේම ඔවුන් අවසාන තේරීම් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර රාජකීය ලංකා ගුවන් හමුදාවේ, දියතලාවේ පවත්වන නිලධාරි ස්වභාවය මැනීමේ පරීක්ෂණයටද පෙනී සිටිය යුතුයි.

24. අවසාන පත්වීම කරනු ලබන්නේ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගිනි. තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් වෙත ඒ බව එම මණ්ඩලය මගින් දන්වන අතර, ඔවුන්ට අධිකාරියට පත් කරන දිනයද දන්වනු ලැබේ.

ඒ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති තැන.

1969 අප්‍රේල් මස 3 දා,
ගුවන් හමුදා මූලස්ථානය,
රාජකීය ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

## 'අ' පරිශිෂ්ඨය

**රාජකීය ලංකා ගුවන් හමුදාවේ ....................අධිකාරියක් සඳහා ඉල්ලුම් පත**

**(ඉල්ලුම් කරන අංශයේ නම සඳහන් කළ යුතුයි.)**

1. අගට යෙදෙන නම :————. සෙසුනම් :————.

2. දැනට ලිපිනය :————.

(i) දුර කථන අංකය :————.

(ii) නුදුරු දුම්රිය පොළ :————.

(iii) නුදුරු පොලිස් ස්ථානය :————.

(iv) විදුලි පණිවුඩ කාර්යාලය :————.

3. ස්ථිර වාසස්ථානය :————.

එහි වාසය කළ කාලය :————.

4. විවාහක තත්ත්වය :————.

5. ආගම :————.

6. මව්පිය විස්තර : උපන් ස්ථානය : උත්පත්තියෙන් රටවැසි භාවය :—

(අ) පියා :————.

(ආ) මව :————.

7. පාසැල් හා විශ්ව විද්‍යාල චරියාව :—

(අ) පාසැල් ආදියෙහි නම් :————.

(ආ) ඇතුලත් වූ දිනය :————.

(ඇ) අස් වූ දිනය :————.

8. පාසැලෙන් අස් වූ පසු නියුක්ත වූ රක්ෂාවල් (මෙය සම්පූර්ණ වාර්තාවක් විය යුතුයි.)

(අ) ස්වාමියාගේ නම :————.

(ආ) රක්ෂාවේ ස්වභාවය :————.

(ඇ) රක්ෂාවේ කාල සීමාව :————.

9. මීට පෙර යුෂ්මතා සන්නද්ධ සේවයක යම් පුරප්පාඩුවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට තිබේද? උත්තරය 'ඔව්' නම් ඉල්ලුම් කළ තනතුර හා දිනය දක්වන්න :————.

10. සිවිල් උසාවියක් හෝ සේවා විනිශ්චය මණ්ඩලයක් මගින් යුෂ්මතා වරදකරු කර තිබේද? උත්තරය 'ඔව්' නම් විස්තර දක්වන්න :————.

11. අවශ්‍ය සුදුසුකම් (මෙම නිවේදනයේ 14 වෙනි ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන් පරිදි) :

උපන් දිනය :——.

වයස :——.

උපන් ස්ථානය :——.

රටවැසි භාවය :——.

උත්පත්තියේදී——. දැනට :——.

(අ) යෝග්‍යතා :————.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :————.

(එනම් සුදුසුකම් පිළිබඳ 14 වෙනි ඡේදයේ වගන්තිය ප්‍රකාර).

(ඇ) උස : අඩි——, අඟල්——.

(ඈ) පපුව : අඟල් :——.

(ඉ) බර : රාත්තල් :——.

12. අතිරේක සුදුසුකම් :————.

(පහත සඳහන් අයිතිවාසිකම් සනාථ කිරීමට අයදුම්කරුට හැකිවිය යුතුයි.)

13. ක්‍රීඩා දක්ෂතා විස්තර : (කණ්ඩායම් හා තරඟ විස්තර දක්වා දිනයන්ද ලබා ගත් දක්ෂතාවයන්ද දක්වන්න) :————.

14. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ලබා ගත් අනිකුත් දක්ෂකම් :————.

15. සන්නද්ධ සේවයක (නිත්‍ය හෝ ස්වේච්ඡ) හෝ බාල දක්ෂ ආයතනයක කළ සේවා විස්තර :————.

16. යම් කිසි විශේෂ සුදුසුකම් :————.

17. මෙම අයදුම් පත සමග එවා ඇති දේ :————.
(පිටපත් පමණක් එවිය යුතුයි)

18. මෙම අයදුම් පතට අමුනා ඇති වෙනත් දේ :————.

19. චරිත සහතික ලබාගත් අයවළුන්ගේ නම් :————.

————,
(අයදුම්කරුගේ අත්සන)

දිනම :————.

5–494/1—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු—දන්ත වෛද්‍ය නිලධාරි

රාජකීය ලංකා ගුවන් හමුදාවේ දන්ත වෛද්‍ය නිලධාරි එක් පුරප්පාඩුවක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරා ගනු ලැබූ අපේක්ෂකයාට රාජකීය ලංකා ගුවන් හමුදාවේ බලපත්‍රලාභී ප්‍රතිනන් කොමිසන් බලය පවරනු ලැබේ.

3. අවශ්‍යතාවයක් ඇති වුවහොත්, ලංකාවේ හෝ පිටරට පුහුණුව පිණිස යැමට තෝරාගනු ලැබූ අපේක්ෂකයාහට සිදුවේ.

**4. වැටුප් හා දීමනා.—**

(ඒ) පත්වීම ලැබීමේදී තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරුට ඔහුගේ පළපුරුදුකම් අනුව පහත සඳහන් වැටුප් ක්‍රමයෙහි සුදුසු ස්ථානයකට තබනු ඇත:—

(i) II වෙනි ශ්‍රේණිය: වාර්ෂික වැටුප රු. 5,160—රු. 360—වාර්ෂික වැඩිවීම් 9 සහ රු. 480—වාර්ෂික වැඩිවීම් 6—රු. 11,280 දී වැඩිවීම් අවුරුදු දෙකක කාල සීමාවකට නවතිනු ඇත.

(ii) I වැනි ශ්‍රේණිය: වාර්ෂික වැටුප රු. 11,760—රු. 480—වාර්ෂික වැඩිවීම් 3—රු. 13,200.

(බී) I වන හා II වෙනි ශ්‍රේණියන් නොකැඩෙන කාල සීමාවක් වන අතර, II වන ශ්‍රේණියේ වැඩිම වැටුප දැවුරුදු කාල සීමාවකට නවතිනු ඇත.

(**සැ.යු.**—සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරීන්ගේ සහ දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ පරිශෝධිත වැටුප් පරිමාණයන් රා.ලං.ගු.හ. වද අදාළ වේ.)

(සී) පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ:—

(i) ආණ්ඩුවේ නිවාසවල පදිංචි වී නොසිටින කල ආණ්ඩුවේ ගෙවල් කුලී ගෙවීම් ප්‍රමාණය අනුව ගෙවල් කුලී දීමනා, නිලධාරීන් සඳහා වෙන්වූ නේවාසිකාගාරයක පදිංචි වී සිටීම අවශ්‍ය වන්නාවූද එසේ ඉඩකඩ පහසුකම් සලසා දී ඇත්තාවූද නිලධාරීන්ට මෙම දීමනාව ගෙවනු නොලැබේ.

(ii) ආණ්ඩුවේ ගෙවීම් ප්‍රමාණය අනුව ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර, අවිවාහක නිලධාරීන්ට, නිලධාරීන් සඳහා වෙන්වූ නේවාසිකාගාරයක නවාතැන් සළසා දෙනු ඇත. නේවාසිකාගාරය තුළ වාසය කරන කාලය තුළ ඔවුනට මෙම දීමනාව ගෙවනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවේ වියදමින් ඔවුනට නොමිලයේ කෑම බීම සපයනු ඇත.

(iii) රු. 180 මාසික දීමනාවක්.

(iv) 'බැට්මන්' සේවාව සඳහා මසකට රුපියල් 75 ක දීමනාවක්.

5. තෝරා පත් කර ගනු ලැබෙන ඉල්ලුම්කරුට විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට සුදුස්සෙක් වනු ඇත. එවැනි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගණන් බැලීමේ පදනම, ආණ්ඩුවේ ගැසට් පත්‍ර නිවේදන මගින් විටින් විට සංශෝධනය කරනු ලබන, 1934 පෙබරවාරි මස 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ දක්වා ඇති විධිවිධාන අනුව වනු ඇත. උසස්වීම්, මතු බලාපොරොත්තු, වැටුප් සහ සේවා කොන්දේසි පිළිබඳ විස්තර, කොළඹ පාර්සන්ස් පාරේ රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානය වෙතින් ලබාගත හැක.

6. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේ ය.

7. **මූලික අවශ්‍යතා.**—අයදුම්කරුවන්ට මෙහි පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි:—

(අ) **ජාතිය:** අයදුම්කරුවන්—

(i) උත්පත්තියෙන් හෝ

(ii) ලියාපදිංචි කරනු ලැබීමෙන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ආ) **වයස:** අයදුම්කරුවන් 69.6.1 වෙනි දිනට අවුරුදු 33 නොයික්මවා තිබිය යුතුයි.

(ඇ) **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්:** අයදුම්කරුවන් එල්.ඩී.එස්., බී.ඩී.එස්. උපාධිධාරීන් විය යුතුයි;

**හෝ**

(ඇ) පරීක්ෂණ මණ්ඩලයකින් හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක, දන් පිළිබඳ උසස් සුදුසුකමක් තිබීම හා ඊට අමතරව ලංකා වෛද්‍ය මණ්ඩලයේ දන්ත වෛද්‍යවරයෙක් ලෙස ලියාපදිංචි වී සිටීම.

(ඉ) **සෞඛ්‍ය තත්ත්වය:** අපේක්ෂකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ගුවන් හමුදාවට ගැළපෙන පරිදි තිබිය යුතුයි. (අඩු වශයෙන් උස අඩි 5යි, අඟල් 5ත්, පපුව අඟල් 32ත් සහ බර රාත්තල් 105ක් තිබිය යුතුයි).

8. **අයදුම්කරුවන්ට උපදෙස්.**—මෙම නිවේදනයේ 'අ' පරිශිෂ්ඨයේ දක්වෙන පරිදි අයදුම් පත් සකස් කළ යුතුයි. මුද්‍රණය කරන ලද අයදුම් පත් නොමැති බැවින් අයදුම්කරුවන් විසින් තම තමන්ගේ අයදුම් පත් සකස් කර ගත යුතු අතර, නියමිත ආකෘති පත්‍රය අනුව නොමැති අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. අයදුම් පත් "ගුවන් හමුදාධිපතිතුමා, තැ. පෙ. 594, කොළඹ" කියා එවිය යුතුයි. අයදුම් පත් බහාලන කවරයේ "අයදුම් පත, දන්ත වෛද්‍ය නිලධාරි" යනුවෙන් කවරයේ වම් පැත්තේ උඩ කොනේ සඳහන් කර තිබිය යුතුයි. අයදුම් පත් 1969 ජූනි මස 10 වැනි දින තෙක් බාරගනු ලැබේ.

10. අයදුම් පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ද ඉදිරිපත් කළ යුතුයි:—

(අ) අයදුම්කරුගේ උප්පැන්න සහතිකය.

(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) අඩු වශයෙන් අයදුම්කරු පුද්ගලිකව ඇසුරු කරන වගකිය යුතු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික පත්‍ර.

(ඈ) අයදුම් පතෙහි සඳහන් කර ඇති යම් කරුණක් සනාථ කිරීමට සහතික පත් තිබේ නම් ඒවා.

11. තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරුවන් විසින් ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවෙහි යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මීට පසුව පනවනු ලැබිය හැකි නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

12. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම් පත් එවිය යුත්තේ තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මාර්ගයෙනි. තෝරා ගනු ලැබුවහොත් අයදුම්කරු නිදහස් කළ හැකි බවට සහතිකයක් ද එහි තිබිය යුතුයි.

13. **තෝරා ගැනීම්, සම්මුඛ පරීක්ෂණ ආදිය.**—ලැබෙන අයදුම් පත් ගණන අනුව අවශ්‍ය වුවහොත්, පළමුවෙන් ගුවන් හමුදාවේ මණ්ඩලයක් මගින් ඉහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් සුදුසු අය තෝරා ගන්නවා ඇත. අධිකාරිය ලැබීම උදෙසා යෝග්‍යතාවය මැනීමට, ඉන් පසු අයදුම්කරුවන් සමහර පරීක්ෂණයන්ට භාජනය විය යුතුයි. අවසාන තෝරා ගැනීම කරනු ලබන්නේ, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් මෙම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය.

14. කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීමට අයදුම්කරුවන්ට සිදු වෙනවා ඇත. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය ලිපියකින් දන්වනවා ඇත. මේ සඳහා අයදුම්කරුවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් සඳහා මුදල් ගෙවන්නේ නැත. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගනු නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වනවා ඇත.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපතිතුමා.

1969 අප්‍රේල් මස 3 දා,
ගුවන් හමුදා මූලස්ථානය,
තැ. පෙ. 594, කොළඹ.

### "අ" පරිශිෂ්ඨය

**රාජකීය ලංකා ගුවන් හමුදාවේ වෛද්‍ය අංශයේ (දන්ත නිලධාරි) අධිකාරියක් සඳහා ඉල්ලුම් පත්‍රය**

1. අගට යෙදෙන නම:————.
   සෙසු නම්:————.

2. දැනට ලිපිනය:————.
   (i) දුරකථන අංකය:————.
   (ii) තුදුරු දුම්රිය පළ:————.
   (iii) තුදුරු පොලිස් ස්ථානය:————.
   (iv) විදුලි පණිවුඩ කාර්යාලය:————.

3. (අ) ස්ථිර වාසස්ථානය:————.
   (ආ) එහි වාසය කළ කාලය:————.

4. විවාහක තත්ත්වය:————.

5. ආගම:————.

6. මව්පිය විස්තර :————.

නම :——, උපන් ස්ථානය :——, උත්පත්තියෙන් රටවැසි භාවය :——.

(අ) පියා :————.

(ආ) මව් :————.

7. පාසැල් හා විශ්ව විද්‍යාල චරියාව :————.

(අ) පාසැල් ආදියෙහි නම් :————.

(ආ) ඇතුළත් වූ දිනය :————.

(ඇ) අස් වූ දිනය :————.

8. පාසැලෙන් අස් වූ පසු නියුක්ත වූ රක්ෂාවල් (මෙය සම්පූර්ණ වාර්තාවක් විය යුතුයි) :————.

(අ) ස්වාමියාගේ නම :————.

(ආ) රක්ෂාවෙහි ස්වභාවය :————.

(ඇ) රක්ෂාවෙහි යෙදී සිටි කාල සීමාව :————.

9. මීට ප්‍රථම යුෂ්මතා සන්නද්ධ සේවයක යම් පුරප්පාඩුවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට තිබේද ? එසේ නම් ඉල්ලුම් කළ තනතුරු, විස්තර හා දිනයන්ද දක්වන්න : ————.

10. සිවිල් උසාවියකින් හෝ සේනා විනිශ්චය මණ්ඩලයකින් යුෂ්මතා වරදට පත් කර තිබේද ? උත්තරය ‘ ඔව් ’ නම් විස්තර දක්වන්න :————.

11. අවශ්‍ය සුදුසුකම් (මෙම නිවේදනයේ 7 වෙනි ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන් පරිදි)—

උපන් දිනය :————.

වයස :————.

උපන් ස්ථානය :————.

රටවැසි භාවය :————.

උත්පත්තියේ දී :————.

දනට :————.

(අ) යෝග්‍යතා :————.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :————.

(එනම් සුදුසුකම් පිළිබඳ 7 වෙනි ඡේදයේ වගන්තිය ප්‍රකාර).

(ඇ) උස : අඩි——, අඟල්——.

(ඈ) පපුව : අඟල්——.

(ඉ) බර : රාත්තල්——.

12. අතිරේක සුදුසුකම් (පහත සඳහන් අයිතිවාසිකම් සනාථ කිරීමට අයදුම්කරුට හැකි විය යුතුයි) :————.

13. ක්‍රීඩා දක්ෂතා විස්තර (කණ්ඩායම් හා තරඟ විස්තර දක්වා දිනයන් හා ලබාගත් දක්ෂතාවයන්ද සඳහන් කරන්න) : ————.

14. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ලබාගත් අතිකූත් දක්ෂකම් : ————.

15. සන්නද්ධ සේවයක (නිත්‍ය හෝ ස්වේච්ඡා) හෝ බාලදක්ෂ ආයතනයක කළ සේවා විස්තර :————.

16. යම්කිසි විශේෂ සුදුසුකම් :————.

17. මෙම අයදුම්පතට අමුණා ඇති වෙනත් දේ (පිටපත් පමණක් එවිය යුතුයි) :————.

18. චරිත සහතික ලබාගත් අයගේ නම් :————.

19. මෙම අයදුම්පතට අමුණා ඇති වෙනත් දේ :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දාතම :————.

5–494/2—€9.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු—වෛද්‍ය නිලධාරි

රාජකීය ලංකා ගුවන් හමුදාවේ වෛද්‍ය නිලධාරි එක් පුරප්පාඩුවක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරාගනු ලැබූ අපේක්ෂකයනට ප්ලයිට් ලෙප්ටිනන්ට් කෙනෙක් වශයෙන් රාජකීය ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය අධිකාරියක් ලැබෙනවා ඇත.

3. අවශ්‍යතාවයක් ඇතිවුවහොත්, ලංකාවේ හෝ පිටරට පුහුණුව පිණිස යෑමට තෝරා ගනු ලැබූ අපේක්ෂකයනට සිදුවේ.

4. වැටුප් හා දීමනා.—පත්වීම ලැබීමේදී තෝරා පත්කර ගනු ලබන ඉල්ලුම්කරුට ඔහුගේ පළපුරුදුකම් අනුව වැටුප් ක්‍රමයෙහි සුදුසු ස්ථානයකට තබනු ඇත.

(අ) වැටුප් ප්‍රමාණය :

(i) **ප්‍රාථමික ශ්‍රේණිය.**—වර්ෂයකට රු. 5,880 පටන් ගෙන රු. 360 වාර්ෂික වැඩිවීම් එකකින් රු. 6,240 දක්වා නගී.

(ii) **2 වෙනි ශ්‍රේණිය** — වර්ෂයකට රු. 6,960 පටන් ගෙන රු. 360 වාර්ෂික වැඩිවීම් හතරකින් (4) සහ රු. 480 වාර්ෂික වැඩිවීම් හයකින් රු. 11,280 දක්වා නගී.

(iii) **1 වෙනි ශ්‍රේණිය** — වර්ෂයකට රු. 11,760 පටන් ගෙන රු. 480 වාර්ෂික වැඩිවීම් තුනකින් (3) රු. 13,200 දක්වා නගී.

(iv) **විශේෂ ශ්‍රේණිය** — වර්ෂයකට රු. 13,800 පටන් ගෙන රු. 600 වාර්ෂික වැඩිවීම් තුනකින් (3) රු. 15,600 දක්වා නගී.

(ආ) II වෙනි ශ්‍රේණියේ වර්ෂ දෙකක වැඩිම නැවතීමක් සමග ප්‍රාථමික ශ්‍රේණිය, ශ්‍රේණි II සහ ශ්‍රේණි I අඛණ්ඩ පරිමාන යකින් සමන්විතය. විශේෂ ශ්‍රේණිය එක තනතුරකින් පමණක් සමන්විත අතර, එයට ගුවන් හමුදා, යුද හමුදා හෝ නාවික හමුදාවේ ඕනෑම වෛද්‍ය නිලධාරියෙකු පත්කළ හැකි වන්නේ, ඒ වෛද්‍ය නිලධාරියා :—

(i) ජ්‍යෙෂ්ඨත්වයෙන්, දක්ෂ භාවයෙන්, සුදුසුකමින් හෝ පළපුරුද්දෙන් ඔහු එම තනතුරට ඉතාමත්ම යෝග්‍ය වෛද්‍ය නිලධාරියායයි තීරණය කළ යුතු අතර,

(ii) විං කොමාන්ඩර්, සර්ජන් කොමාන්ඩර් හෝ ලේෆ්ටිනන්ට් කර්නල් තනතුරට වඩා පහත් නොවූ තනතුරක් හිමි සහ

(iii) I වෙනි ශ්‍රේණියේ වැඩිම වැටුප් පරිමාණයේ වර්ෂ තුනකට අඩු නොවූ කාලයක් සේවය කර තිබුණහොත් පමණි.

(ඇ) පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ :—

(i) ආණ්ඩුවේ නිවාසවල පදිංචිවී නොසිටින කළ ආණ්ඩුවේ ගෙවල් කුලී ගෙවීම් ප්‍රමාණය අනුව ගෙවල් කුලී දීමනා. නිලධාරීන් සඳහා වෙන්වූ නේවාසිකාගාරයක පදිංචිවී සිටීම අවශ්‍යවන්නාවූද එසේ ඉඩතර පහසුකම් සලසා දී ඇත්තාවූද නිලධාරීන්ට මෙම දීමනාව ගෙවනු නොලැබේ.

(ii) ආණ්ඩුවේ ගෙවීම් ප්‍රමාණය අනුව ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර. අවිවාහක නිලධාරීන්ට නිලධාරීන් සඳහා වෙන්වූ නේවාසිකාගාරයක නවාතැන් සලසා දෙනු ඇත. නේවාසිකාගාරය තුල වාසය කරන කාලය තුල ඔවුනට මෙම දීමනාව නොගෙවනු ලැබේ. එහෙත් ගුවන් හමුදා වියදමින් ඔවුනට නොමිලයේ කෑම බීම සපයනු ලැබේ.

(iii) රුපියල් 180 ක මාසික සේවා දීමනාවක්.

(iv) විවාහවී පිට වාසය කරන අයට රු. 75 ක මාසික, ‘බැට්මන්’’ සේවා සඳහා දීමනාවක්.

(v) **නිල ඇඳුම් :** අධිකාරිය ලැබූ නිලධාරියකු වූ විගස සර්ම කලාපීය ඇඳුම් සඳහා රු. 650 දීමනාවක් ගෙවනු ලැබේ. සේවය සඳහා හෝ පුහුණුව සඳහා විදේශ රටකට මාරුකළවිට ඇඳුම් සඳහා තවත් රු. 1,300 ක දීමනාවක් ගෙවනු ලැබේ. අවුරුදු දෙකක (2) සේවයක් සම්පූර්ණ කළ පසු නිල ඇඳුම් නඩත්තුව සඳහා මසකට රු. 25 ක දීමනාවක් ගෙවනු ලැබේ.

(vi) වෙන්වීමේ දීමනාවන්, යැපීම් දීමනාවන් සහ අතිකූත් දීමනාවන්, 1961 ගුවන් හමුදා වැටුප් සංග්‍රහය අනුව ගෙවනු ලැබේ.

5. තෝරාපත් කර ගනු ලබන ඉල්ලුම්කරු විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට සුදුස්සෙක් වනු ඇත. එවැනි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගණන් බැලීමේ පදනම, ආණ්ඩුවේ ගැසට් නිවේදනය මගින් වරින් වර සංශෝධනය කරනු ලැබූ 1934 පෙබරවාරි මස 5 වෙනි දින දරණ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ දක්වා ඇති විධිවිධාන අනුව වනු ඇත.

6. උසස්වීම්, මතු බලාපොරොත්තු, වැටුප් සහ සේවා කොන්දේසි සහ විස්තර, කොළඹ 2, ශ්‍රී සිත්තම්පලම් ගාඩිනර් මාවතෙහි පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් ලබා ගත හැක.

7. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේ ය.

**මූලික අවශ්‍යතා :**

8. අයදුම්කරුවන්ට මෙහි පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි.

(අ) **ජාතිය :** අයදුම්කරුවන්—

(i) උත්පැත්තියෙන් හෝ

(ii) ලියා පදිංචි කරනු ලැබීමෙන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

ආ) වයස : අයදුම්කරුවන් 1969 ජූනි මස පළමුවෙනි දිනට අවුරුදු 32 නොයික්මවා තිබිය යුතුයි.

(ඇ) **වෘත්තිය :** අයදුම්කරුවන් ලංකාවේ වෛද්‍යවරයෙක් වශයෙන් ලියා පදිංචිවී සිටිය යුතුයි. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විශේෂ පළපුරුදුකම් ඇති අය ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.

(ඈ) **සෞඛ්‍ය තත්වය :** අපේක්ෂකයින්ගේ සෞඛ්‍ය තත්වය ගුවන් හමුදාවට ගැලපෙන පරිදි තිබිය යුතුයි. (අඩු වශයෙන් උස අඩි 5 යි, අඟල් 5 යි, පපුව අඟල් 32 යි, බර රාත්තල් 105යි).

**අයදුම්කරුවන්ට උපදෙස් :**

9. **අයදුම්කරුවන්ට උපදෙස්.**—මෙම නිවේදනයේ ' අ ' පරිශිෂ්ඨයේ දක්වෙන පරිදි අයදුම්පත් සකස් කළ යුතුයි. මුද්‍රණය කරන ලද අයදුම් පත් නොමැති බැවින් අයදුම්කරුවන් විසින් තම තමන්ගේ අයදුම් පත් සකස් කර ගත යුතුයි. නියමිත ආකෘති පත්‍රය අනුව නොමැති අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදු පත් " ගුවන් හමුදාධිපතිතුමා, ගුවන් හමුද මූලස්ථානය, තැ. පෙ. 594, කොළඹ " කියා එවිය යුතුයි. අයදුම් පත් බහාලන කවරයේ " අයදුම් පත—වෛද්‍ය නිලධාරි " යනුවෙන් කවරයේ වම් පැත්තේ උඩ කොනේ සඳහන් කර තිබිය යුතුයි. අයදුම් පත් 1969 ජූනි මස 10 වෙනි දින තෙක් භාර ගනු ලැබේ.

11. අයදුම් පත් සමග පහත සඳහන් ලියකියවිලි වල පිටපත් ද ඉදිරිපත් කළ යුතුයි:—

(අ) අයදුම්කරුගේ උප්පැන්න සහතිකය.

(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) අඩු වශයෙන් අයදුම්කරු පුද්ගලිකව ඇසුරු කරන වගකිය යුතු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික පත්‍ර.

(ඈ) අයදුම්පතෙහි සඳහන් කර ඇති යම් කරුණක් සනාථ කිරීමට සහතික පත් තිබේ නම් ඒවා.

12. රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් එවන අයදුම් පත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලැබුවහොත් එම නිළධාරියා නිදහස් කළ හැකි බවට සහතිකයක් ද එහි තිබිය යුතුයි.

13. තෝරාපත් කරගනු ලබන ඉල්ලුම්කරු විසින්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවෙහි යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මීට පසුව පනවනු ලැබිය හැකි නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

14. ඉහත සඳහන් 8 වෙනි සහ 11 වෙනි නිවේදනයන්හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම් පත් සලකා බලනු නොලැබේ.

15. කෙලින්ම හෝ වෙනයම් මාර්ගයකින් යම් අනුග්‍රහයක් ලබා ගැනීමට තැත් කිරීම නුසුදුසු කමක් බව අයදුම්කරුවන්ට විශේෂ යෙන්ම දන්වා සිටිනු ලැබේ.

**තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :**

16. ලැබෙන අයදුම්පත් ගණන අනුව, අවශ්‍ය වුවහොත් පළමු වෙන් ගුවන් හමුදාවේ මණ්ඩලය මගින් ඉහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් සුදුසු අය තෝරා ගන්නවා ඇත. අධිකාරිය ලැබීම උදෙසා යෝග්‍යතාවය මැනීමට ඉන්පසු අයදුම්කරුවන් සමහර පරීක්ෂණයන්ට භාජනය විය යුතුයි. අවසාන තේරීම කරනු ලබන්නේ, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් මෙම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය.

17. කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීමට අයදුම්කරුවන්ට සිදුවෙනවා ඇත. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය ලිපියකින් දන්වනවා ඇත. මේ සඳහා අයදුම්කරුවන්ට දැරීමට සිදුවෙන ගමන් වියදම් හෝ වෙනත් වියදම් සඳහා මුදල් ගෙවන්නේ නැත. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගනු නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වනවා ඇත.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති තැන.

1969 අප්‍රියෙල් 3 දා,
ගුවන් හමුදා මූලස්ථානය,
රාජකීය ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594, කොළඹ.

## ' අ ' පරිශිෂ්ඨය

**රාජකීය ලංකා ගුවන් හමුදාවේ........................අධිකාරියක් සඳහා ඉල්ලුම් පත**

(ඉල්ලුම් කරන අංශයේ නම සඳහන් කළ යුතුයි)

1. අගට යෙදෙන නම :————. සෙසුනම් :————.

2. දැනට ලිපිනය :————.

(i) දුර කථන අංකය :————.

(ii) නුදුරු දුම්රිය පොළ :————.

(iii) නුදුරු පොලිස් ස්ථානය :————.

(iv) විදුලි පනිවුඩ කාර්යාලය :————.

3. ස්ථිර වාසස්ථානය :————.

එහි වාසය කළ කාලය :————.

4. විවාහක තත්ත්වය :————.

5. ආගම :————.

6. මව්පිය විස්තර ; උපන් ස්ථානය ; උප්පත්තියෙන් රටවැසි භාවය :————.

(අ) පියා :————.

(ආ) මව :————.

7. පාසැල් හා විශ්ව විද්‍යාල චරියාව :—

(අ) පාසැල් ආදියෙහි නම් :————.

(ආ) ඇතුල් වූ දිනය :————.

(ඇ) අස්වූ දිනය :————.

8. පාසැලෙන් අස් වූ පසු නියුක්තවූ රක්ෂාවල් (මෙය සම්පූර්ණ වාර්තාවක් විය යුතුයි.) :——.

(අ) ස්වාමියාගේ නම :————.

(ආ) රක්ෂාවෙහි ස්වභාවය :————.

(ඇ) රක්ෂාවෙහි කාල සීමාව :————.

9. මීට පෙර යුෂ්මතා සන්නද්ධ සේවයක යම් පුරප්පාඩුවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට තිබේද? උත්තරය ' ඔව් ' නම් ඉල්ලුම් කළ තනතුර හා දිනය දක්වන්න :————.

10. සිවිල් උසාවියක් හෝ සේවා විනිශ්චය මණ්ඩලයක් මගින් යුෂ්මතා වරදකරු කර තිබේද? උත්තරය ' ඔව් ' නම් විස්තර දක්වන්න :————.

11. අවශ්‍ය සුදුසුකම් (මෙම නිවේදනයේ 8 වෙනි ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන් පරිදි) :——.

උපන් දිනය :————.

වයස :————.

උපන් ස්ථානය :————.

රටවැසි භාවය :—.

උත්පත්තියේ දී :————.

දැනට :————.

(අ) යෝග්‍යතා :————.

(ආ) අධ්‍යාපන සුදුසුකම් (එනම් සුදුසුකම් පිළිබඳ 8 වෙනි ඡේදයේ වගන්තිය ප්‍රකාර) :————.

(ඇ) උස : අඩි :——. අඟල් :——.

(ඈ) පපුව : අඟල් :————.

(ඉ) බර : රාත්තල් :————.

12. අතිරේක සුදුසුකම් :————.
(පහත සඳහන් අයිතිවාසිකම් සනාථ කිරීමට අයදුම්කරුට හැකි විය යුතුයි.)

13. ක්‍රීඩා දක්ෂතා විස්තර (කණ්ඩායම් හා තරඟ විස්තර දක්වා දිනයන් ද ලබාගත් දක්ෂතාවයන් ද දන්වන්න) :————.

14. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී ලබාගත් අනිකුත් දක්ෂකම් :————.

15. සන්නඩ සේවයක (නිත්‍ය හෝ ස්වේච්ඡා) හෝ බාල දක්ෂ ආයතනයක කළ සේවා විස්තර :————.

16. යම්කිසි විශේෂ සුදුසුකම් :————.

17. මෙම අයදුම් පත සමග එවා ඇති දේ :————.
(පිටපත් පමණක් එවිය යුතුයි.)

18. මෙම අයදුම් පතට අමුනා ඇති වෙන් දේ :————.

19. චරිත සහතික ලබාගත් අයවළුන්ගේ නම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනම :————.

16. ඉහත සඳහන් 13 වැනි ඡේදයේ සඳහන් වන සුදුසුකම් මත මිස, වෙන මොනයම් හේතුවක් නිසාවත් අයදුම් පත් සලකා බලනු නො ලැබේ.

17. අයදුම් පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ද ඉදිරිපත් කළ යුතුයි :—

(අ) අයදුම්කරුගේ උප්පැන්න සහතිකය,

(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපන/වෘත්තිය සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) අවු වශයෙන් අයදුම්කරු පුද්කලිකව ඇසුරු කරන වගකිව යුතු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබා ගත් චරිත සහතික පත්‍ර,

(ඈ) අයදුම් පතෙහි සඳහන් කර ඇති යම් කරුණක් සනාථ කිරීමට සහතික පත් ඇත් නම් ඒවා.

18. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම් පත් එවිය යුත්තේ තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මාර්ගයෙනි. තෝරා ගනු ලැබුවහොත් අයදුම්කරු නිදහස් කළ හැකි බවට සහතිකයක් ද එහි තිබිය යුතුයි.

**තෝරා ගැනීම් සහ සම්මුඛ පරීක්ෂණ ආදිය**

19. යම් අයදුම්කරුවකු සුදුසු ය යි සලකනු ලැබුවහොත් තමාගේ වියදමින් තෝරා ගැනීමේ මණ්ඩලයක් ඉදිරිපිට පෙනී සිටීමට උපදෙස් දෙනවා ඇත.

20. ප්‍රාථමික තේරීම් මණ්ඩලය මගින් සුදුසු ය යි සලකනු ලබන අයදුම්කරුවන් අවසාන තේරීම් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර, ගුවන් හමුදාව මගින් පවත්වන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, ඔවුන් නිලධාරි ස්වභාවය මැනීමේ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුයි.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

1969 අප්‍රේල් මස 3 දා,
ගුවන් හමුදා මූලස්ථානය,
තැ. පෙ. 594,
කොළඹ.

## " අ " පරිශිෂ්ටය

**රාජකීය ලංකා ගුවන් හමුදාවේ ගගන යාත්‍රාංගන ඉදිකිරීමේ අංශයේ (වැඩ සේවාව) අධිකාරියක් සඳහා ඉල්ලුම් පත්‍රය**

1. අගට යොදන නම :————. සෙසු නම් :————.

2. දැනට ලිපිනය :————.

(i) දුරකථන අංකය :————.

(ii) තුදුරු දුම්රිය පළ :————.

(iii) තුදුරු පොලිස් ස්ථානය :————.

(iv) විදුලි පණිවුඩ කාර්යාලය :————.

3. ස්ථිර වාසස්ථානය :————.

එහි වාසය කළ කාලය :————.

4. විවාහක තත්ත්වය :————.

5. ආගම :————.

6. මව්පිය විස්තර :————.

නම :——, උපන් ස්ථානය :——, උප්පත්තියෙන් රටවැසි භාවය :————.

(අ) පියා :————.

(ආ) මව :————.

7. පාසැල් හා විශ්ව විද්‍යාල චරියාව :————.

(අ) පාසැල් ආදියෙහි නම් :——, (ආ) ඇතුලත් වූ දිනය :————, (ඇ) අස්වූ දිනය :——.

8. පාසැලෙන් අස්වූ පසු නියුක්ත වූ රක්ෂාවල් (මෙය සම්පූර්ණ වාර්තාවක් විය යුතුයි) :—

(අ) ස්වාමියාගේ නම :——. (ආ) රක්ෂාවෙහි සවභාවය :——. (ඇ) රක්ෂාවෙහි කාල සීමාව :————.

9. මිට ප්‍රථම යුෂ්මතා සන්නද්ධ සේවයක යම් පුරප්පාඩුවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනීසිට තිබේද ? එසේ නම් ඉල්ලුම් කළ තනතුරු, විස්තර හා දිනයන් ද දක්වන්න :————.

10. සිවිල් උසාවියකින් හෝ සේවා විනිශ්චය මණ්ඩලයකින් යුෂ්මතා වරදට පත්කර තිබේද ? උත්තරය " ඔව් " නම් විස්තර දක්වන්න :————.

11. අවශ්‍ය සුදුසුකම් (මෙම නිවේදනයේ 13 වැනි ඡේදයේ සඳහන් අවශ්‍යතාවන් පරිදි) උපන් දිනය :——. වයස :——. උපන් ස්ථානය :——.

රටවැසි භාවය :————.

උත්පත්තියේ දී :————.

දැනට :————.

(අ) යෝග්‍යතා :——, (ආ) අධ්‍යාපන සුදුසුකම් :——. එනම් සුදුසුකම් පිළිබඳ 13 වැනි ඡේදයෙ වගන්තිය ප්‍රකාර)

12. අතිරේක සුදුසුකම් :————.

(පහත සඳහන් අයිතිවාසිකම් සනාථ කිරීමට අයදුම්කරුට හැකි විය යුතුයි.)

13. ක්‍රීඩා දක්ෂතා විස්තර :————.

(කණ්ඩායම් හා තරඟ විස්තර දක්වා දිනයන් ද හා ලබාගත් දක්ෂතාවන් ද සඳහන් කරන්න.)

14. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී ලබාගත් අනෙකුත් දක්ෂකම් :————.

15. සන්නද්ධ සේවයක (නිත්‍ය හෝ ස්වේච්ඡා හෝ බාලදක්ෂ ආයතනයක) කළ සේවා විස්තර :————.

16. යම්කිසි විශේෂ සුදුසුකම් :————.

17. මෙම අයදුම් පත සමග එවන දේ (පිටපත් පමණක් එවිය යුතුයි) :————.

18. මෙම අයදුම් පතට අමුණා ඇති වෙනත් දේ :————.

19. චරිත සහතික ලබාගත් අයවලුන්ගේ නම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–49/44—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන අමාත්‍යාංශය

**ප්‍රජාමණ්ඩල පරිපාලක තනතුරු (තාවකාලික)**

පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රජාමණ්ඩල පරිපාලක තනතුරු 22ක් (තාවකාලික) සඳහා ඉල්ලුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අග දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කළ ඉල්ලුම්පත් 1969 ජූනි මස 1 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතුය.

**1. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා සේවා කොන්දේසි.—**

(i) මෙම තනතුරු තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගනු ලබන අයදුම්කරුවන්ට රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීමට නියම කරනු ඇත.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු නම්—

(අ) ඔහු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නාවූත් හෝ මතුවට පනවනු ලැබිය හැකි වූ හෝ යම් නීතිරීති වලට හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුයි.

(ආ) ඔහුගේ පත්වීම කලින් නතර කරනු නොලැබුවහොත් පත්වීමේ දිනයේ සිට පිළිවෙළින් අවුරුද්දක්, අවුරුදු දෙකක් සහ අවුරුදු තුනක් ඇතුලත I වැනි II වැනි හා III වැනි ශ්‍රේණිවල සිංහල ප්‍රවීනතා පරීක්ෂණයන්ගෙන් සමත් වන ලෙස ඔහුට නියම කරනු ලැබේ.

නියමිත කාල සීමාවන් තුළදී නියමිත පරීක්ෂණයන්ගෙන් සමත් නොවුවහොත් එය ඔහුගේ වැටුප් වැඩිවීම අත්හිටවීමට හේතුවේ. නියමිත කාලයෙන් පසු තවත් සමසක් ගතවන්නට පෙර පරීක්ෂණයෙන් සමත් නොවුවහොත් වැටුප් වැඩිවීම අත්හිටුවීම වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය කර, පරීක්ෂණය සමත්වනතෙක් හෝ ඔහුගේ සේවය නතර කරනු ලබන තුරු හෝ එම නතර කිරීම ක්‍රියාත්මකව තබනු ඇත. අවුරුදු 3 ඉක්මවා ඔහු

සේවයේ නියුක්ත කොට තබා ගැනීම 3 වැනි ශ්‍රේණියේ පරීක්ෂණයෙන් සමත්වීම මත රඳා පවතිනු ඇත. කෙසේ වෙතත්, මේ ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත්වීමෙන් ඔහුට දිගටම සේවයේ යෙදී අවසර දෙනු ලබන බවත් අවශ්‍යයෙන්ම අදහස් නොකෙරේ.

(ඉහත සඳහන් (ආ) වැනි කොන්දේසිය සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවාගනු ලැබූවන්ට අදාල නොවනු ඇත.)

(ඉ) දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ස්ථිර නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාල සීමාවක් සඳහා වැඩ බැලීමට පත් කරනු ඇත.

2. වැටුප්.—වර්ෂයකට රු. 1,620න් ආරම්භව, රු. 120 වාර්ෂික වැඩිවීම් 18කින් රු. 3,780 දක්වා නැගෙන වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අදාල වන්නේ ය. මෙම වැටුප් ක්‍රමයේ රු. 2,460 වැටුප් තලයට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකුම—

(i) 1969 ජූනි 1 වැනි දිනට තමාගේ වයස අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ තනතුරු දරන්නවුන් කෙරෙහි මෙම වයස් සීමාව බල නොපායි.

(ii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් පහත සඳහන් විෂයයන් ද ඇතුළුව විෂයයන් පහකට සම්මාන සාමාර්ථ ලබා තිබීම :—

(i) සිංහල භාෂාව/දෙමළ භාෂාව,

(ii) අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය, සහ

(iii) ප්‍රජාචාරය.

හෝ

(ආ) පොදු අධ්‍යයන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එක්වර විෂයයන් හයකින් සමත්වී සිටිය යුතු අතර පහත සඳහන් විෂයයන් පහකට සම්මාන සාමාර්ථයන් ලබා තිබීම :—

(i) සිංහල භාෂාව/දෙමළ භාෂාව,

(ii) අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය, සහ

(iii) ප්‍රජාචාරය.

හෝ

(ඇ) ඊට උසස් විභාගයක්.

(iii) සංවිධානය කිරීමේ දක්ෂතාව හා සිංහල හෝ දෙමළ භාෂාවලින් රැස්වීම් මෙහෙයවීමේ හැකියාව තිබිය යුතුය.

(iv) මනා පළපුරුද්දක් සහ ක්‍රීඩා, සංගීතය, කලාව හා නාට්‍ය පිළිබඳ ලැදියාවක් තිබිය යුතුය.

(v) චරිතය පිළිබඳ විශිෂ්ඨ සහතික තිබිය යුතු අතර, මනාව වැඩුණු කයකින් යුක්ත විය යුතුය.

4. නියම කරනු ලබන අවස්ථාවකදී අයදුම්කරුවන් පහත සඳහන් සහතික පත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :—

(i) උප්පැන්න සහතිකය හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

(ii) අධ්‍යාපන සහතික.

(iii) තම චරිතය සහ මෙම තනතුරට පත්වීම සඳහා තමාට ඇති සුදුසුකම් ආදිය පිළිබඳ මෑතදී ලබාගත් සහතික පත්.

5. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අය විසින් එවනු ලබන ඉල්ලුම්පත් ඔවුන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එවැනි ඉල්ලුම්පත් නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබුණහොත් ප්‍රතික්ෂෙප නොකිරීමට නම් ඒවා ඒ ඒ දෙපාර්තමේන්තුවලට කලට වේලාවට ලැබී තිබිය යුතු අතර, මෙහි ඉදිරිපත් කිරීමට ඇතිවූ ප්‍රමාදය ගැන පිළිගත යුතු හේතුත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සඳහන් කර තිබිය යුතුය.

6. ඉල්ලුම්පත් හා ඒ පිළිබඳ වෙනත් ලිපි, පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1, යන ලිපිනයට පමණක් එවිය යුතුය. ඒවා පෞද්ගලික නාමට නොඑවිය යුතුය.

7. ගැසට් පත්‍රයේ I වැනි කාණ්ඩයේ II වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට ද ඉල්ලුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

ඩබ්ලිව්. පත්මනාදන්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(ආයතන හා ගිණුම්).

1969 මැයි මස 6 වැනි දින,
කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ පිහිටි
පළාත් පාලන අමාත්‍යාංශයේදී ය.

## ඉල්ලුම් පත්‍රය

**පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රජාමණ්ඩල පරිපාලක තනතුරු (තාවකාලික)**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   අගට යෙදෙන නම :————.
   වෙනත් නම් :————.

2. ලිපිනය :————.

3. පුරවැසි බව හා එය ලබාගත් අන්දම (පරම්පරාවෙන් ලාංකිකද, නැතහොත් ලියාපදිංචි කරනු ලැබීමෙන් ලාංකිකද යන බව සඳහන් කරන්න.) :————.

4. (i) උපන් දිනය සහ 1969 ජූනි 1 දිනට වයස :————.
   (ii) විවාහකද, අවිවාහකද යන බව :————.

5. උපන් ස්ථානය :—
   (i) ඉල්ලුම්කරු :————.
   (ii) ඉල්ලුම්කරුගේ පියා :————.
   (iii) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. ලබන ලද උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :————.

7. පාසැලෙන් අස්වූ දින සිට කරන ලද රැකියාවන් සහ එම සේවා කාල පිළිබඳ විස්තර :————.

8. ක්‍රීඩා, සංගීතය, කලාව හා නාට්‍ය සම්බන්ධයෙන් ලබා ඇති දැනුම හා පළපුරුද්ද :————.

9. සිංහල හෝ දෙමළ භාෂාවෙන් රැස්වීම් පැවැත්වීමේ හැකියාව පිළිබඳ විස්තර :————.

10. වෙනත් විශේෂ සුදුසුකම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

11. චරිත සහතික ලබාගත් අයගේ නම්, තනතුරු හා ලිපිනයන් : ————.

මෙම අයදුම්පතෙහි ම විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් සහතික කරමි. මෙහි කිසියම් කරුණක් හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයාගතහොත් මා නුසුදුස්සෙකු බවට පවත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරනය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5-380—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

අංකය : සාප/30/219.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

**සහකාර සිනමා යන්ත්‍ර ඔපරේටර් තනතුරු**

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ සහකාර සිනමා යන්ත්‍ර ඔපරේටර් තනතුරු සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂක සින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 මැයි මස 30 දින හෝ ඊට ප්‍රථම කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) සහිර ලේකම්ට ලැබෙන සේ එවිය යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—

(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු නම් ආධුනික කාල සීමාව අවුරුදු 3 ක් වන්නේ ය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුවහොත් පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ හෝ ආධුනික තත්ත්වයේ පවතිනු ඇත.

(iv) පත් කරනු ලබන්නා තමාට නියම කරනු ලබන දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය, වාර්ෂිකව රු. 660—12 × 30—1 × 18—රු. 1,038 යි. රජයේ නීති රීති අනුව ගෙවිල් කුලී දීමනා, ජීවනාධාර දීමනා හා විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) සෑම අයදුම්කරුවෙක්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍ය කාර්යාලයේ හෝ අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් දෙපාර්තමේන්තු යටතේ හෝ සේවය කරන්නකු විය යුතුයි.

**සටහන :** හය මසකට නොඅඩු සතුටුදායක සේවයක් ඇති අනියම් සේවකයින්ගේ ඉල්ලුම් පත් ද සලකා බලනු ලැබේ.

(ආ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 25 ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.)

(ඇ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සතිපයෙන් යුක්තව සිටිය යුතුය.

(ඈ) (i) යටත් පිරිසෙයින් සිංහල/දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වී සිටිය යුතුය.

(ii) ජී. බී. සහ ඕරයි හෝ බෙල් සහ හවල් වර්ගයේ මිලි මීටර් 16 හෝ 35 කථානාද චිත්‍රපට යන්ත්‍ර ක්‍රියා කරවීමෙහි අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

නැතහොත්

(i) යටත් පිරිසෙයින් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි 6 වැනි ප්‍රමාණයෙන් සාමාර්ථයක් ලබා තිබීම, සහ

(ii) ජී. බී. සහ ඕරයි හෝ බෙල් සහ හවල් වර්ගයේ මිලි මීටර් 16 හෝ 35 කථානාද චිත්‍රපට යන්ත්‍ර ක්‍රියා කරවීමෙහි අවුරුදු දෙකක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක්ම සූදානම් විය යුතුය :—

(අ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ආ) ලබා ඇති වෘත්තිය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චිත්‍රපට යන්ත්‍ර ක්‍රියා කරවීමේ ප්‍රායෝගික පළපුරුද්ද සම්බන්ධයෙන් සහතික.

(ඈ) සිංහලෙන් හා/හෝ දෙමළෙන් සමත් වූ ඉහළම විභාගය දක්වෙන සහතිකය.

**සටහන :—**

(i) ලියකියවිලිවත්, ලියවිලිවල පිටපත්වත් අයදුම් පතට අමුණා නොඑවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නො ලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත් තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ නමට ද එවිය යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේ දී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ඇතුළත ඉල්ලුම්පත ලැබුණු බවට ලිපියක් නොලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 මැයි මස 9 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දීය.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

(මෙම ඉල්ලුම් පත්‍රය අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතුය)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. ගම් ප්‍රදේශය :————.

4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :————. උපන් දිනය :————.

5. උපන් ස්ථානය :—
 (අ) ඉල්ලුම්කරු :————.
 (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
 (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
 (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.

7. අධ්‍යාපන සුදුසුකම් :—
 (i) සාමාන්‍ය :————.
 (ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර : ————.
 (iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී ඇති උසස් ම විභාගයේ විස්තර:————.

8. නිවේදනයේ 4 වැනි ඡේදයේ (ඈ) (ii) වැනි ඡේදය යටතේ සේවා විස්තර (සේවය කළ ආයතන, සේවා කාලයන්, දරූ තනතුරු සඳහන් කළ යුතුයි) :————.

9. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද :————.

10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම්, (අ) දිනය (ආ) නඩු නොම්මරය (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න: ————.

11. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ?

12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

13. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුණු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :—
 (i) දරන ලද තනතුර :————.
 (ii) නියුක්තව සිටි වකවානුව :————.
 (iii) අස්වීමට හේතුව :————.

15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :—
 (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
 (ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
 (ඇ) සේවය නතර කිරීමට හේතු :————.

16. දැනට යෙදී සිටින රක්ෂාව :—
 (i) ආයතනය :————.
 (ii) තනතුර හා ශ්‍රේණිය :————.
 (iii) ඊට පත්වූ දිනය :————.
 (iv) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද ? : ————.

(v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :

————.

(vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

17. වෙනත් කරුණු :————.

මේ අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මගේ අංකය :
ඔබේ අංකය : සාප/30/219.

අධ්‍යා.සං/ලේ,

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය.*

ඉල්ලුම් පත්‍රයේ සඳහන් ............ අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව් * මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

————,

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
පදවි නාමය :————.

දිනය :————.

(* අදාල නැති කොටස් කපා හරින්න.)

5–488—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි තනතුරු

ඉහත සඳහන් තනතුරුවලට ඉල්ලුම්පත් කැඳවමින් අංක 14,841 හා 69. 2. 14 වැනි දින දරණ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළකර ඇති නිවේදනය කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ.

2. එම ගැසට් නිවේදනයේ 4 වැනි ඡේදයේ දැක්වෙන වයස් සීමාව, අධ්‍යාපන සහ ඉගැන්වීමේ පළපුරුද්ද ආදී සුදුසුකම් 1969. 2. 27 වැනි දිනට සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම කාර්‍යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළයුතු ඉල්ලුම් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත 1969 මැයි මස 30 වැනි දින හෝ ඊට මත්තෙන් ලැබෙන්නට එවිය යුතුයි.

3. මෙම තනතුරු සඳහා මුද්‍රිත ආකෘති පත්‍ර 1969 5. 25 දින දක්වා නිකුත් කරනු ලැබේ. ඒ සඳහා කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් (සාමාන්‍ය පරිපාලන) ශාඛාව වෙත ලිපිනය සහිත මුද්දර නොගැසූ දිග ලියුම් කවරයක් සමග ඉල්ලුම් කළ යුතුය.

4. සම්පූර්ණ විස්තර සඳහා අංක 14,841 හා 69. 2. 14 වැනි දින දරණ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළ කරන ලද දැන්වීම බලනු මැනවි.

5. මෙම තනතුරු සඳහා දැනටමත් ඉල්ලුම් පත් එවා ඇති අයදුම්කරුවන් නැවතත් ඉල්ලුම් කිරීමට උවමනා නැත.

ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

අංක : සාප 25/15,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය,
මැලේ වීදිය,
කොළඹ 2,

5–370—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## කම්කරු දෙපාර්තමේන්තුව

### කම්කරු නිලධාරි තනතුරු

කම්කරු දෙපාර්තමේන්තුවේ III වන පන්තියේ කම්කරු නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 මැයි මස 30 වැනි දිනට හෝ ඊට මත්තෙන් හෝ මට ලැබෙන සේ එවිය යුතුය. සියළුම ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ.

2. **බඳවා ගැනීමේ සේවා කොන්දේසි.**—(i) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අර මුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) රජයේ සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත්, අදාල දෙපාර්තමේන්තුව ඔහු නිසා ඇතිවන ඇබෑර්තුව වැඩ බැලීමේ ක්‍රමයක් අනුව මිස අන් ක්‍රමයකින් අවුරුදු තුනකට නොඅඩු කාලයක් සඳහා පුරවා නොතැබීමට සූදානම් වේ නම් වැඩ බැලීමේ තත්ත්වයකට පත් කළ හැක. පත්කිරීම සඳහා තමා තෝරාගනු ලබන්නේ නම්, දෙපාර්තමේන්තු ප්‍රධානයා තමා මුදාහැරීමට හෝ තනතුර වැඩ බැලීමේ කාලය තුළ හිස්ව තැබීමට හෝ සූදානම් නැත්නම් තමා දරන පදවියෙන් ඉල්ලා අස්වීමට සූදානම් වන බවට නිලධාරියා තම ඉල්ලුම් පතේ ප්‍රකාශයක් කර තිබේ නම්, ඉල්ලුම් පත්‍රය ගැන සලකා බලනු ඇත.

3. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය මෙසේය :—

(1) (iii) පන්තිය : වර්ෂයකට රුපියල් 2,940—120×8—රු. 3,900 රු. 3,420 ට පෙර කාර්යක්ෂමතා කඩඉම).

(ii) පන්තිය : වර්ෂයකට රු. 4,080—180×7—රු. 5,340. (රු. 4,800 ට පෙර කාර්යක්ෂමතා කඩඉම)

(i) පන්තිය : වර්ෂයකට රු. 5,580—240×5—රු. 6,780.

(2) I වන II වන හා III වන පන්ති අඛණ්ඩ කාල ක්‍රමයකට යටත් වේ.

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1969 මැයි මස 30 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු බවත්, අවුරුදු 30 වැඩි නොවන බවත් (රජයේ සේවයේ නියුක්ත වූවන් සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 40 වේ.)

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු බව හෝ තමන්ගේ වෘත්තියෙහි නිරතවීමට හිමිකම් ලබාදෙන වෘත්තීය සුදුසුකම් ලබා ඇති බව.

**සටහන :** (i) යටත් පිරිසෙයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී ඇත්තාවූත් රජයේ සේවයෙහි අවුරුදු 10 ට සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තාවූත්, රජයේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගෙන්ද ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ. එහෙත් එසේ කරනු ලබන්නේ ඔවුන් අසාමාන්‍ය කුසලතා ඇත්තාවුන් බවට පහත දක්වා ඇති අන්දමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් පුද්ගලිකවම සහතික කරනු ලබන්නේ නම් පමණි :—

" මෙම දෙපාර්තමේන්තුවේ........................ශ්‍රේණියේ අවුරුදු ................සම්පූර්ණ කර ඇති ........................මහතා අසාමාන්‍ය කුසලතාවක් හිමි, කම්කරු නිලධාරියෙකුගේ කාර්යයන් ඉටු කිරීමෙහිලා දක්ෂතාවයක් ඇති නිලධාරියෙක් බව සහතික කරමි.

————,

දෙපාර්තමේන්තු ප්‍රධානියා. "

දිනය :————.

(ii) යටත් පිරිසෙයින් කලා හෝ විද්‍යා හෝ වාණිජ පිළිබඳ මාධ්‍ය විභාගයෙන්වත් සාමාර්ථය ලබා තිබේ නම්, යුද්ධ සේවා අනුග්‍රහ යටතේ සුදුසුකම් ලැබූ සේවාමුක්ත භටයන්ට සහ අනිකුත් අයටද මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ හැක.

5. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉල්ලුම් පත් බාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර හෝ මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

6. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම එවිය යුත්තේ කොළඹ 3, බාලදක්ෂ මාවතේ කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් යන ලිපිනයට මිස මාගේ හෝ මෙම දෙපාර්තමේන්තුවේ වෙනයම් නිලධාරියෙකුගේ හෝ පෞද්ගලික ලිපිනයට නොවේ.

7. දිවයිනේ ඕනෑම පළාතක සේවය කරන මෙන් ද, අවශ්‍ය වන පරිදි ගමන් බිමන් සිදු කරන මෙන් ද තෝරාගත් අපේක්ෂකයන්ට නියම කරනු ලබන අතර රාජකාරි කටයුතු සඳහා අනුමත කරන ලද වාහනයක් පාවිච්චි කළ හැකි හොඳ තත්ත්වයෙන් නඩත්තු කිරීමට ඔවුන්ට නියම කරනු ඇත. ගමන් වියදම් මුදල් රෙගුලාසිවලට අනුව ගෙවනු ලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කරවනු ලැබේ.

වී. ආර්. ආර්. විජේවික්‍රම,
කම්කරු කොමසාරිස්.

1969 මැයි මස 6 වන දින,
කොළඹ, කම්කරු දෙපාර්තමේන්තුවේදීය.

## කම්කරු නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.

   ලිපිනය :————.

2. (අ) උපන් දිනය :————.

   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

   (ආ) 1969 මැයි මස 30 වැනි දින වන විට වයස :
   අවුරුදු :——, මාස :——, දින :——.

   (ඇ) ජාතිය :————.

3. උපන් ස්ථානය :—

   (අ) ඉල්ලුම්කරුගේ :————.

   (ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.

   (ඇ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

   (ඈ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වය් මී මුත්තාගේ :————.

ඉල්ලුම්කරු ලංකාවේ උපත ලබා සිටීනම් (අ) වගන්තිය ඇතුළු (ආ) වගන්තිය හෝ (ඇ) සහ (ඈ) යන වගන්ති දෙකම පිරවිය යුතුය. ඉල්ලුම්කරු ලංකාවේ උපත ලබා නැති නම් (අ) වගන්තිය ඇතුළු (ආ) වගන්තිය සහ (ඇ) වගන්තිය හෝ (ඇ) සහ (ඈ) වගන්ති දෙකම පිරවිය යුතුය.

4. විවාහක අවිවාහක බව :————.

5. අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් (සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.

6. (අ) උපස්ථම්භක ගිනි, ගගන ප්‍රහාර නිවාරන හෝ මහජනාරක්ෂක හමුදාවල අඛණ්ඩ සේවා කාලය :.........වන දින සිට ............... දක්වා.

   (ආ) සටන් භට හමුදාවේ සේවා කාලය........... වන දින සිට .....................දක්වා.

(සැ. යු.—සේවයෙන් අස්වීමට හේතුව දක්වමින්, (අ) සහ (ආ) සඳහන් කරුණු ඔප්පු කිරීම සඳහා සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුයි)

7. රජයේ සේවයෙහි යෙදී සිටින්නේ නම් ඉල්ලුම්කරු 1969 මැයි මස 30 වන දිනට අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද ? :————.
   (දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අමුනන්න.

8. ඉල්ලුම්කරුට පහත දක්වෙන භාෂාවන් ව්‍යක්ත ලෙස කථා කළ හැකිද :—

   (අ) සිංහල :————.

   (ආ) දෙමළ :————.

9. ඉල්ලුම්කරුට පහත දැක්වෙන භාෂාවන් කියවීමට හා ලිවීමට පිළිවන් ද :—

   (අ) සිංහල :————.

   (ආ) දෙමල :————.

10. පාසැලින් හෝ විද්‍යාලයෙන් අස් වූ පසු කළ රැකියාවන්: ————.

11. කම්කරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඉල්ලුම්කරු කවර පළපුරුදුකම් ලබා තිබෙන්නේද ? :————.

12. ඉල්ලුම්කරුට කම්කරු නීතීන් සම්බන්ධ කිසියම් දැනීමක් තිබේද :—

   (අ) ප්‍රාදේශික :————.

   (ආ) සාමාන්‍ය :————.

13. ඉල්ලුම්කරුට ලංකාවේ වතුවල හෝ කාර්මික ආයතනවල හෝ නියුක්ත කම්කරුවන්ගේ තත්වයන් ගැන දැනීමක් තිබෙන්නෙගිද ? එසේ නම් ඉල්ලුම්කරු එම දැනීම ලබා ගත්තේ කෙසේදැයි සඳහන් කරන්න :————.

14. ඉල්ලුම්කරුට සංචාරය පිළිබඳ පළපුරුද්දක් තිබේද :—

   (ආ) දිවයින තුළ :————.

   (ආ) එතෙර :————.

15. ඉල්ලුම්කරුගේ ඉල්ලුම් පත්‍රයට පිටුවහලක් වශයෙන් දැක්වීමට අදහස් කරන වෙනත් හිමිකම් ඇතොත් ඒවා:————.

16. ඉල්ලුම්කරුගේ හැකියාව හා චරිතය පිළිබඳ විමසනු ලැබිය හැකි විශිෂ්ඨ පුද්ගලයන් දෙදෙනකුගේ නම් සහ ලිපිනයන් :—

   1. ————.

   2. ————.

17. සහතික පත් ලබා ගත්තේ කවුරුන්ගෙන් ද ? (ළඟදී ලබාගත් සහතික පත් තුනකට නොවැඩි ගණනක පිටපත් අමුණන්න. ඒ වාහි මුල් පිටපත් එවිය යුතු නොවේ) :—

   1 :————.

   2 :————.

   3 :————.

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සඳහන් කර ඇති කරුණු සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම්කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි සහගතයයි මා තෝරා ගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා නුසුදුස්සකු කරනු ලැබීමටත් එසේම පත්වූවාට පසු දැනගතහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමටත් හැකි බවද මම හොඳින් දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය:————.

5–448—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## වන සංරක්‍ෂණ දෙපාතීමේන්තුවේ වැඩපල ෆෝර්මන් තනතුර

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා අධ්‍යාපන අංශයේ වැඩපල ෆෝර්මන් තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දක්වෙන ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කළයුතු ඉල්ලුම්පත් කොළඹ 2, තැ. පෙ. 509, වන සංරක්ෂක වෙත 1969 ජූනි මස 1 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

2. වැටුප් ක්‍රමය :—

වර්ෂයකට රු. 2,820—120/180—රු. 5,340.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) 1969 ජූනි මස 1 දිනට වයස අවුරුදු 20 ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතුයි. (මෙම වයස් සීමාව අන් අයුරකින් ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇති දෙපාර්තමේන්තු සේවකයින් සඳහා බල නොපවත්වයි.)

(ආ) (i) ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඒ හා සමාන සහතිකයක්. (යාන්ත්‍රික විද්‍යාව හෝ ව්‍යවහාරික ගණිතය හෝ විෂයයක් වශයෙන් ඇති අයට විශේෂ සැළකිල්ලක් දක්වේ.)

සහ

(ii) කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ප්‍රායෝගික කාර්මික ආයතනය කණිෂ්ඨ කාර්මික නිලධාරී (යාන්ත්‍රික හා විදුලි) සහතිකය හෝ අම්පාර හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ ඩිප්ලෝමා (යාන්ත්‍රික හෝ විදුලි) සහතිකය හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික ආයතනයක තුන් අවුරුදු සන්ධ්‍යාකාල යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා ලබාගත් සහතිකය.

සහ

(iii) පිළිගත් කාර්මික ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක 5 අවුරුදු ආධුනිකත්වයක්.

සහ

(iv) ආධුනිකත්වයෙන් පසුව පිළිගත් ආතනයක 5 අවුරුද්දකට නොඅඩු ප්‍රායෝගික පළපුරුද්දක්.

4. සේවයට බඳවාගැනීමේ කොන්දේසි :—

තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

5. අයදුම්කරුවන් විසින් පහත දක්වන ලිපි ලේඛනවල පිටපත් (මුල් ලිපි නොවේ) සිය ඉල්ලුම්පත්වලට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (හෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල රෙගුලාසි මාලාව වෙනුවෙන් නිකුත් කළ සහතික පත් භාරගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපනික සහතික පත්‍රය.

(ඇ) අයදුම්කරුගේ චරිතය හා තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාවය පිළිබඳ ළඟදී ලබාගත් සහතික පත් තුනක් (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් එවැනි සහතිකපත් අනවශ්‍යය.)

6. මේ ගැසට් පත්‍රයේ පළමුවන භාගයේ දෙවන ඡේදයේ ආරම්භයේ දක්වා ඇති, රජයේ සේවයේ පත්වීම්වලට බලපාන සාමාන්‍ය කොන්දේසි බලන්න.

7. නියමිත දිනයෙන් පසුව මේ කාර්යාලයයට ලැබෙන ඉල්ලුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

8. ඉල්ලුම්පත් හෝ තනතුර පිළිබඳ අනිකුත් ලිපි ඇත්නම්, ඒවා වැඩ බලන වන සංරක්ෂකට මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට පෞද්ගලිකව එවිය යුතු නොවේ.

ඩබ්. ආර්. එච්. පෙරේරා,
වැඩ බලන වන සංරක්ෂක.

1969 මැයි 7 දින,
කොළඹ 2, තැ. පෙ. 609,
වන සංරක්ෂකගේ කාර්යාලයේ දී ය.

### ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. ලාංකිකයෙකු වනුයේ පරම්පරාවෙන් ද, ලියා පදිංචි කිරීමෙන් ද යන වග :————

4. (අ) උපන් දිනය :————.

(ආ) 1969 ජූනි මස 1 වන දිනට වයස : අවුරුදු :——, මාස :——.

5. දැනට තනතුරක් දරන්නේ නම්, ඒ කුමක් ද ? :————.

6. උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.

7. කලින් රැකියාවන්හි යෙදී සිටියේ නම් විස්තර :————.

8. විශේෂ සුදුසුකම් ඇත්නම් ඒවා දක්වන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–426—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒ බී. 35/එක්ස්. 2088/69.

## අමාත්‍යාංශවල වැඩ සටහන් සම්පාදන අංශයන්හි තනතුරු පුරප්පාඩු

වැඩ සටහන් සම්පාදන නිලධාරි තනතුරු සඳහා රාජ්‍ය සේවයේ ද රාජ්‍ය සංයුක්ත මණ්ඩලවල ද නියුක්ත නිලධාරීන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. පහත සඳහන් අමාත්‍යාංශයන්හි වැඩ සටහන් සම්පාදන අංශ පිහිටවිය යුතුයයි ආණ්ඩුව තීරණය කොට ඇත.

(1) කෘෂිකර්ම අමාත්‍යාංශය.
(2) ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය.
(3) කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය.
(4) රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය.
(5) ජනසතු සේවා අමාත්‍යාංශය.
(6) පළාත් පාලන අමාත්‍යාංශය.
(7) අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

**සටහන :**

යථෝක්ත අංශයන් කෙලින්ම ඒ ඒ ස්ථිර ලේකම්වරුන් යටතේ ක්‍රියා කෙරේ. එම අමාත්‍යාංශයන් තුළ අංශයීය සැළසුම් සම්පාදනයත් සැළසුම් ක්‍රියාත්මක කිරීමත් එම අංශයන් විසින් ඉටු කෙරෙන කාර්‍යයන් වේ. අංශය භාර ප්‍රධානයා වැඩ සටහන් සම්පාදන අධ්‍යක්ෂ වන අතර අනිකුත් නිලධාරීන් විසින් විවිධ වගකීම් මට්ටම්හි දී ඔහුට සහාය වනු ලැබේ.

3. යථෝක්ත තනතුරුවලට තෝරා ගනු ලබන නිලධාරීන් අවුරුදු 3 ක කාල සීමාවක් සඳහා සිය ස්ථිර තනතුරුවලින් මුදා හරිනු ලැබේ. මෙම තනතුරුවලට ස්ථිර වශයෙන් පත්වීම් දීමට දැනට අදහස් නොකෙරේ. තෝරා පත් කරනු ලබන නිලධාරීන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද ද ස්ථිර තනතුරේ ඔවුන් ලබන වැටුප ද පදනම් කොට ගෙන, මසකට රු. 250 දක්වා වූ දීමනාවක් ගෙවනු ඇත.

4. ඒ ඒ අමාත්‍යාංශවල උපදෙස් ද ඇතිව විවිධ අමාත්‍යාංශයන් වෙත නිලධාරීන් පත්කොට යැවෙනුයේ ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසිනි.

5. යථෝක්ත තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට රාජ්‍ය සේවයේ ද රාජ්‍ය සංයුක්ත මණ්ඩලවල ද නියුක්ත නිලධාරීහු සුදුස්සෝ වෙති. ශිල්පීයමය සහ පරිපාලනමය යන දෙයාකාරයේම සේවාවන්හි නියුක්ත නිලධාරීන් වැඩ සටහන් සම්පාදන අංශයට අවශ්‍ය වේ. යම්කිසි අමාත්‍යාංශයක වැඩ සටහන් සම්පාදන අංශය සඳහා උචිත වන කෞශල්‍ය සංයුතිය අල්ලා, ඉංජිනේරුවන් ද පාලකයින් ද ආර්ථික විද්‍යාඥයන් ද විද්‍යා කටයුතුවල නියුක්තයන් ද අතරින් යථෝක්ත නිලධාරීන් තෝරා ගනු ලැබේ.

**(I) වැඩසටහන් සම්පාදක අධ්‍යක්ෂක**

රාජ්‍ය සේවයේ හා/හෝ රාජ්‍ය සංයුක්ත මණ්ඩලවල මාණ්ඩලික ශ්‍රේණියක අඩුම වශයෙන් අවුරුදු 12 ක පළපුරුද්ද ඇති නිලධාරීහු මෙම තනතුර සඳහා ඉල්ලීමට සුදුස්සෝ වෙති.

**(II) වැඩ සටහන් සම්පාදන නියෝජ්‍ය අධ්‍යක්ෂක**

රාජ්‍ය සේවයේ හා/හෝ රාජ්‍ය සංයුක්ත මණ්ඩලවල මාණ්ඩලික ශ්‍රේණියක අඩුම වශයෙන් අවුරුදු 8 ක පළපුරුද්දක් ද ඇති නිලධාරීහු මෙම තනතුරු සඳහා ඉල්ලීමට සුදුස්සෝ වෙති.

**(III) වැඩ සටහන් සම්පාදන සහකාර අධ්‍යක්ෂක**

රාජ්‍ය සේවයේ හා/හෝ රාජ්‍ය සංයුක්ත මණ්ඩලවල මාණ්ඩලික ශ්‍රේණියක අඩුම වශයෙන් අවුරුදු 4 ක පළපුරුද්ද ඇති නිලධාරීහු මෙම තනතුර සඳහා ඉල්ලීමට සුදුස්සෝ වෙති.

**සටහන.**—වෙනත් අන්දමින් විශේෂිත අන්දමේ මනා සුදුසුකම් ලබා ඇත්තාවූත් අතිශයින්ම ප්‍රසංශනීය අන්දමේ සේවා වාර්තාවක් ඇත්තාවූත් අයදුම්කරුවන් වෙතොත් ඔවුන් වෙනුවෙන් පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතාවය අල්ප වශයෙන් සංශෝධනය කිරීම ගැන තේරීම් මණ්ඩලය විසින් සලකා බලනු ලැබේ.

6. මෙහි පහත දැක්වෙන ආදශී ආකෘති පත්‍රය අනුකරණයෙන් අඩි කඩදාසිවල පිළියෙල කළයුතු අයදුම්පත් 1969 මැයි මස 30 වැනි දින හෝ ඊට පෙර කොළඹ 1, තැපැල් පෙට්ටිය අංක 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

7. අයදුම් පත් ස්වකීය දෙපාතීමේන්තු හෝ සංයුක්ත මණ්ඩලයන්හි ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. එක් තනතුරකට වැඩියෙන් අයදුම් කරන අය ඒ ඒ තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුයි.

සී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1969 මැයි මස 9 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

### ආදර්ශ අයදුම්පත

අංක : ඒ බී. 35/එක්ස්. 2088/69.

### අමාත්‍යාංශවල වැඩ සටහන් සම්පාදන අංශයන්හි තනතුරු

1. අයදුම්කරන තනතුර :————.
2. සම්පූර්ණ නම :————.
3. ජතිය :————.
4. ලිපිනය :————.
5. උපන් දිනය :————.
6. අධ්‍යාපන හා තනතුර සඳහා වූ අනෙකුත් සුදුසුකම් :————.
7. මාණ්ඩලික ශ්‍රේණියේ පළපුරුද්ද :————.
8. වෙනත් විශේෂ කරුණු :————.

මවිසින් ඉහත දක්වන්නට යෙදුණු තොරතුරු සැබෑ බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන,

දිනය :————.

5–477—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### පෞද්ගලික වෛද්‍යවරුන්ට කොළඹ ක්‍රම ශිෂ්‍යත්ව

"පොදු අභ්‍යන්තර වෛද්‍යකර්මය" විෂයයෙහි කෙටි කාලයක කොළඹ ක්‍රම ශිෂ්‍යත්වයක් පිරි නමනු සඳහා සුදුසුකම් දරන පෞද්ගලික වෛද්‍යවරුන්ගෙන් අයැදුම් පත් කැඳවනු ලැබේ.

2. අයැදුම්පත් පියවනදාට අයැදුම්කරුවන් වයස අවුරුදු 50ට පහළ සිටිය යුතු වෙයි.

3. උගැනුම සඳහා යවනු ලබන රට ද, පාඨමාර්ගයේ කාලසීමාව ද පසුව දන්වා එවනු ඇත.

4. උගැනුම ලබන රටට යාමටත්, ආපසු මෙරටට පැමිණීමටත් යන යාන පත්‍ර වියදම ද, මාස්පතා දීමනාවක් ද ප්‍රදායක සංවිධානය විසින් ගෙවනු ඇත.

5. කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට අපේක්ෂකයින්ට නියම කරනු ඇත. සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය සහ ඉසවුව පසුවැ දන්වා එවනු ඇත. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් වියදම් හෝ කිසිවක් ගෙවනු නො ලැබේ.

6. මෙහි මතු දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ අනුකරණයෙන් පිළියෙළ කළ යුතු අයැදුම් පත්, 1969 මැයි 31 වනදා හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිසැ රෙජිස්ට්‍රාර් තැපෑලෙන් කොළඹ තැ. පෙ. අංක 500 හිමි සෞ. සේ. අධ්‍යක්ෂ වෙත ලිපිනය ලියා එවිය යුතු යැ. අයැදුම් පත් බහා එවන කවරයේ වමත උඩු කෙළවරේ "පෞද්ගලික වෛද්‍යවරුන්ට කොළඹ ක්‍රම ශිෂ්‍යත්වය" කියා හනක් තැබිය යුතු යි.

ඩී. බී. ගුණසේකර,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

මගේ අංකය : ඊසිඊ. 7/69
1969 මැයි මස 5 වනදා, කොළඹ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

### අයැදුම් පතේ ආකෘතිය

1. මුළු නම (වටකුරු පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. වෘත්තිය සුදුසුකම් :————.
4. ජාතිය :————.
5. ගැහැණු පිරිමි බව :————.
6. පෞද්ගලික වෛද්‍යවරයෙකු හැටියට සේවා කාලය (වගතුග සහිත) :————.
7. උපන් දිනය සහ තැන :————.
8. අයැදුම් පතට රුකුලක් හැටියට හුවා දක්විය හැකි විශේෂ හිමිකම් කිසිවක් තිබේ නම් එය :————.

————.
ඇයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–371—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

එස්. එච්. 86/67

## පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් කොස්තාපල්වරුන්ගේ තනතුරු

ලංකා පොලිස් සේවයේ කොස්තාපල්වරුන් වශයෙන්, පුහුණුව ලැබීම සඳහා මතු දැක්වෙන සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

2. මෙයට යාකොට ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් කොළඹ කොටුවේ ඇවිලන් චතුරශ්‍රයේ පිහිටා ඇති පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂක වෙත ලිපිනය කර 69. 7. 1 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය. අයදුම් පත් එවන කවරයේ "ආධුනික පොලිස් කොස්තාපල් අයදුම් පත" යන්න සඳහන් කළ යුතුයි. අභ්‍යාස විද්‍යාලයෙන් ඉල්ලුම් පත් නිකුත් කරනු නොලැබේ.

3. **වැටුප් ක්‍රමය.**—පළමුවැනි අවුරුද්ද වර්ෂයකට රු. 750, ඉන්පසු වර්ෂයකට රු. 840—22×42—රු. 1,764. රු. 1,050, රු. 1,260, රු. 1,470 සහ රු. 1,638 යන පියවරයන්ට පෙර කාර්යක්ෂමතා කඩයිම් සහිතව.

4. **අපේක්ෂකයින් සතුව තිබිය යුතු සුදුසුකම්.**—

(අ) වයස් සීමාව—69. 7. 1 වැනි දිනට වයස අවුරුදු 18 න් ඉහළ සහ අවුරුදු 25 න් පහළ විය යුතුයි. සේවාමුක්ත භටයනට සාමාන්‍ය වයස පිළිබඳ අනුග්‍රහය ලැබෙනු ඇත. ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල නියුක්තව සිටි සේවකයිනට, අංක 427 සහ 434 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛනයෙන් පැවරෙන සියළුම අනුග්‍රහයන් හිමිවේ.

(ආ) අධ්‍යාපනික—අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරන ලද පාසැලකින් නිකුත් කරන ලද කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය, හෝ එවැනි පාසැලක 8 වැනි පංතියෙන් සාමාර්ථයක් ලැබ එම සාමාර්ථය, කණිෂ්ඨ පාඨශාලා සහතිකයට සමාන යයි එම පාසැල් ප්‍රධානියා විසින් සහතික කිරීම හෝ පිරිවෙන් අවසන් පරීක්ෂණයෙන් සාමාර්ථයක් ලැබීම.

(ඇ) ශාරීරික—(i) උස අඩි 5 අඟල් 4 (අඩුම)
(ii) පපුව අඟල් 31 යි (නි. ස්වාසයේදී)

(ඈ) වෙනත් සුදුසුකම්—අයදුම්කරුවන් අවිවාහකයින් විය යුතුය. සේවාමුක්ත භටයෝද ලංකාවේ එක්සත් රාජධානි කඳවුරු වලින් අස්කරන ලද හමුදාවකට අයත් නොවූ සේවකයෝද මෙම අවශ්‍යතාවයෙන් මුදනු ලැබේ.

(ඉ) තෝරාගනු ලබන අපේක්ෂකයින් පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි. පොලිස් සේවයෙහි සේවයට නුසුදුසු වන අපේක්ෂකයින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඊ) ඇස් පෙනුම—පෙනීම එක් ඇසකින් 6/12 අඩු නොවිය යුතුයි. එක් ඇසක පෙනුම 6/6 නම්, අනෙක් ඇසින් 6/18 පෙනුම පිළිගනු ලැබේ. වර්ණ පෙනුම සාමාන්‍ය විය යුතුයි. යම් අපේක්ෂකයෙකු උපැස් පාවිච්චි කරන්නේ නම් ඔහු සේවයට නුසුදුස් සෙකි.

**සැලකිය යුතුයි.**—දිවයිනේ හෝ විදේශයන්හී ක්‍රීඩා තරඟ ආදියට සහභාගි වී විශිෂ්ඨ ජයග්‍රහනයක් ලබා ඇති අයදුම් කරුවන් ගෙන් උසෙහි හෝ පපුවෙහි මිනුම්වල මඳ ඌණතාව යක් ඇති වූවත්, සෙසු අවශ්‍යතාවයන්ට අනුකූල වේ නම් ඔවුන්ගේ අයදුම්පත් ද, පිළිගනු ලැබේ.

5. **පත්වීම් කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සහ පොලිස් අනුග්‍රහ අරමුදල වැනි වෙනත් දෙපාර්තමේන්තු අරමුදල් ආදියට දායක විය යුතුයි.

6. **සේවා කොන්දේසි.**—

(i) පත්වීම් තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් වේ.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයින්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධානයන් ක්‍රියාවට නැගීම සිණිස සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවනට අනුකූල වීම අවශ්‍ය වේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි කාර්ය සංවිධානයෙන් වන රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, පොලිස් විනය නීති සංග්‍රහය සහ පොලිස්පති වරයා විසින් හෝ රජය විසින් විටින් විට නිකුත් කරන නියෝගයන්ට යටත් විය යුතු වේ.

(iv) සෑම අපේක්ෂකයෙකුම පත්වීම ස්ථිර කිරීමට පෙර නියම කරන ලද දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් සමත් විය යුතුයි. දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් අසමත් වන හෝ පොලිස් රාජකාරිවලට නුසුදුසු යයි පිළිගැනෙන අය සේවයෙන් අස්කිරීමට ඉඩ තිබේ.

(v) ඔවුන්ගේ පත්වීම් ස්ථිර කරන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. කෙසේ වෙතත් මේ සඳහා අවුරුදු දෙකක සතුටු දායක සේවයක් ඇති කොස්තාපල් වරුන්ගෙන් ලැබෙන ඉල්ලුම් පත් සලකා බලා, පොලිස්පතිවරයාගේ අභිමතය පරිදි අවසර දෙනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයෙහි පළමු කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි වලට අවධානය යොමු කළ යුතුයි.

8. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත්වලට පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය.

(ii) මෑතකදී ගන්නා ලද චරිත සහතික දෙකක්.

(iii) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

9. අවසාන දිනට පසුව ලැබෙන සහ මෙම ගැසට් නිවේදනයට අනුකූල නොවන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද ඒවාට පිළිතුරු සපයනු නොලැබේ.

ඊ. එල්. අබේගුනවර්ධන,
පොලිස්පති,

1969 මැයි මස 5 වැනි දින,
කොළඹ 1, පොලිස් මූලස්ථානයේදීය,

## ආදර්ශ අයදුම් පත්‍රය

### ආධුනික පොලිස් කොස්තාපල් තනතුර

1. සම්පූර්ණ නම (අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ සඳහන්ව ඇති පරිදිම විය යුතුයි) :————.

2. පියාගේ සම්පූර්ණ නම :————.

3. පියාගේ රැකියාව :————.

4. අයදුම්කරු උපන් ස්ථානය :————. පළාත :————. උපන් ස්ථානයට කිට්ටු පොලිස් ස්ථානය :————.

5. උස :————. පපුව (හුස්ම නැල්ලා) :————.

6. 1969. 7. 1 දිනට වයස :————. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

7. (අ) ජාතිය :————.
(ආ) ඔබ ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන්ද? නැතහොත් ලියාපදිංචි වීමෙන්ද ? :————.
(ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
(ඇ) ඔබ පරම්පරාවෙන් ලාංකිකයෙකු නම්, උපන් ස්ථානය :—
(i) අයදුම්කරු :————.
(ii) ඔබගේ පියාගේ :————.
(iii) පිය පක්ෂයේ මුත්තාගේ :————.
(iv) පිය පක්ෂයේ මී මුත්තාගේ :————.

8. දැනට ලිපිනය :————.
එම ලිපිනයට ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.

9. (අ) විවාහකද ? :————.
(ආ) අනියම් බිරිඳක් සිටිද ? :————.

10. දැනට කරන රක්ෂාව :————.

11. යුද්ධ හමුදාවේ සේවය කරන්නෙහිද, නැතහොත් යුද්ධ හමුදාවේ හෝ ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල සේවය කළෙහිද ? :————.
(අස්වීමේදී දෙන ලද සහතිකයේ පිටපත් අමුණන්න)

12. අධ්‍යාපනික සුදුසුකම් :————.
(සමත් වී ඇති උසස්ම විභාගයේ සහතිකවල පිටපත් අමුණන්න)

13. විශේෂ සුදුසුකම් තිබේද ? :————.

14. අයදුම්කරු ගැන විමසුම කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.

15. (අ) ඔබ මීට පෙර පොලිස් සේවයට බැඳීමට ඉල්ලුම් කළෙහිද ? එසේ නම් විස්තර දෙන්න :————.
(එවන ලද පිළිතුරේ පිටපතක් එවන්න)
(ආ) ඔබ මීට පෙර පොලිස් සේවයේ සිටියෙහිද ? :————.

16. ඔබ හෝ ඔබගේ කිසියම් ඥාතියෙකු යම්කිසි අපරාධයක් සම්බන්ධයෙන් නඩුවකට පැටලී, උසාවියට කැඳවනු ලැබ, නඩු පවරනු ලැබ හෝ දඬුවම් ලබා හෝ ඇද්ද ? එසේ නම් විස්තර සපයන්න :————.

ඉහත සඳහන් කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**සැළකිය යුතුයි** :—අයදුම්කරුවන් විසින්ම අවශ්‍ය කරුණු පුරවා ඉල්ලා ඇති සහතික පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි :—

පුහුණු කිරීමේ අධ්‍යක්ෂක,
පොලිස් අභ්‍යාස විද්‍යාලයය,
ඇම්ලන් චතුරශ්‍රය,
කොළඹ 1.

5–385—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

සාප/5/77.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ශිල්ප ප්‍රදශික තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනවල මෙහි පහත 4 වෙනි ඡේදයේ (ආ) කොටසේ සඳහන් වෘත්තීන් පිළිබඳ ශිල්ප ප්‍රදශික තනතුරු සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදශී ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් 1969 ජූනි මස 5 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) සථිර ලේකම්ට ලැබෙන සේ එවිය යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—

(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතා වන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් පරීක්ෂා කාල සීමාව අවුරුදු 3 ක් වන්නේ ය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුවහොත් පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ තත්ත්වයේ පවතිනු ඇත.

(iv) පත් කරනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) බඳවාගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි.

**3. වැටුප් හා දීමනා.**—මෙම තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය නම් රු. 1,860—120 × 8—රු. 2,820 යි.

රජයේ නීති රීති අනුව ජීවනාධාර දීමනා, විශේෂ ජීවනාධාර දීමනා සහ ගෙවල් කුලී දීමනාදිය ගෙවනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම්.**—

**(අ) සෑම අයදුම්කරුවෙක්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක් යටතේ සේවය කරන්නෙකු විය යුතුය.**

(ආ) ලෝහ වැඩ, ලී වැඩ, වඩුවැඩ හා පිරිද්දීම්, ඇව ඝාණ්ඩ සෑදීම, විදුලිය වැඩ, ඉලෙක්ට්‍රොනික් වැඩ, විදුලි සංදේශ, මෝටර් යාන්ත්‍රික වැඩ, ස්වයංචල යාන්ත්‍රික වැඩ, පැස්සුම් වැඩ, කම්මල් වැඩ, පෙදරේරු (ගඩොල් ඇල්ලීම හා කපරාරු කිරීම) වැඩ, ගොඩනැගිලි වැඩ යන වෘත්තීන් එකක හෝ වැඩි ගණනක විශිෂ්ඨ දක්ෂතාවන් තිබිය යුතුය. (වෘත්තීන් වැඩි ගණනක දක්ෂතා ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ඇ) රජයේ කාර්මික ආයතනයක හෝ රජයේ කාර්මික අධ්‍යාපන ආයතනයක හෝ පුහුණු කම්කරුවෙක් වශයෙන් හෝ කාර්මික වෘත්තියක (රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ උපදේශක සේවාවද මීට ඇතුළත් ය.) හෝ යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවාවක් තිබිය යුතුය.

(ඈ) ඉහත (ඇ) ඡේදයෙහි සඳහන් එම සේවා කාලය ඇතුළත—
(i) පුහුණු I වැනි පන්තියේ උපරිම වැටුපේ (රු. 1,674) අවුරුද්දකට නොඅඩු කාලයක් සේවය කර තිබීම හෝ
(ii) රු. 1,320—72—රු. 2,184 වැටුප් ක්‍රමය නියමිත තෝරීම් ශ්‍රේණියේ තනතුරක සේවය කරමින් සිටිය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක් ම සූදානම් විය යුතුය :—

(අ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ආ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) 4 වැනි ඡේදයේ (ඇ) අනුඡේදය යටතේ සඳහන් වන සේවය පිළිබඳ සහතික.

(ඈ) සිංහලෙන් හා/හෝ දෙමළෙන් සමත්වූ ඉහළම විභාගය දැක්වෙන සහතිකය.

**සටහන** :—

(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා **නොඑවිය** යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ නමටද එවිය යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළ හොත් පමණක් එසේ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් බාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍යසේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් බාර ගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ඇතුළත ඉල්ලුම් පත ලැබුණ බවට ලිපියක් නොලද හොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දක්විය යුතුය. කිසියම් අයදුම් කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 මැයි මස 9 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදී ය.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

(මෙම ඉල්ලුම් පත්‍රය අඟල් $8\frac{1}{2}\times13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතුය)

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයයි**

(සාප/5/77)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ස්ථිර ලිපිනය :————.
3. ගම් ප්‍රදේශය :————.
4. අයදුම් පත් බාර ගන්නා අවසාන දිනට නියම වයස :————.
   උපන් දිනය :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.
7. අධ්‍යාපන සුදුසුකම් :—
   (i) සාමාන්‍ය :————.
   (ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර :————.
   (iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී ඇති උසස්ම විභාගයේ විස්තර: ————.
8. නිවේදනයේ 4 වැනි ඡේදයේ (ඇ) අනු ඡේදය යටතේ සේවා විස්තර :————.
   (සේවය කළ ආයතන, සේවා කාලයන්, දැරූ තනතුර සඳහන් කළ යුතුයි.)
9. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ?
10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මඟින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම්, (අ) දිනය :————. (ආ) නඩු නොම්මරය :————. (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.
11. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබේ ණයතුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.
12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
13. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.
14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :—
    (i) දරන ලද තනතුර :————.
    (ii) නියුක්තව සිටි වකවානුව :————.
    (iii) අස්වීමට හේතුව :————.
15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්,
    (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
    (ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
    (ඇ) සේවය නතර කිරීමට හේතු :————.
16. දැනට යෙදී සිටින රක්ෂාව :—
    (i) දෙපාර්තමේන්තුව :————.
    (ii) තනතුර හා ශ්‍රේණිය :————.
    (iii) ඊට පත් වූ දිනය :————.
    (iv) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද ? : ————.
    (v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය : ————.
    (vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.
17. වෙනත් කරුණු :————.

18. මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මගේ අංකය :
ඔබේ අංකය : සාප/5/77.

අධ්‍යා. සං./ලේ.,

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය.*

ඉල්ලුම් පත්‍රයේ සඳහන්................අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

————,
පදවි නාමය.

දිනය :————.

(* අදාල නැති කොටස් කපා හරින්න.)

5-487—69.5.15 දින අංක 14,854 දර

---

## ලංකා බැංකුවේ නීති හා භාරකාර අංශයේ සහායක තනතුර

ලංකා බැංකුවේ නීති හා භාරකාර අංශයේ සහායක තනතුරක් සඳහා අඩුම වශයෙන් පස් අවුරුද්දක ක්‍රියාකාරී පළපුරුද්දක් ඇති 1969 මැයි 28 වෙනි දිනට වයස අවුරුදු 35කට වැඩි නොවන, ලංකාවේ පුරවැසිකම් හිමි සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු හා මහජන නොතාරිස් පදවි දරන්නන් ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, ඉඩම්වල අයිතිය පිළිබඳ ඔප්පු පරීක්ෂාකිරීමේ පළපුරුද්දක් ද නොතාරිස් වැඩ පිළිබඳ පළපුරුද්දක් ද ඔප්පු හා වෙනත් නීතිමය ලේඛන සම්බන්ධයෙන් රාජ්‍ය භාෂාමය උසස් ප්‍රවීණත්වයක් ද තිබීම වාසි සහගත වන්නේ ය.

මෙම තනතුරට අදාල වැටුප් හිණ—

රු. 485—965
8×30 සහ 6×40

වන නමුදු පත්වීම ලබන්නාගේ සුදුසුකම් හා පළපුරුද්දට සැසඳෙන අයුරින් හෙතෙම නියමිත වැටුප් හිණෙහි සුදුසු තැනකට පත් කරනු ලැබේ. පත්වීම ලබන්නා හට ලංකා බැංකුවේ නීති රීතිවලට අනුකූලව ජීවනාධාර දීමනාවද ගෙවනු ලැබේ.

2. පත්වීම් ලබන්නා—

(අ) පත්කිරීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) අවුරුදු 3 කට නොවැඩි එහෙත් අවුරුද්දකට නොඅඩු ආධුනික සේවා කාලයක් යටතේ සේවය කළයුතු වන අතර මෙම වකවානුව තුළදී ලංකා බැංකුව විසින් හෝ ලංකා බැංකුව වෙනුවෙන් පවත්වනු ලබන රාජ්‍ය භාෂාව පිළිබඳව 3 වැනි ශ්‍රේණියේ ප්‍රවීනතා පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ඊ) බැංකුවේ විශ්‍රාම නඩත්තු ක්‍රමයන්ට බැඳිය යුතුය.

(උ) ඉහත දක්වූ කාල සීමාව ඇතුලත ඉහත දක්වා ඇති පරිදි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා පරීක්ෂණයෙන් සමත් වීමෙන් අනතුරුව ඔහුගේ සේවය සතුටුදායක නම් පත්වීම ලැබුණු දිනයේ සිට අවුරුද්දක සේවා කාලයක් සපිරුණු පසු හෙතෙම තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

(ඒ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන්ට මෙන්ම රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහිලා දැනට බල පැවැත්වෙන හෝ අනාගතයේදී ඉදිරිපත් කරන්නට ඉඩ ඇති හෝ කිසියම් නීති හෝ ව්‍යවස්ථාවන් අනුගමනය කිරීමේ කොන්දේසියකට එකඟ විය යුතුය.

3. (අ) ලංකා බැංකුව මඟින් හෝ ලංකා බැංකුව වෙනුවෙන් හෝ පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීනත්වය පිළිබඳ 1 වෙනි ශ්‍රේණියේ පරීක්ෂණයෙන් සමත්ව තම සේවයෙහිද නියමිත කාලය සපුරාලන තුරු ඉහත 1 ඡේදයේ දක්වා ඇති වැටුප් හිණෙහි පළමුවැනි වැටුප් වැඩිවීම ලැබීමටද,

(ආ) ලංකා බැංකුව මගින් හෝ ලංකා බැංකුව වෙනුවෙන් හෝ පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය පිළිබඳ II වෙනි ශ්‍රේණියේ පරීක්ෂණයෙන් සමත්ව තම සේවයෙහිද නියමිත කාලය සපුරාලනා තුරු ඉහත 1 ඡේදයේ දක්වා ඇති වැටුප් හිණෙහි දෙවැනි වැටුප් වැඩිවීම ලැබීමටද,

මෙම තනතුරට පත් කරනු ලබන තැනැත්තාට සුදුසුකම් නොලැබෙන්නේ ය.

4. ලංකා බැංකු ආඥාපනත (397 ඡේදය)ට අනුකූලව සුරැකුම් ඉදිරිපත් කිරීමට පත්වීම ලබනා තැනැත්තාට නියම කළ හැකි වන්නේ ය.

5. පහත අත්සන් කරන අයගෙන් ලබාගත හැකි බැංකුවේ පෝරමයෙහි, ලියා ඉදිරිපත් කළයුතු අයදුම්පත් කවරයක බහා එම කවරයේ ඉහළ වම් කෙළවර "ලංකා බැංකුවේ නීති හා භාරකාර අංශයේ සහකාර" යනුවෙන් පැහැදිලිව ලියා 1969 මැයි මස 28 වෙනි දින හෝ ඊට කලින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු මධ්‍යම කාර්යාලයේ මාණ්ඩලීක අංශයේ කළමනාකරුට ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම් පත් පෝරමයක් හෝ එබඳු පෝරමයක් ඉල්ලා එවන ලිපියක් හෝ තැපෑලේදී නැති වීම ගැන හෝ ප්‍රමාද වීම ගැන හෝ කෙරෙන පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය සමීප වනතුරු තම අයදුම් පත් එවීම ප්‍රමාද කරන අයදුම්කරුවෝම ඉන් ඇතිවන විපාකවලට වගකිව යුත්තෝ වෙති. තම අයදුම්පත් ලියාපදිංචි කළ තැපෑලෙන් එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

6. අයදුම්පත් ලැබුණු බව දැන ගැනීමට කැමති අයදුම්කරුවන් තම ලිපිනය සඳහන් ලියුම් කවරයක් අයදුම් පත සමඟ එවිය යුතුය. අයදුම්කරුවන් ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් ලේඛන පිටපත් ඇමිණිය යුතුයි :—(මුල් ලේඛන නොවේ.)

(1) උප්පැන්න ලියාපදිංචි කළ සහතිකය—

(සැළකිය යුතුයි.—බෞතීස්ම සහතික හෝ අධ්‍යාපන නීති යටතේ ආධාර ලබන පාසැල්වල රෙගුලාසි සඳහා නිකුත් කළ උප්පැන්න සහතික හෝ භාරගනු නොලැබේ.)

(2) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය හා හැකියාවන් පිළිබඳ ලඟදී ලබාගත් සහතික පත්‍ර 3ක්.

7. අයදුම්කරුවන් නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ සඳහා පැමිණිය යුතුයි. මේ සම්බන්ධයෙන් මඟ වියදම් හෝ වෙන කිසියම් මුදලක් ගෙවනු නොලැබේ.

8. අවශ්‍ය සුදුසුකම් නොමැති අය, ඉල්ලුම් පත් එවීමෙන් වැලකී සිටින ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. මෙම දැන්වීමේ අවශ්‍යතාවයන් සියළු ආකාරයෙන්ම සම්පූර්ණ නොවන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. තමන් ලංකාවේ පුරවැසියකු බව ඔප්පුකිරීමට පිළිගත හැකි සාධක ඉදිරිපත් කරන ලෙස සෑම අයදුම්කරුවෙකුගෙන්ම ඉල්ලා සිටිනු ලැබේ.

10. අයදුම් පතේ සඳහන් කිසියම් ප්‍රකාශයක් වැරදි බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් ඒ හේතුවෙන් අයදුම්කරු නුසුදුස්සෙකු බවට පත්වන අතර තෝරා ගැනීමෙන් පසුව වරද හෙළි වුවහොත් හෙතෙම සේවයෙන් පහ කරනු ලැබේ.

11. කිසියම් අයදුම්කරුවෙකුගේ යෝග්‍යතාවය නිර්දේශ කරන්නට කැමති පුද්ගලයෙකු වෙතොත් ඔහු එසේ කළ යුතු වන්නේ සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු තෝරා ගැනීම පිළිබඳව කෙරෙන ඕනෑම බලපෑමකින් හෝ පෙළඹවීමකින් සිදුවන්නේ එම අයදුම්කරු නුසුදුස්සෙකු බවට පත්වීමයි.

ඩී. ඊ. පෙරේරා,
කළමනාකරු—මාණ්ඩලීක අංශය.

5–417—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### පර්යේෂණ සහකාර තනතුර (සිංහල)

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහකාර තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දැක්වෙන ඉල්ලුම් පත්‍රයේ අන්දමට පිළියෙළ කරන ලද අයදුම් පත් 1969 ජූනි 8 වැනිදට හෝ ඊට පෙර මා වෙත ලැබෙන්ට සැලැස් විය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රුපියල් 3,900 න් පටන් ගෙන වසරකට රුපියල් 180 සහ රුපියල් 240 යන වැඩිවීම් ඇතිව රුපියල් 6,540 තෙක් නගී. වැටුප රුපියල් 5,340 දක්වා වැඩිවන්නට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **සේවය පිළිබඳ කොන්දේසි :—**

(i) මේ තනතුර ස්ථිරය ; විශ්‍රාම වැටුප් සහිතය. මේ තනතුරට තෝරා ගන්නා අපේක්ෂකයාට තුන් අවුරුද්දක ආධුනික කාලයක් සහිතව පත් කරනු ලැබේ.

(ii) තෝරාගනු ලැබූ අපේක්ෂකයා සුළු කාලයක් ඇතුළත දී තනතුරෙහි වැඩ බාර ගැනීමට නියම කරනු ලැබේ.

(iii) මේ නිලධාරියාගේ ප්‍රධාන කාර්ය වනුයේ දැනට භාවිත වන වචන හා පාඨයන් ක්‍රමානුකූලව රැස් කිරීමත්, අවශ්‍ය වූ විට අලුත් වචන සැපයීමත්, ඒ සියලුම වචන හා පාඨයන් යථා පරිද්දෙන් සම්මත කර පිළිගත් වචන සංග්‍රහයක් සම්පාදනය කිරීම සඳහා කටයුතු කිරීමත් ය. සෙසු කටයුතු වලදීද රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ඔහුගෙන් සහාය බලාපොරොත්තු වනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම් :—**

සෑම අයදුම්කරුවකුම—

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක සිංහලය විෂයයක් වශයෙන් ගෙන සාමාර්ථය ලැබූ උපාධිධරයකු බවටත් ; නැතහොත්

(ආ) ඉංග්‍රීසි පිළිබඳ ඉතා හොඳ දැනුමක් ඇත්තාවූ ද උපාධිධරයකු තරම් ප්‍රවීණවූ ද සිංහල ලේඛකයකු හෝ ග්‍රන්ථ කර්තෘවරයකු බවටත් (සැ.යු.—සංස්කෘත හෝ පාලි හෝ දෙමළ පිළිබඳ දැනුමක් ඇතොත් එය අතිරේක සුදුසුකමක් වනවා ඇත.)

(ඇ) 1969 ජූනි 8 වැනිදාට තමාගේ වයස අවුරුදු 25 ට නො අඩු අවුරුදු 50ට නො වැඩි විය යුතුය. (රාජ්‍ය සේවාවේ සිටින අයදුම්කරුවන්ට මෙහි සඳහන් වැඩි වයස් සීමාව බල නොපවත්වයි.)

(ඈ) තමා විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත වූ බවටත් සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. සෑම අයදුම්කරුවකුම විසින් පහත සඳහන් කර ඇති සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) තම ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බවුතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර බාර ගනු නොලැබේ.) ;

(ආ) ලබාගත් උසස් ම අධ්‍යයන සහතික පත්‍රය හා/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය ; හා

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබා ගන්නා ලද සහතික පත්‍ර තුනක් (දැනට රාජ්‍ය සේවාවේ සිටින අයදුම්කරුවෝ මේ කොන්දේසියෙන් නිදහස් කරනු ලැබෙත්).

**සැළකිය යුතුයි.**—සහතික පත්‍රවල හා චරිත සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. ආණ්ඩුවේ සේවාවෙහි නියුක්ත නිලධාරියකු එවන ඉල්ලුම් පත්‍රයක් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණොත් ඒ ඉල්ලුම් පත්‍රය ඒ නිලධාරියාගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාට ඒ දිනයට කලින් ලැබුණු බව කියා එය ප්‍රමාදවීමට සැහෙන හේතු දක්වමින් ඒ ප්‍රධානයා එය බාරගන්නා ලෙස නිර්දේශයක් කළහොත් මිස, බාරගනු නොලැබේ.

7. ඉල්ලුම් පත්‍ර හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ පෞද්ගලික නමට නොව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් වෙතට එවිය යුතු ය.

8. මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළවූ ද රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්කිරීම්වලට අදාල සාමාන්‍ය පොදු කොන්දේසි බලනු මැනවි.

9. එවන සෑම ඉල්ලුම් පත්‍රයක්ම මෙහි ලැබුණු බව දන්වා එවනු ලැබේ. ඉල්ලුම්පත්‍ර බාරගැනීම නවත්වා තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණහොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් තැනට වහාම දන්වා එවිය යුතුය. එසේ නො කරන අයගේ හිමිකම් ගැන සලකනු නො ලැබේ.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1969 මැයි 7 වැනි දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය, 598,
22, රීඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### පර්යේෂණ සහකාර (සිංහල) තනතුර සම්බන්ධ ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) අගට යෙදෙන නම :———— .
   (ආ) අනික් නම් :————.
2. ලිපිනය :————.
3. (අ) වර්ෂ 1969 ජූනි 8 වැනි දිනට සම්පූර්ණ වයස :—
   අවුරුදු :——, මාස :——, දවස් :——.
   (ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිට පතක් අමුණා එවිය යුතුයි) :————.
4. රටවැසි භාවය සහ එය කෙසේ හිමි වී ද යන බව :————.
5. (අ) පියාගේ සම්පූර්ණ නම :————.
   (ආ) පියා උපන් දිනය සහ ස්ථානය :————.
   (ඇ) ඔහුගේ රටවැසි භාවය :————.
6. අයදුම්කරු විවාහකද, අවිවාහකද, කනවැන්දුම් ද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතුයි)
7. මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතු යි) :————.
8. (ආ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමාර්ථ්‍යය ලැබූ පෙළත් සඳහන් කළ යුතුයි), සහතික පිටපත් ද අමුණා එවිය යුතුයි :————.
   (ආ) සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සහ පාලි, සංස්කෘත හෝ දෙමළ භාෂාවන්ගෙන් සාමාර්ථය ලත් උසස් ම විභාගය :—.
   සිංහල :————.
   ඉංග්‍රීසි :————.
   පාලි :————.
   සංස්කෘත :————.
   දෙමළ :————.
   (ඇ) සුදුස්සකු වනුයේ ගැසට් නිවේදනයේ 4(අ) ඡේදය හෝ 4 (ආ) ඡේදය හෝ යටතේ ද යන බව :————.
9. සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම තිබේ නම් දින සමග විස්තර සඳහන් කරන්න :————.
10. (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස් වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද, ඒ පිළිබඳව වකවානුව ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.
    (ආ) රජයේ සේවයේ යෙදීසිටි නම්, තත්ත්වයත වාර්ෂික වැටුප් සඳහන් කරන්න :————.
11. විශේෂ පළපුරුදු, පුහුණුවීම්, සුදුසුකම් සහ හිමිකම් :————.
12. පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනෙකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥතීන් නොවිය යුතුයි) :—
    (1) ————.
    (2.) ————
    (3) ————.
13. චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්ව (ඥතීන් නොවිය යුතුයි. මෑතකදී ලත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුයි) :————.
14. මුදල් කරදර නැති වූවෙක් ද යන වග—නැතිනම් ණය ප්‍රමාණය (ගණන් විස්තර කරන්න) :————.
15. වෙනත් කරුණු :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම දෙන්නට පෙර හෙළි වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම ලැබුවාට පසු හෙළි වුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැති ව, මා නිලයෙන් අස් කිරීමටද යටත්වන බව මම දැන සිටින බවට ද, මේ අයදුම් පතෙහි දැක්වෙන සියලු විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–422—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය

### ප්‍රධාන ලිපිකරු තනතුර සඳහා ඇබෑර්තුව

මෙම මණ්ඩලයේ සේවයේ රාජ්‍ය වතුයායක ඉහත සඳහන් තනතුරට ලාංකිකයින්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

**(අ) අධ්‍යාපන සුදුසුකම් :**—අයදුම්කරුවන් විසින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන වන අන්දමින් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය සිංහල/දෙමළ, අංක ගණිතය හා වෙනත් විෂයයන්ගෙන් සමර්ථ වී සිටිය යුතුයි.

**(ආ) පඩි ක්‍රමය :**—මාසික මූලික වැටුප : රු. 145—7·50—රු. 220 හා ඒකාබද්ධ හවුල් ගිවිසුම අනුව ජීවනාධාර ගෙවනු ඇත.

**(ඇ) වයස :**—1.5.69 දිනට අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර එම දිනට අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය.

**(ඈ) නිලකාර/කාර්මික සුදුසුකම් හා පලපුරුද්ද :**—පිළිගත් වෙළඳ ආයතනයක හෝ වතුයායක අඩු වශයෙන් අවුරුදු 3 ක ගණන් තැබීම සම්බන්ධ පළපුරුද්ද තිබිය යුතුයි.

**සේවා කොන්දේසි :—**

1. ආධුනික කාලය අවුරුදු තුනක් වන අතර, සිංහල ප්‍රවීනතා විභාගයෙන් සමත්වී නම් ආධුනික කාලය අවුරුද්දක් වේ.
2. දනට සකස් කර ඇති මණ්ඩලයේ විධිවිධාන හා ඉදිරියට ඇතිවන විධිවිධානවලට එකඟ විය යුතුයි.
3. ලංකාවේ කොයි පෙදෙසෙහිත් මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීම.
4. අර්ථසාධක අරමුදලට තමාගේ වැටුපෙන් 10% සම්මාදම් කිරීම හෝ වෙනත් පිළිගත් අර්ථසාධක අරමුදලට සම්මාදම් කළ යුතු අතර තමාගේ දල වැටුපෙන් 15% මණ්ඩලය විසින් සම්මාදම් කරනු ලැබේ.
5. තනතුරුවලට පත්වන්නන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනටමත් පනවා ඇති සියළුම නීති රීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා ඔහුට ඇති සුදුසුකම් හා පලපුරුද්ද අනුව යථෝක්ත පඩි ක්‍රමයේ සුදුසු පියවරක තැබිය හැකිය.

වයස, අධ්‍යාපන හා පලපුරුද්ද, නිලකාර/කාර්මික සුදුසුකම් (ඇතිනම්) මීට ඉහතද කළ රක්ෂාව හා ලැබුණ වේතනය අයදුම් පතෙහි සඳහන් කළ යුතුයි. තමා ගැන දන්නා දෙදෙනෙකුගේ නම් සඳහන් කළ යුතුය.

සහතික පත්වල පිටපත් (මූලික පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුය.

අයදුම් පත් පහත දක්වෙන උපලේඛනයේ ඇති ආකෘති පත්‍රයේ ආකාරයට විය යුතු අතර, ලියා පදිංචි කරන ලද තැපැලෙන් 1969 මැයි 30 වෙනි දිනට ප්‍රථම හෝ එදිනට කොළඹ 5, තැ.පෙ. අංක 718, ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

**ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ. අයදුම් පත්‍ර ලැබුන බවද දන්වනු නොලැබේ.**

සභාපති.

ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය,
106, හැව්ලොක් පාර,
කොළඹ 5.

### උපලේඛනය

.............................ඇබෑර්තුව සඳහා

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(2) ලිපිනය :————.
(3) උපන් දිනය :————. 1969.5.1 දිනට නියමිත වයස :————.
(4) ජාතිය :————.
(5) අධ්‍යාපන සුදුසුකම් :————.
(6) කලින් කළ රක්ෂාව :————.

| | ස්වාමියාගේ හෝ වතුයායේ නම | තනතුර භාරගත් දිනය | තනතුරෙන් අස්වූ දිනය | තත්ත්වය හා ලැබූ වේතන | ඒ වතුවල අස්වැන්න හා අක්කර ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| (අ) | ............ | ............ | ............ | ............ | ............ |
| (ආ) | ............ | ............ | ............ | ............ | ............ |
| (ඇ) | ............ | ............ | ............ | ............ | ............ |
| (ඈ) | ............ | ............ | ............ | ............ | ............ |
| (ඉ) | ............ | ............ | ............ | ............ | ............ |
| (ඊ) | ............ | ............ | ............ | ............ | ............ |
| (උ) | ............ | ............ | ............ | ............ | ............ |

(7) තොරතුරු දනගත හැකි දෙදෙනෙකුගේ නම් හා ලිපිනය :————.
   (අ) ————.
   (ආ) ————.
(8: විශේෂ සුදුසුකම්/අයිතිවාසිකම් ඇත්නම් :————.

————,
දිනය :————. ඉල්ලුම්කරුගේ අත්සන.

**සැලකිය යුතුයි.**—පහත සඳහන් අවශ්‍යතාවයන් අනුව පිටපත් (මූලික පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුයි.
(අ) උප්පැන්න සහතිකය/නොමැති නම් ඒ වෙනුවට දිවුරුම පත්‍රයක් : ————.
(ආ) අධ්‍යාපන සහතික :————.
(ඇ) මෑතකදී ලබා ගන්නා ලද සහතික පත් 3 ක් :————.
(ඈ) කලින් කළ වෘත්තීය සඳහා සහතික පත් :————.

5–457—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ඇබෑර්තු

මෙම සංස්ථාවෙහි මෙහි පහත සඳහන් තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. මෙහි අවසානයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1969.5.26 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ,
සේවක මණ්ඩල කළමනාකාරතැන,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
අංක 113, ගාලුපාර, කොළඹ 3.
යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැල් මගින් එවිය යුතු යි.

3. තෝරාගනු ලබන අයදුම්කරුවන්, ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් ලක්ෂ්‍යයන් මත පත් කිරීමට ඉඩ ඇත.

4. මෙහි දක්වා ඇති වැටුප් පරිමාණය ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් වේ.

5. මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයනට අනුකූලව පිළියෙල නොවුණු ඉල්ලුම් පත් කිසිදු දැන්වීමක් නොකර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

7. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රජයේ අනෙක් සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම් පත් සලකා බලනුයේ, ඔවුන් විසින් ඒවා අදල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965.8.20 වෙනි දින දණ චක්‍රලේඛයෙහි දක්වෙන වගන්තිවලට අනුව අදල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකිදැයි යන්න දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

8. **සේවා කොන්දේසි.**—(1) තෝරාගනු ලබන අයදුම්කරුවන් :
(අ) පත්වීමට පෙර ශාරීරික යෝග්‍යතාව දක්වීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතු ය.
(ආ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගත යුතු ය.
(ඉ) සේවක අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් සියයට අට (8%) ක් දායක විය යුතු ය. ඊට සංස්ථාවෙන් සියයට දොළහ (12%) ක් දායකවනු ඇත.
(ඊ) සංස්ථාවේ ඕනෑම කාර්යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම අවශ්‍ය ය.
(II) මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු කාල සීමාවකට යටත්ව පත් කරනු ලැබේ.
(III) අයදුම්කරුවන් 69.5.26 දිනට වයස අවුරුදු 45 නොඉක්මවූ අය විය යුතු ය.

| තනතුර සහ වැටුප් ක්‍රමය | අවශ්‍ය සුදුසුකම් |
|---|---|
| රසායනාගාර පරීක්ෂක—බී—1 ශ්‍රෙණිය ... රු. 530—750 ——— 6 × 20 : 4 × 25 | (අ) විද්‍යා විෂයයන් (විශේෂයෙන් රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව) සහිතව ජයෂ්‍යය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් යුක්තව අ.පො.ස. (සාමාන්‍ය) විභාගයෙන් සමත් වී සිටිය යුතුය. රසායනාගාර ප්‍රදර්ශකයෙකු වශයෙන් පිළිගත් රසායනාගාරයක අඩු වශයෙන් අවුරුදු පහක පළපුරුද්දක් තිබිය යුතු ය. (ආ) අ.පො.ස. (සාමාන්‍ය) විභාගයේදී රසායන විද්‍යාව සඳහා සම්මාන හෝ විශිෂ්ට සාමාර්ථයක් ලබා ඇති අයත්, අ. පො. ස ( උසස් පෙල) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථයක් ලබා ඇති අයත්, පිළිගත් රසායනාගාරයක සේවය කොට අවුරුද්දක පළපුරුද්දක් ලබා සිටිය යුතු ය. |

**සැළකිය යුතුයි.**—පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යා උපාධිධාරී අයදුම්කරුවන් ගැන විශේෂයෙන් සළකා බලනු ලැබේ.

113, ගාලුපාර,
කොළඹ 3,
1969 මැයි 3 වෙනි දින.

සේවක මණ්ඩල කළමනාකාරතැන.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|

1. ඉල්ලුම් කරන ලද තනතුර :————.
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය ප්‍රථමයෙන්)
3. මුල් අකුරු සමග නම :————.
4. ලිපිනය :————.
5. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
6. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.
7. පුරවැසි භාවය :————.
(උත්පත්තියෙන්ද, ලියා පදිංචි වීමෙන්ද යන වග)
8. විවාහක/අවිවාහක බව : අවිවාහක බව :————. විවාහක බව :————. දික්කසාද බව :————.
9. අධ්‍යාපනික පසුබිම :

| ඉගෙනීම ලැබූ පාඨශාලාවල් | සාමාර්ථය ලැබූ උසස්ම විභාගයන් සහ වර්ෂයන් | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|---|
| | | | | |

10. වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් තිබේ නම් :————.
11. මීට ප්‍රථම කරනලද රැකියාවන් පිළිබඳ විස්තර :————.

| ආයතනයේ නම | තත්ත්වය | සිට | දක්වා | අස්වීමට හේතු |
|---|---|---|---|---|
| | | | | |

12. දැනට ලබන වැටුප :————.
13. විශේෂ සුදුසුකම් ඇත්නම් :————.
(ඔබ විසින් හදුරා ඇති ඉගෙනීම/පුහුණුව පිළිබඳ විස්තර සඳහන් කරන්න)
14. වෙනත් කරුණු :————.
15. මෙම දැන්වීමේ තනතුරු සඳහා ''අවශ්‍ය සුදුසුකම්'' යටතේ සඳහන් සුදුසුකම්/පළපුරුදුකම් එකිනෙක ඔබට ඇති බව දක්වෙන සටහනක් හා එය ඔප්පු කිරීම සඳහා අදල සහතිකවල පිටපත් ද අමුණා එවිය යුතුයි.

ඉහත සඳහන් විස්තර සියල්ල නිවැරදි බවත්, සත්‍ය බවත්, සඳහන් කළයුතු කිසිවක් වසන් නොකළ බවත් මෙයින් සහතික කරමි. ඉහත සඳහන් විස්කර අසත්‍ය බව හෝ සැපයිය යුතුව තිබූ විස්තර වසන් කර ඇති බව හෝ තෝරා පත්කර ගැනීමට පෙර ඔප්පු වුනිනම් මගේ ඉල්ලුම් පත්‍රය අවලංගු වන බවද තෝරා ගැනීමෙන් පසුව ඔප්පු වුනිනම් කිසිම වන්දියක් නොමැතිව රැකියාවෙන් පහකරනු ලබන බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

5–479—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පුරප්පාඩු

අධ්‍යක්ෂ, ප්‍රවෘත්ති හා ප්‍රකාශන තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක ගෞරව හෝ පංතියක් සහිත උපාධියක් හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක් හා රජයේ සේවයේ හෝ පුද්ගලික අංශයේ කළමනාකාර තත්ත්වයේ 10 වසක පළපුරුද්ද. ප්‍රවෘත්ති පත්‍ර කලාව පිළිබඳ පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

හෝ

පිළිගත් ප්‍රවෘත්ති පත්‍රයක හෝ ගුවන් විදුලි ආයතනයක කතෘ මණ්ඩලයක යටත් පිරිසෙයින් 10 වසක පළපුරුද්ද සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්.

හෝ

පිළිගත් ප්‍රවෘත්ති පත්‍රයක කතෘ මණ්ඩලයේ හෝ ගුවන් විදුලි ආයතනයක ප්‍රවෘත්ති කාර්ය මණ්ඩලයේ හෝ යටත් පිරිසෙයින් 15 වසක පළපුරුද්ද සහිතව, පිළිගත් විශ්ව විද්‍යාලයක මධ්‍ය පරීක්ෂණය හෝ ඊට සමාන විභාගයක්.

(ගුවන් විදුලි ප්‍රචාර පිළිබඳ අවුරුදු 20 කට නොඅඩු පළපුරුද්දක් ඇති ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ සේවකයින් යටත් පිරිසෙයින් ලන්ඩන් මැට්රිකියුලේෂන් විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සමත් වී ඇතොත් ඒ අය වෙනුවෙන් ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් නොබලපානු ඇත.) සහ

(ආ) සිංහල හා ඉංග්‍රීසි පිළිබඳ මනා දැනුමක්, දෙමළ පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

(ඇ) දේශීය හා විදේශීය තත්කාලික සිදුවීම් පිළිබඳ දැනුම.

(ඈ) කළමනාකාරිත්වය හා ප්‍රකාශන නිෂ්පාදනය පිළිබඳ දැනුම.

**වැටුප් ක්‍රමය :** මාසිකව රු. 1,250 —1,750 (50×10) රු. 1,350ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**වයස :** අවුරුදු 30—45 දක්වා.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1969 මැයි 27 වැනි දිනට පෙර ලැබෙනසේ ලියා පදිංචි කළ තැපෑලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "අධ්‍යක්ෂ, ප්‍රවෘත්ති හා ප්‍රකාශන" යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

නෙවිල් ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

1969 මැයි මස 9 වැනි දින.

### ආදර්ශ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. අයදුම්කරු උපන් දිනය, ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.) :————.
5. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :—
   සිංහල :————.
   දෙමළ :————.
   ඉංග්‍රීසි :————.
7. අමුණා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.
   (චරිත හා අධ්‍යාපනික සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)
8. ඉහතින් යෙදී සිටි රැකියා පිළිබඳ විස්තර :————.
9. වෙනත් සුදුසුකම් :————.

මා ඉහතින් ප්‍රකාශ කොට ඇති කරුණු නිවැරදි සත්‍ය තොරතුරු බවත්, මා ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවයට පත් වුවහොත් මා විසින් ඉහතින් දෙන්නට යෙදුණ, අසත්‍ය හෝ වැරදි තොරතුරක් වෙතොත් ඒ හේතුවෙන් සේවයෙන් පහකිරීමේ දඬුවම් ලැබීමට මා සුදුස්සකු වන බවත් විශේෂයෙන්ම මීට පෙර යෙදී සිටි රැකියාවල් පිළිබඳ හෝ මීට අදාළ වැදගත් කිසියම් කාරණාවක් පිළිබඳව හෝ හිතාමතා වසන් කිරීම නිසා එවැනිම දඬුවමකට මා සුදුසුවන බවත් මා වටහාගත් බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

:————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–480—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ආධුනික සහකාර පොලිස් අධිකාරීන් ලෙස පත් කරනු ලැබීම සඳහා අපේක්ෂකයින් තේරීම—1969

1. (අ) ආධුනික සහකාර පොලිස් අධිකාරීවරුන් තෝරා ගැනීම සඳහා 1969 ජූලි මස 27 වැනි දින කොළඹ දී ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරාගනු ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු ආධුනික කාලයක් ගත කළ යුතු වේ.

(ආ) පත්වීම දීම සඳහා ගණන් බලා ඇති ඇබෑර්තු සංඛ්‍යාව සතරකි. මහජන යහපත උදෙසා මෙම ඇබෑර්තු පිරවියයුතු නොවේ යයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව කල්පනා කරන්නේ නම්, එම ඇබෑර්තුවලට පත්වීම් නොකරනු ඇත.

2. **ඉල්ලුම් කළ යුතු අන්දම.**—(අ) මුද්‍රිත අයදුම්පත් විභාග කොමසාරිස්ගෙන් 1969 ජූනි මස 1 වැනි දින සිට 1969 ජූනි මස 12 වැනි දින දක්වා ලබා ගත හැක. තැපෑලෙන් අයදුම්පත් ලබා ගැනීමට නම් තමන්ගේ නම සහ ලිපිනය ලියන ලද 9"×4" ප්‍රමාණයේ මුද්දර නොගැසූ කවරයක් ඔහු වෙත යැවිය යුතු වෙයි. මෙම කවරයේ උඩ කෙළවරේ, "ආධුනික සහකාර පොලිස් අධිකාරි විභාගය" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. එක ඉල්ලුම්කරුවෙකුට එක ඉල්ලුම්පත්‍රයකට වැඩියෙන් නිකුත් කරනු නොලැබේ.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත් විභාග කොමසාරිස්, තැ. පෙ. 1503, කොළඹ 2, යන ලිපිනයට 1969 ජූනි මස 15 වැනි දිනට ප්‍රථම ලැබෙන සේ රෙජිස්ටර් තැපෑලෙන් යැවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ. දැනට රජයේ සේවයේ නියුක්ත රජයේ නිලධාරීන් විසින් එවනු ලබන ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මගින්, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර විභාග කොමසාරිස්ට ලැබෙන ලෙස එවිය යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස්ගේ හෝ දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නොඑවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ උඩ කෙළවරේ "ආධුනික සහකාර පොලිස් අධිකාරී විභාගය", යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඇ) අයදුම්පත් සියළු ආකාරයෙන්ම සම්පූර්ණ විය යුතුය. ඉල්ලා ඇති සියළුම තොරතුරු සපයා නොමැති කවර ඉල්ලුම්පත්‍රයක් වුවද, එහි සඳහන් කර ඇති තොරතුරු අනුව තීරණය කොට ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

(ඈ) ඉල්ලුම්පත්‍රයක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි ආපදාවන් අයදුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතු වේ.

(ඉ) අයදුම්කරුවන් විසින් අයදුම්පත්‍රයෙහි වෙන්කර ගැනීමට හැකි වන සේ යොදා ඇති තැපැල් පතෙහි නම සහ ලිපිනය පමණක් සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත ලැබුණ බැව් දැන්වීම සඳහා එය පාවිච්චි කරනවා ඇත. මෙසේ නම සහ ලිපිනය සඳහන් නොකරන ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බැව් දන්වා නොඑවනු ඇත. නම සහ ලිපිනය එසේ සඳහන් කළ කිසියම් අයදුම්කරුවෙකුට තම අයදුම්පත්‍රය ලැබුණු බැව් ඉල්ලුම්පත් භාර ගෙන අවසන් කළ දිනයේ සිට සති තුනක් ඇතුළත දන්වා නොඑවුයේ නම්, ඔහු ඒ බැව් වහාම විභාග කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය. එසේ විමසා නොබැලීමෙන් සමහර විට විභාගයට පෙනී සිටීමේ අවස්ථාව අයදුම්කරුට නොලැබීයාමට ඉඩ ඇත.

(ඊ) මතු දැක්වෙන ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කළ විට, අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කළ යුතු වේ :—

(i) උප්පැන්න සහතික පත්‍රය (පාඨශාලාවල භාවිතය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ බෞතීස්ම සහතිකය මේ සඳහා පිළිගනු නොලැබේ).

(ii) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ලබා ඇති සහතික පත්‍ර.

(iii) පාසැල් වලින් ලබා ඇති සහතිකපත් හතරකට නොවැඩි ගණනක්. එම සහතික අතුරින් අඩු වශයෙන් එකක්වත් තම අධ්‍යයන උපදේශකවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් ලබා ගත් ඒවා විය යුතුය.

3. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—(i) ලැබී ඇති ඉල්ලුම්පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ අපේක්ෂකයා වෙත විභාග කොමසාරිස් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තමන්ගේ ප්‍රවේශපත්‍ර විභාග මධ්‍යස්ථානය භාර පරිපාලක වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

10. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපෑමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වන්නේ ය.

11. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරා ගනු ලබන අපේක්ෂකයින් විසින් දිවයිනේ ඕනෑම පළාතක පොලිස් නිලධාරියෙකු ලෙස සේවය කිරීම සඳහා ඔවුන් සතුව ඇති ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් නොවන කිසිම අපේක්ෂකයකු පත් කරනු නොලැබේ.

12. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයේ මුලින්ම පලව ඇති රාජ්‍ය සේවාවෙහි තනතුරු වලට අදාල පත්වීම පිළිබඳ පොදු කොන්දේසි වලට ද සැළකිල්ල යොමු කරමි.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මැයි මස 9 වැනි දින,
කොළඹ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකියයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වා ගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයනට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය භාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගත වන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාමද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන් ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්යමණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නො ලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නො ලිය යුතුයි. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙන යෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේනම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සෑදූ හෝ ගණන් කොහෙත්ම නොසෑදූ හෝ නිවැරදි පිළිතුරු දක්වීමත්, චිත්‍ර කර්මයෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම් ය. මේ සියලු දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලිද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, fපයිල් කවර, කාර්ඩ් බෝඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින්පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නො ගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළ හොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම්ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුයි. ලීන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්පවේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩදෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වූවොත් විභාගශාලාපතීන්ගේ සහකාර නිලධාරියකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියනවිට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමක් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වෙලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කටවත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාවම විභාග ශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔළඹි ලියනු මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක් ම එක ගොඩේ නෝරා බේරා ගන්නට නො හැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්න වලට උත්තර සපයන විට ගණ බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාල ව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කරවිය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන් නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වූවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
වැඩබලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේදීය.

5-476—69.5.15 දින අංක 14,854 දරනු ගැසට් පත්‍රය

## ලංකා උසස් කාර්මික විද්‍යාලයට ඇතුළත් කිරීම

### කාර්මිකයින්ගේ පාඨමාලාව

ඉහත සඳහන් පාඨමාලාවට සිසුන් ඇතුළත් කිරීම සඳහා අයදුම් පත් කැඳවමින් 1969 අප්‍රේල් මස 18 වෙනි දින පළකරන ලද අංක 14,850 දරන ගැසට් නිවේදනයේ I කොටසේ (II) ඡේදයේ අංක 2 කේ (1) සහ අංක 4 සහ 5 වෙනි ඡේදයන් කෙරෙහි ඔබේ අවධානය මෙයින් කැඳවනු ලැබේ.

2. (1) ඡේදය මෙසේ සංශෝධනය විය යුතුය.—

**වයස.**—1969 ජනවාරි මස 31 වෙනි දිනට අවුරුදු 16 ට අඩු නො විය යුතුයි. කෙසේ හෝ වයස අවුරුදු 20 ට අඩු අය කෙරෙහි විශේෂයෙන් සලකා බලනු ලැබේ.

4 ඡේදයට මෙසේ එක්විය යුතුයි :—

බාහිර අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් තමා අවසාන වරට ඉගෙනගත් පාසැලේ විද්‍යාලයාධිපති මඟින් එවිය යුතුය.

5 ඡේදයේ අවසාන වැකි දෙක මෙසේ කියවිය යුතුය :—

ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ හා අම්පාරේ හාඩි ආයතනයේ කාර්මිකයින්ගේ පාඨමාලාවේ අවුරුදු දෙක අවසාන විභාගයෙන් උසස් ලෙස සමත්වන සිසුන් 50 දෙනෙකු ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ පවත්වනු ලබන ඉංජිනේරු උපාධියට සමාන පස් අවුරුදු ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරාගනු ලැබේ.

ඇල්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂ.

ලංකා උසස් කාර්මික විද්‍යායතනය,
කටුබැද්ද, මොරටුව.
1969.5.5.

5-382—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## රජයේ සංගීත විද්‍යාලයට ඇතුළත්වීම—1969/70 අධ්‍යයන වර්ෂය

මෙම විද්‍යාලයේ 1969/70 අධ්‍යයන වර්ෂයෙන් ආරම්භ වන පස් අවුරුදු පාඨ මාලාව හැදෑරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයැදුම් පත් භාරගනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම් පත් 1969 මැයි මස 25 වැනි දිනට ප්‍රථම කොළඹ 7, ඇල්බට් චන්ද්‍රවංකයේ අංක 23 හි පිහිටි රජයේ සංගීත විද්‍යාලයේ විදුහල්පති වෙත ලේඛණගත තැපැලෙන් එවිය යුතුය.

1. **සුදුසුකම්.**—

(අ) 1969.5.25 වැනි දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 16ට වැඩි විය යුතු අතර අවුරුදු 25 ට නො වැඩි විය යුතුය.

(ආ) අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සිංහල භාෂාව හා සිංහල සාහිත්‍යය යන විෂයයන් අතුරින් එකකින්වත් සාමාර්ථයයක් ලබා සිටිය යුතුය. (මේ සුදුසුකම් ඇතිව බඳවා ගනු ලබන අයැදුම්කරුවන් විද්‍යාලයයේ සංගීතය පිළිබඳ අන්තර් මධ්‍යම විභාගයට පෙනී සිටීමට පෙර අංක ගණිතය හා භාෂාව ඇතුළුව විෂයයන් සයකින් අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත් විය යුතුය. ඒ අවශ්‍යතාවය සපුරාලිය නො හැකි අය විද්‍යාලයෙන් බැහැර කරනු ලැබේ.

(ඉ) යටත් පිරිසෙයින් අ. පො. ස. (සා. පෙ.) විභාගයේ සංගීත විෂයයෙන් හෝ ලංකා ගාන්ධර්ව සභාවේ/රජයේ පෙරදිග සංගීත විභාගයේ ප්‍රාරම්භ සංගීත පරීක්ෂණයෙන් හෝ සාමාර්ථයක් ලබා සිටිය යුතුය.

(ඊ) චරිත සහතික දෙකක් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය. (මෙයින් එකක් ප්‍රදේශයේ ග්‍රාම සේවකයෙගෙන් විය යුතුය.)

2. **ප්‍රවේශ පරීක්ෂණය.**—

(අ) **ලිඛිත පරීක්ෂණය.**—අ. පො. ස. (සා. පෙ.) විභාගයේ නිර්දේශ පත්‍රයේ තත්ත්වය අනුව පැය තුනක ප්‍රශ්න පත්‍රයක්.

(ආ) **ප්‍රායෝගික පරීක්ෂණය.**—අ. පො. ස. (සා. පෙ.) සංගීත විභාගයේ මට්ටමේ පරීක්ෂණයක්. (ප්‍රායෝගික පරීක්ෂණය, ගායනය, ස්වර වාද්‍ය හා තාල වාද්‍ය යන කොටස් තුනකින් යුක්තය. අයදුම්කරුවන් මෙයින් එක් පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතුය. තාල වාදනය සඳහා අ. පො. ස. (සා. පෙ.) නිර්දේශයේ දැක්වෙන තාල නියමිතය.)

3. මෙම විද්‍යාලයේ ඉගෙනුම සඳහා ගාස්තුවක් අය කරනු නො ලැබේ.

4. නියමිත දිනට පසුව ලැබෙන අයැදුම් පත් භාර ගනු නො ලැබේ. අසත්‍ය කරුණු ඇතුළත් කර ඇති බව ඔප්පු වුවහොත් ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරන බවත්, විද්‍යාලයට ඇතුළත් කරගත් පසුව වුවද නෙරපා හරිනු ලබන බවත් සැළකිය යුතුය.

වී. ජී. බී. මුණසිංහ,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ (කොළඹ දකුණ).

1969 මැයි මස 5 වැනි දින,
කොළඹ 7, ග්‍රීන්පාත් හි
අධ්‍යාපන කාර්යාලයයේදී ය.

### ආකෘති පත්‍රය

## රජයේ සංගීත විද්‍යාලයට ඇතුළත්වීමේ අයැදුම් පත්‍රය—1969/70 අධ්‍යයන වර්ෂය

(1) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය :————.

(4) 1969 මැයි 25 දිනට වයස :—අවු :——, මාස :——, දින :——.

(5) ඉල්ලුම්කරුගේ පියාගේ/මවගේ/භාරකරුගේ නම :————.

(6) ඔහුගේ/ඇගේ ලිපිනය :————.

(7) ඔහුගේ/ඇගේ රක්ෂාව :————.

(8) ඉල්ලුම්කරුගේ ජාතිය :————.

(9) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(10) අධ්‍යාපන සුදුසුකම් :————.

(11) අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සිංහල භාෂාව, සිංහල සාහිත්‍යය යන විෂයයන්ගෙන් සමත් වූ වර්ෂය :————.

(12) සංගීත සුදුසුකම් :————.

(13) හැදෑරීමට බලාපොරොත්තු වන විෂයයන් :—
(ගායනය/ස්වර වාද්‍ය/තාල වාද්‍ය)

(14) චරිත සහතික ලබාගත් අයගේ නම් හා තත්ත්වය :—
(i) :————.
(ii) :————.

(15) අයැදුම්කරු රැකියාවක යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

සැ. යු.—

වයස අවුරුදු 18 ට අඩු සෑම අයැදුම්කරුවකු විසින්ම පහත දැක්වෙන සහතිකය තමාගේ පියා/මව/භාරකරු ලවා සහතික කර ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය.

ඉහත සඳහන්............ගේ පියා/මව/භාරකරු............වන මම අයදුම්කරු ඉහතින් සපයා ඇති විස්තර සත්‍ය බවත්, ඔහු/ඇ රජයේ සංගීත විද්‍යාලයට ඇතුළත්වී සංගීතය ඉගෙනුම හැදෑරීමට මගේ විරුද්ධත්වයක් නැති බවත් මෙයින් ප්‍රකාශ කරමි.

අත්සන.
පියා/මව/භාරකරු.

නම :————.

දිනය :————.

ලිපිනය :

..................
..................
..................

5-338—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයට ඇතුළත්වීම— 1969/70 අධ්‍යයන වර්ෂය

මෙම විද්‍යාලයේ 1969/70 අධ්‍යයන වර්ෂයෙන් ආරම්භවන පස් අවුරුදු පාඨමාලාව හැදෑරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයැදුම්පත් භාරගනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රය අනුව සකස් කරනලද අයැදුම් පත් 1969 මැයි මස 25 වැනි දිනට ප්‍රථම කොළඹ 7, ඇල්බට් චන්ද්‍රවංකයේ අංක 21 හි පිහිටි රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ විදුහල්පති වෙත ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය. තමන් හැදෑරීමට බලාපොරොත්තු වන්නේ උඩරට හෝ පහතරට නැටුම් ද යන වග ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කළ යුතුයි.

1. **සුදුසුකම්.—**

(අ) 1969.5.25 වැනි දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 16ට වැඩි විය යුතු අතර අවුරුදු 25 ට නො වැඩි විය යුතුය.

(ආ) අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සිංහල භාෂාව හා සිංහල සාහිත්‍යය යන විෂයයන් අතුරින් එකකින්වත් සාමාර්ථය යක් ලබා සිටිය යුතුය. (මේ සුදුසුකම් ඇතිව බඳවා ගනු ලබන අයැදුම්කරුවන් විද්‍යාලයේ නැටුම් පිළිබඳ අන්තර් මධ්‍යම විභාගයට පෙනී සිටීමට පෙර අංක ගණිතය හා භාෂාව ඇතුළුව විෂයයන් සයකින් අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත් විය යුතුය. ඒ අවශ්‍යතාවය සපුරාලිය නො හැකි අය විද්‍යාලයෙන් බැහැර කරනු ලැබේ.

(ඉ) යටත් පිරිසෙයින් ලංකා ගාන්ධර්ව සභාවේ/රජයේ උඩරට නැටුම් විභාගයේ ප්‍රාරම්භ පරීක්ෂණයෙන් සාමාර්ථයක් හෝ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතනයක අවුරුදු දෙකක උඩරට හෝ පහතරට නැටුම් පිළිබඳ පුහුණුවක් හෝ ලබා සිටිය යුතුය. (කලායතන පුහුණුව පමණක් ඇතිව ඉල්ලුම් කරන අය අවුරුදු දෙකක පුහුණුවක් ලත් බවට කලායතනයාධිපතිගෙන් සහතිකයක් අයැදුම් පත්‍රයට ඇමිණිය යුතුය.)

(ඊ) චරිත සහතික දෙකක් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය. (මෙයින් එකක් ප්‍රදේශයේ ග්‍රාම සේවකයගෙන් විය යුතුය.)

2. **ප්‍රවේශ පරීක්ෂණය.—**

(අ) **ලිඛිත පරීක්ෂණය.**—උඩරට හෝ පහතරට නැටුම් පිළිබඳ පැය තුනක ප්‍රශ්න පත්‍රයක්.

(i) උඩරට හෝ පහතරට දන්ඩි කඳේ මුල් සරඹ හය.

(ii) තනිතිත, දෙතිත හා තුන්තිතට අයත් බෙර මාත්‍ර, කස්තිරම් හා අඩව්.

(iii) වන්නම් හෝ සිංදු වන්නම් සයක්.

(iv) උඩරට හෝ පහතරට බෙර වාදනයට අයත් මුල් බෙර හරඹ හය.

(ආ) **ප්‍රායෝගික පරීක්ෂණය.**—ලිඛිත පරීක්ෂණය යටතේ දැක්වෙන නැටුම්, ගායන හා වාදන.

3. අයදුම්කරුවකුට පහත සඳහන් විෂයයන් දෙකකින් එකක් හැදෑරිය හැකිය :—

(අ) උඩරට නැටුම් විෂයය : නැටුම්, වාදනය හා ගායනය.

(ආ) පහතරට නැටුම් විෂයය : නැටුම්, වාදනය හා ගායනය.

4. මෙම විද්‍යාලයේ ඉගෙනුම සඳහා ගාස්තුවක් අයකරනු නොලැබේ.

5. නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් භාරගනු නොලැබේ. අසත්‍ය කරුණු ඇතුළත් කර ඇති බව ඔප්පු වුවහොත් ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරන බවත්, විද්‍යාලයට ඇතුළත් කරගත් පසුව වුවද නෙරපා හරිනු ලබන බවත් සැලකිය යුතුයි.

වී. ජී. බී. මුණසිංහ,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ (කොළඹ දකුණ).

1969 මැයි මස 5 වැනි දින,
කොළඹ 7, ශ්‍රීත්පාත්හි
අධ්‍යාපන කාර්යාලයේ දී ය.

**ආකෘති පත්‍රය**

### රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයට ඇතුළත්වීමේ අයදුම් පත්‍රය—1969/1970 අධ්‍යයන වර්ෂය

(1) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය :————.

(4) 1969 මැයි 25 දිනට වයස :— අවු :———, මාස :———, දින :———.

(5) ඉල්ලුම්කරුගේ පියාගේ/මවගේ/භාරකරුගේ නම :————.

(6) ඔහුගේ/ඇගේ ලිපිනය :————.

(7) ඔහුගේ/ඇගේ රක්ෂාව :————.

(8) ඉල්ලුම්කරුගේ ජාතිය :————.

(9) ඉල්ලුම්කරුගේ ස්ත්‍රී පුරුෂ භාවය :————.

(10) අධ්‍යාපන සුදුසුකම් :————.

(11) අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සිංහල භාෂාව, සිංහල සාහිත්‍යය යන විෂයයන්ගෙන් සමත් වූ වර්ෂය :————.

(12) නැටුම් පිළිබඳ සුදුසුකම් :————.

(13) හැදෑරීමට බලාපොරොත්තු වන විෂයයන් :—
(උඩරට හෝ පහතරට නැටුම්)

(14) චරිත සහතික ලබාගත් අයගේ නම් හා තත්ත්වය :—
(i) :————.
(ii) :————.

(15) අයැදුම්කරු රැකියාවක යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සැ. යු. :—

වයස අවුරුදු 18 ට අඩු සෑම අයැදුම්කරුවකු විසින්ම පහත දැක්වෙන සහතිකය තමාගේ පියා/මව/භාරකරු ලවා සහතික කර ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය.

ඉහත සඳහන්...........ගේ පියා/මව/භාරකරු...........වන මම අයදුම්කරු ඉහතින් සපයා ඇති විස්තර සත්‍ය බවත්, ඔහු/ඇ රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයට ඇතුළත්වී ඉගෙනුම ගැන මගේ විරුද්ධත්වයක් නැති බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
අත්සන.
පියා/මව/භාරකරු.

නම :————.

දිනය :————.

ලිපිනය :

................

................

................

5–337—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 1.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1969.10.1 සිට 1970.9.30 තෙක් මෙරට කොට්ට පුළුන් සැපයීම | 1969.6.17 |
| 2. 1969.10.1 සිට 1970.9.30 තෙක් කපු රෙදි කඩ සැපයීම | 1969.6.17 |
| 3. ලෝහ ඔප ද්‍රව්‍ය සැපයීම ... | 1969.6.24 |
| 4. මෘදු වානේ බෝල්ට් ඇණ හා මුරිච්චි ආදිය සැපයීම | 1969.6.24 |

ලෝහ ඔප ද්‍රව්‍ය සැපයීම් සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බුලර්ස් පාරේ අංක 363 දරණ "විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන්" තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවා ගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් ස්වකීය ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969.5.15 දින,
කොළඹ දීය.

5–507—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ, 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය තැ. පෙ. 500, කොළඹ 1) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1969.10.1 සිට 1970.9.30 තෙක්, සිමෙන්ති කොන්ක්‍රීට් පයිප්ප සැපයීම ... ... | 1969.6.17 |
| 2. 1969.10.1 සිට 1970.9.30 තෙක්, ඇස්බෙස්ටෝස් තහඩු ආදිය සැපයීම ... ... | 1969.6.17 |

ඉහත සඳහන් සැපයීම් සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බුලර්ස් පාරේ අංක 363 දරණ "විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන්" තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවා ගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් ස්වකීය ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 මැයි මස 15 දින,
කොළඹ දීය.

–506—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

1969 ඔක්තෝබර් මස 1 දින සිට 1970 සැප්තැම්බර් මස 30 දින දක්වා වූ කාලසීමාව තුළ පහත සඳහන් සැපයීම්/සේවාවන් සඳහා, කොළඹ 2, තැ. පෙ. 594, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියේ දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 තෙක්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| I<br>සැපයීම/සේවය | II<br>ටෙන්ඩර් විවෘත කරන දිනය | III<br>ටෙන්ඩර් ආකෘති නිකුත් කරන අවසාන දිනය |
|---|---|---|
| (1) කටුනායක පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරට එළවළු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිශ්පාදන සැපයීම ... ... | 69.6. 5 ... | 69.6. 4 |
| (2) කටුනායක පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරට මස් සැපයීම | 69.6. 5 ... | 69.6. 4 |
| (3) කටුනායක පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරට ස්වදේශීය උදෑසන ආහාර සැපයීම ... | 69.6.10 ... | 69.6. 9 |
| (4) දියතලාව පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරට පාන් සහ ස්වදේශීය උදෑසන ආහාර සැපයීම ... | 69.6.10 ... | 69.6. 9 |
| (5) කොළඹ සහ කටුනායක පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරුවලට නිළ ඇඳුම් සහ බැරැක්ක රෙදිපිළි ඇපිල්ලීම ... | 69.6.11 ... | 69.6.10 |
| (6) කටුනායක පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා රෝහලට මාතෘ නිවාස රෙදිපිළි ඇපිල්ලීම ... | 69.6.11 ... | 69.6.10 |
| (7) කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරුවලට මෙට්ට, කොට්ට සහ කුෂන් නැවත සකස් කිරීම... | 69.6.12 ... | 69.6.11 |
| (8) කොළඹ, කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරුවලට නිළ ඇඳුම්, ඇතිරිලි සහ කුඩාරම් නැවත පිළියෙළ කිරීම ... | 69.6.12 ... | 69.6.11 |
| (9) කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරුවලට පාවහන් අලුත්වැඩියා කිරීම ... ... | 69.6.12 ... | 69.6.11 |

2. ටෙන්ඩර් ආකෘති ලබා ගැනීම පිණිස, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරයක් සඳහා නැවත ලබාගත හැකි රු. 75 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. ඉහත සඳහන් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියෙහි III වැනි තීරයේ දක්වා ඇති දිනයන්හි මධ්‍යාහ්නයේ 12 තෙක් ටෙන්ඩර් ආකෘති නිකුත් කෙරේ.

3. වැඩි විස්තර, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැකි ය.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

5–335—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පාවිච්චි කරන ලද ගර්ජිත ඇන්ජින් විකිණීම—අපහරණ අංගනය වේරහැර

වේරහැර බොරලැස්ගමුවේ, ලංගම අපහරණ අංගනයේ තිබෙන පාවිච්චි කරන ලද ගර්ජිත ඇන්ජින් මිලට ගෙන හැරගෙන යෑම සඳහා එවනු ලබන ටෙන්ඩර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

බෙඩ්ෆඩ්, පර්කින්ස්, ගයි, ඒ.ඊ.සී., ලේලන්ඩ්, ඉන්ටනැෂනල්, ගාර්ඩිනර්, ඩොජ්, කොමර්, ෆෝඩ් වී8, කොමර්ෂල්, මොරිස් කොමර්ෂල්, ෂැවර්ලේ යනාදි වර්ගවල ඇන්ජින් මේ තොගයට අයත් වේ.

ටෙන්ඩර භාර ගැනීමට නියමිත අවසාන දිනයට පෙර දින දහවල් 12 වන තෙක් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ පිහිටි ප්‍රධාන සම්පාදක නිලධාරිතැනගේ කාර්යාලයෙන් ලබගත හැකි ටෙන්ඩර පෝර්මය පිටපත් දෙකකින් යුක්තකොට මුද්‍රා තබා එවිය යුතුයි. ටෙන්ඩර පෝර්ම නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයෙහි පිහිටි ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත ටෙන්ඩර තැන්පත් මුදල වශයෙන් මුදලින් රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

1969.6.5 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරනු ලැබේ.

සාමාන්‍ය වැඩ කරන වේලාවන් තුළ වේරහැර අපහරණ අංගනයේදී මෙම ඇන්ජින් පරීක්ෂා කළ හැකිය.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුළ පාර,
කොළඹ 5.

5–416—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අනුරාධපුර උප කොටස

උතුරු මැද පළාතේ අනුරාධපුර උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා අනුරාධපුර උතුරු මැද කොට්ඨාශයේ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 ජූනි මස 2 වෙනි සඳුදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ:—

| වැඩ විස්තරය | ලියාපදිංචි මුදල රු. | ටෙන්ඩර් ඇප රු. |
|---|---|---|
| 1. මහවිලච්චිය වම් ඇලේ පාරේ සැ. 0–සැ. 3 දක්වා අඟල් 2 සහ ¾″ කළු ගල් සපයා පයිල් කිරීම ... ... | 54,000 ... | 100 |
| 2. මහවිලච්චිය දකුණු ඉවුරේ මහ ඇලේ පාරේ සැ. 0, දම්වැල් 24 සිට සැ. 1, දම්වැල් 11 දක්වාද, පේමඩුව හන්දිය සිට මහවිලච්චිය දකුණු ඉවුරේ ඇල සම්බන්ධ කරන පාරේ සැ. 1, දම්වැල් 11 ක් ද සහ දකුණු ඉවුරේ ඇලට ලඟා වන පාරේ සැ. 1, දම්වැල් 11 සිට සැ. 4, දම්වැල් 32 දක්වාද අඟල් 2″ සහ ¾″ කළු ගල් සපයා පයිල් කිරීම ... | 51,000 ... | 100 |
| 3. මහවිලච්චියේ දකුණු ඉවුරේ මහ ඇල පාරේ සැ. 4, දම්වැල් 32 සිට සැ. 7, දම්වැල් 32 සැ. 3 දක්වා අඟල් 2 සහ ¾″ කළු ගල් සපයා පයිල් කිරීම ... ... | 54,000 ... | 10 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන්වලට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1969 මැයි මස 28 වෙනි දින දහවල් 12 දක්වා කාර්යාල වේලාවන් තුළදී අනුරාධපුර/මහකනදරාව/පදවිය/රාජාංගනය යන වාරිමාර්ග කාර්යාල වලින් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්මවල පමණක් ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර මෙම වැඩ සඳහා ඉහත සඳහන් ටෙන්ඩර් ඇප මුදල් ඉහත සඳහන් කාර්යාලවල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩය සඳහා සියළුම විස්තර සැලසුම් ආදිය කාර්යාල වේලාවන් තුලදී අනුරාධපුර වාරිමාර්ග කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩබ්ලිව්. එස්. සහාරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරුතැන,
අනුරාධපුර උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
අනුරාධපුරය,
1969 අප්‍රේල් මස 28 වැනි දින.

5–333—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—යාපනය උප කොටස

යාපනය උප කොටසේ මෙහි පහත සඳහන් වැඩ සඳහා වවුනියාවේ උතුරු ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 ජූනි මස 2 වැනි දින පෙරවරු 10. තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ:—

| වැඩෙහි විස්තර | ලියාපදිංචි ගණන රු. | ඇප තැන්පත් මුදල රු. |
|---|---|---|
| 1. අම්බලපෙරුමාල් කුලමේ දකුණු ඇලේ අංක 10 සිට 17 දක්වා අතුරු ඇලවල් ඉදි කිරීම ... ... | 34,000 ... | 50 |
| 2. තිරුවයි ආරු ආරෝහණ වාරිමාර්ග ව්‍යාපාරයේ පාරට ග්‍රැවල් ඇතිරීම ... | 25,000 ... | 25 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන්වලට ලියාපදිංචි සමුපකාර සමිතිය සහ ග්‍රාම සංවර්ධන සමිතිද ටෙන්ඩර් කිරීමට සුදුස්සෝ වෙති.

3. ඉහත සඳහන් වැඩ සඳහා මෙහි පහත සඳහන් වාරිමාර්ග කායර්‍යාලවල කායර්‍යාල වේලාවන් තුළ ටෙන්ඩර් කිරීමට උවමනා හිස් ටෙන්ඩර් පෝරමද 1969 මැයි මස 28 වෙනි දින පස්වරු 3. තෙක් ලබා ගත හැක. ටෙන්ඩර් කිරීමට ඉදිරිපත් වන අය ඔවුන් විසින් දැනට මෙම දෙපාර්තමේන්තුවේ තමන් විසින් කරන්නට ඇති වැඩ ගැන විස්තරත් තමන්ගේ ලියාපදිංචි කරණ ලද පොතත් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. මෙය ඉදිරිපත් කිරීමෙන් වාරිමාර්ග ඉංජිනේරු තුමාට ටෙන්ඩර් අනුමත කිරීමට ප්‍රයෝජනවත් වේ: ඉහත සඳහන් හිස් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ඉහත සඳහන් කළ පරිදි මෙහි පහත සඳහන් ඕනෑම වාරිමාර්ග කායර්‍යාලයක, මුදල් තැන්පත් කර කුවිතාන්සියක් මෙම කායර්‍යාලයට ඉදිරිපත් කිරීමද සෑහේ. එසේ නොහොත් ඕනෑම කච්චේරියක හෝ මුදල් ගෙවා එයට අදාල කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමද ප්‍රමාණවත් වේ.

4. මේ සඳහා අවශ්‍ය විස්තරත් කිලිනොච්චියේ පිහිටි වාරිමාර්ග කාර්යාලයේ කායර්‍යාල වේලාවන් තුළ ලබා ගත හැක. යාපනය/මන්නාර්/වවුනියාව/මුල්ලතිවු/වවුනිකුලම්.

එස්. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු,
යාපනය උප කොටස.

1969 අප්‍රේල් මය 22 වැනි දින,
කිලිනොච්චියේ දී ය.

5–334—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ගම්පහ උප කොටස

ගම්පහ උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් 1969 ජූනි 2 වෙනි සඳුදා දහවල් 11 දක්වා ජාවත්ත පාරේ කොළඹ 5 බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩ ඉදිරියෙන් දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන් වලට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට, සමූපකාර සමිතිවලට හා ග්‍රාමසංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

(1) අලුත් ඇල ගල්වාන අමුණ ඉදිකිරීම, රු. 50,000. ටෙන්ඩර් තැන්පත්—රු. 75.

(2) අස්වැද්දුම අමුණ ඉදිකිරීම, රු. 30,000 ටෙන්ඩර් තැන්පත්—රු. 50.

3. 1969 මැයි මස 15 වෙනි දින සිට 1969 මැයි 30 වෙනි දින දහවල් 12 දක්වා කාර්යාලීය වේලාවන් තුලදී ගම්පහ/රත්නපුර/කළුතර/කොළඹ වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාල වලින් ලබා ගතහැකි ටෙන්ඩර් පෝරමවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කල යුතුයි. ටෙන්ඩර් පෝරම සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ ඔවුන් දැනට කරණ වැඩ හා ඒවායේ වටිනාකම් දැක්වෙන ප්‍රකාශණයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි.

4. තවද ටෙන්ඩර් අකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර එක් එක් ටෙන්ඩරය වෙනුවෙන් වැඩය ඉදිරියෙන් දක්වා ඇති අයුරු ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් කාර්යාලවල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත්කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුයි.

5. මෙම ටෙන්ඩර් ගැන වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුලදී ගම්පහ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ජෝ. පරමදාස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන, ගම්පහ උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
ගම්පහ, 1969.5.5.

5-386—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ප්‍රදර්ශන වර්ගයේ කෘමි නිදර්ශක පෙට්ටි 400ක් සැපයීම සඳහා කොළඹ—7, හෝටන් පෙදෙසේ අංක 9, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ව්‍යාප්ති අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 ජූනි මස 4 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර, පූර්වෝක්ත 1 ඡේදයෙහි සඳහන්වන දිනයෙහි එකී වේලාවට කොළඹ—7, හෝටන් පෙදෙසේ අංක 9, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) ගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

3. ටෙන්ඩර් කොළඹ—7, හෝටන් පෙදෙසේ අංක 9, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂකගෙන් (ව්‍යාප්ති) 1969 ජූනි මස 4 වැනි දින පෙරවරු 10 තෙක් ඉල්ලුම්කොට ලබාගත හැකි ඉල්ලුම් පත්‍ර පෝර්මවල ලියා ඉදිරිපත් කළ යුතුය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්තවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ ප්‍රදර්ශන වර්ගයේ කෘමි නිදර්ශක පෙට්ටි 400ක් සැපයීම සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් පත්‍රය යි යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියා පදිංචි තැපැල් මගින්ද, ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මේ අයුරින් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩරය මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයෙකු මගින් හෝ ටෙන්ඩර් පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දැන්වීමට බලය දී සිටින කොළඹ—7, හෝටන් පෙදෙසේ අංක 9, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පරිපාලන නිළධාරි (ව්‍යාප්ති) වෙත භාරදීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන් වූ විස්තරද ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය.)

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පළමුව ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 50ක් කොළඹ යෝක් වීදියේ, ලංකා බැංකු ශාඛාවෙහි, කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරණ ගිණුමට බැරකර හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ නාමට ඕනෑම දිසාපති කාර්යාලයක හෝ තැන්පත් කර, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. කොළඹ 7, හෝටන් පෙදෙසේ අංක 9, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ව්‍යාප්ති අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩිපුර විස්තර හා කොන්දේසිද දැනගත හැකිය.

ඊ. එල්. එෆ්. අබේරත්න,
කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති).

1969 මැයි මස 6 වැනි දින.

5-419—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනය කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වෙනිද සිට 1970 සැප්තැම්බර් 30 වෙනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර යාපනයේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරග නු ලැබේ.

2. **(i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ එවා එවැනි ඉල්ලුම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය, පැහැදිලිව සඳහන් කළ යුතුය.

**(ii) ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වව්නියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ දී ටෙන්ඩර්පත්‍ර අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත සඳහන් දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීමට හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් පත්‍ර එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, යාපනය'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙලවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන් ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ලේකම් තැනට භාරදෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හිදී පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි සී '' උප ලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් නම් ඒවා පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩරකරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුල ඉඩකඩ සළසා දෙනු නො ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගතයුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිල යටතේ හෝ නොමිළයේ හෝ *1966.12.19* දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලය,
යාපනය, 1969 මැයි මස 3 වැනි දින,

ඇස්. රාසරත්නම්,
සෞඛ්‍ය සේවා අධිකාරී, යාපනය.

## උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | |
| ආයතනය | තැන්පත් මුදල රුපියල් | ඇප මුදල රුපියල් | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | සේවකයන්ට | | | රෝගීන්ට | | |
| | | | | මාළු | කරවල | එළවළු | මාළු | කරවල | එළවළු |
| ඩෙල්ෆ්ට් ර.රෝ. | 100 | 800 | | 400 | 200 | 900 | 800 | 400 | 1,500 |
| පුංගුඩුතිව් ර.රෝ. | 100 | 600 | | 400 | 800 | 1,600 | 400 | 800 | 1,700 |
| පල්ලෙයි ප. ඒ. | 100 | 600 | | 500 | 1,000 | 2,000 | 700 | 1,300 | 2,700 |
| චන්කානෙයි ප. ඒ. | 100 | 600 | | 800 | 400 | 1,800 | 1,300 | 700 | 2,700 |
| කෝපායි ප. ඒ. | 100 | 600 | | 300 | 600 | 1,300 | 1,000 | 1,800 | 3,800 |
| පුනාකරී ප. ඒ. | 100 | 600 | | 400 | 800 | 1,600 | 600 | 1,100 | 2,400 |
| පත්ධතෙරෙප්පූ ග්‍රා. රෝ. | 100 | 400 | 1969.6.11 | 300 | 600 | 1,200 | 400 | 800 | 1,600 |
| වඩ්ඩුකොඩ්ඩෙයි ග්‍රා.රෝ. | 100 | 800 | | 400 | 700 | 1,500 | 1,500 | 3,000 | 6,000 |
| වෙම්පියන්පත්තු ග්‍රා. රෝ. | 100 | 600 | | 300 | 600 | 1,200 | 500 | 1,200 | 2,200 |
| අච්චුවෙලි ග්‍රා. රෝ. | 100 | 600 | | 600 | 700 | 1,800 | 700 | 1,300 | 2,600 |
| මල්ලාවි ප. ඒ. | 100 | 600 | | 300 | 600 | 1,100 | 500 | 1,100 | 2,200 |
| නාගදීප ප.ඒ. | 100 | 600 | | 500 | 900 | 1,900 | 400 | 900 | 1,700 |

5-383—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය, රත්මලාන

### ග්‍රාමීය පාරවල් හා පාලම් සෑදීමේ උපකරණ හා ග්‍රාමීය ජලසම්පාදන ක්‍රම සඳහා නිර්මාණ උපකරණ සැපයීම හා ගෙනැවිත් දීම

පහත සඳහන් අයිටමයන් සැපයීමට හා ගෙනැවිත් දීම සඳහා කොළඹ, යෝර්ක් වීදියේ, 75 1/1, හේමාස් ගොඩනැගිල්ලේ පිහිටි පළාත් පාලන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් 1969 ජූනි මස 27 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීමට නියමිත එදිනම, පස්වරු 2.35 ට ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

(අ) **ග්‍රාමීය මාර්ග හා පාලම් නිර්මාණ උපකරණ**

(1) ගල් රෝල්—ටොන් 4-6
(2) මෝටර් ග්‍රේඩර
(3) ලොරි—ටොන් 5
(4) ජීප්
(5) ඩම්පර්
(6) ටිපිං ලොරි
(7) විදුලි උපකරණ
(8) පයිල් ඩ්‍රයිවිං උපකරණ
(9) වා සම්පීඩනය
(10) ක්‍රේන්
(11) ජල පොම්ප
(12) කොන්ක්‍රීට් පරීක්ෂණ යන්ත්‍රය
(13) ප්‍රත්‍යාබල ජැක්කුව හා අමතර කොටස්
(14) කොන්ක්‍රීට් වයිබ්රේටර්
(15) පස් පරීක්ෂණ රසායනාගාර උපකරණ
(16) පස් රෝටරි මිශ්‍රකය.

(ආ) **ග්‍රාමීය ජලසම්පාදන ක්‍රම සඳහා නිර්මාණ උපකරණ**

(1) අඩි 300 පමණ ගැඹුරක් දක්වා සෑදීමට හැකි 6" හා 8" කොපු සහිත ගැඹුරු ළිං කැණුම් යන්ත්‍ර.
(2) 6" හා 8" විෂ්කම්භයකින් යුත්, මට්ටම් කරන ලද ඉස්කුරුප්පු සහිත අඩි 10 වානේ කොපු.

දෙපාර්තමේන්තුවේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දැන්විය යුතුයි.

5. කැමතිනම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාන් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කොට සති තුනක් ගතවනතුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූ ද, පිළිගනු ලැබුවාවූද, දේවල මුළු ගණනින් සියයට පහක (5%) ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත්, පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිම වූ විට පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවාද ඇත.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

12. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේත් කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා සතුය.

13. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් මෙම කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවගීයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විදියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙව්වු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කළාසේ සළකනු ලැබේ.

15. 1931 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දැක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේ ය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛණයේ තනි නමව හෝ ලේඛණයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමඟ හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර බතලගොඩ/වාරියපොළ රජයේ ගොවිපලවල කළමනාකරුවන්ගෙන් දැනගත හැකිය.

ජී. ටී. ජිනෝන් ද්‍රදස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1969 අප්‍රේල් මස 29 වන දින,
පේරාදෙණියේ දී ය.

5–378—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍යය ලබා ගැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1969.6.10 වැනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ :—

**පැල කිරීමට සුදුසු ඉතා හොඳින් පැසුණු වල් අඹ හෝ කොහු අඹ ගෙඩි 25,000 ක්**

2. සඳහන් අඹ ගෙඩි ගණන දෙවරකට හෝ තුන්වරකට මෙම අඹ වාරය තුල කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයට ගෙනවිත් භාර දිය යුතුයි. හොඳින් පැසී ඇති පැල කිරීමට සුදුසු අඹ පමණක් එහිදී තෝරා භාර ගනු ලැබේ. පැල කිරීමට නුසුදුසු ප්‍රතික්ෂේප කරන ලද අඹ සඳහා කිසිම ගෙවීමක් කරනු නොලැබේ.

3. කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයීය කාර්යාලයෙන් ටෙන්ඩර් අයදුම් පත් ලබා ගෙන ටෙන්ඩර් පත්‍රයෙහි (පෝර්ම) ඔබගේ අඩුම මිළ ගණන සඳහන් කර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා මුද්‍රාකර "ඇට ගැණීමට අඹ සැපයීම" යන්න ලියුම් කවරයේ වම් කෙළවරේ සඳහන් කර සභාපති, කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලය, කුණ්ඩසාලේ, යන ලිපිනයට ලේඛන ගත තැපැලෙන් එවිය යුතුයි.

4. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් මණ්ඩලය, කුණ්ඩසාලේ, යන ලිපිනයට ලේඛනගත පත්‍රයක් වෙනුවෙන් රු. 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නැතහොත් කොළඹ යෝක් වීදියේ, ලංකා බැංකු ශාඛාවේ අංක 37 දරන කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුමට කළ හැකිය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන්නේ නම්, බැංකුව විසින් සපයනු ලබන පොදු ආකෘති පත්‍ර 118 පෝර්මය සම්පූර්ණ කර බැංකුවට ඉදිරිපත් කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිලිගත් බව දන්වා දින 7 ක් ඇතුලතදී අවශ්‍ය ඇප තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවුව හොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක වෙනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඇතුලත් වන්නටද ඉඩ තිබේ.

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපැලෙන් නොඑවුවහොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් ඉහතකී ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට ඒවා අතින්ම භාර දියයුතුයි. ටෙන්ඩර් බහාලන ලද කවරයෙහි "ඇට ගැනීමට අඹ සැපයීම" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ලියාපදිංචි කරන ලද තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණහොත් ඔහු කුණ්ඩසාලේ ඉහත කී ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

6. ටෙන්ඩර්කරුවනට උවමනා නම් ඔවුන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයෙකුට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී එනම්, 1969.6.10 වැනි දින පස්වරු 2.30 ට ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේදී යටකී වේලාවේදී කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයීය කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

7. නියමිත අයදුම් පත්‍රයේ (ෆෝර්මයේ) ලියා නැති, නැතහොත් එකී නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනස් කිරීමක් කළහොත්, ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුයි.

8. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිලිගනු ලැබුවාවූද අඹ සැපයීම සඳහා වැයවන මුලු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ මේ කොන්ත්‍රාත්තු නිසි පරිදි ඉටුකර නිම වූ විට පමණි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයටද ඇතුලත් වෙනවා ඇත.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3 කට වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

12. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම දුන්නා ලෙස සලකනු ලැබේ.

13. වර්ෂ 1934 හි 19 අංක දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලේඛනයට තනි තනිව හෝ ඒ ලේඛනයේ නම් සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුලත්ව හෝ තමාට සෑහේ යයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විරුද්ධවන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. වැඩි විස්තර කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ විද්‍යාලයාධිපතිගෙන් දැනගත හැක.

ජී. ඩී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘ. අ. හා ගො.).

1969 මැයි මස 3 වෙනි දින,
පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

5-387—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### පොළොන්නරුව උප කොට්ඨාශය

1968-69 මුදල් වර්ෂයේ පොළොන්නරුවේ උප කොට්ඨාශයේ බඩු බාගිරාදිය ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර්පත් භාර ගැනීමේ අවසාන දිනය 1969 මැයි මස 19 වෙනි සඳුදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාර ගැනීමේ කාලය දීර්ඝ කළ බව මෙයින් නිවේදනය කරමි.

වා. ඉ., පොළොන්නරුව උ. කො.

5-364—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## දැන්වීමයි

කොළඹ 8, කෝට්ටෙ පාරේ, අංක 325 හි පිහිටි ආයුර්වේද මහා රෝගයශාලාවට පහත සඳහන් ඖෂධ වර්ග විශාල ප්‍රමාණයක් අවශ්‍යවේ. ඒවා ඒ ඒ ප්‍රදේශවලින් සොයාගත හැකි වකවාණුද, ගෙනැවිත් භාරදිය හැකි හෝ දුම්රියෙන් එවිය හැකි මිළ ගණන්ද දන්වන ලෙස මෙයින් ඉල්ලමි :—

1. අරළු ඇටහැර
2. අරුද
3. අගිල්
4. අසෝක පොතු
5. අස්වැන්න
6. බිංකොහොඹ
7. ගීන් එන්සාල් ඇට
8. කටුවැල්බටු
9. කුරුඳු පොතු (ගීන්)
10. කපුකිනිස්ස ඇට
11. කරාබු නැටි
12. කැකිරි ඇට
13. කොල්ලන් කොළ
14. කුඹුරු ඇට
15. කොහොඹ තෙල්
16. මහනෙරෙංචි
17. මී ඉටි
18. මී පැණි
19. මී තෙල්
20. පෝන්ස මුල්
21. රසකිඳ පිටි
22. රත්හඳුන්
23. රෝසමල්
24. සාදික්කා
25. සාරන මුල්
26. සුදු සඳුන්
27. සැවැන්දරා මුල්
28. තිප්පිලි
29. තීරුස්සවාලු අල
30. තිප්පිලි මුල්
31. වදකහ
32. වසාවාසි
33. වඳුරුමෑ ඇට
34. වැල්මී
35. තලතෙල්
36. රත්නිටුල් අල
37. ගිතෙල්
38. අතිවිඩයම්
39. කෑල ඇට
40. ඇත්තෝර ඇට

විමල් නවගමුව,
ආයුර්වේද කොමසාරිස්.

1969. 5. 3.

5-430—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## ටෙන්ඩර් මාර්ගයෙන් ලොරි විකිණීම

### තෝමස් වේඩේඩර් 22 ශ්‍රී 4795 සහ ඉසුසු 24 ශ්‍රී 959, ඉසුසු 22 ශ්‍රී 8257

කොළඹ 5, අංක 106, හැව්ලොක් පාර, ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලයේ සභාපතිතැන විසින් තෝමස් වේඩේඩර් 22 ශ්‍රී 4795, ඉසුසු 24 ශ්‍රී 959 සහ 22 ශ්‍රී 8257 ලොරි විකිණීම සම්බන්ධයෙන් මුද්‍රා තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත් 25. ~~5. 69~~ වෙනි දින උදේ 10 වන තෙක් භාරගනු ලැබේ.

2. එදිනම උදේ 10 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

3. කොළඹ 5, හැව්ලොක් පාර අංක 106 දරණ ස්ථානයේදී ඉහත සඳහන් වාහන කාර්යාල වේලාවලදී උදේ 9 සිට සවස 4.30 දක්වා පරීක්ෂා කිරීමට හැකිවේ. මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්ම වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 500 ක් මෙම කාර්යාලයේ තැන්පත් කළ යුතු අතර 20. 5. 69 දින දක්වා ටෙන්ඩර් පත් ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි අනුව මෙම තැන්පත් මුදල ආපසු ලබාගත හැකිවේ.

4. කොළඹ 5, අංක 106, හැව්ලොක් පාර, ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලයේ සභාපතිතැන වෙත සීල් තැබූ කවරයක ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි.

5. "ලොරි රථ 22 ශ්‍රී 4795, 24 ශ්‍රී 959 හෝ 22 ශ්‍රී 8257 සඳහා ටෙන්ඩරය" යනුවෙන් කවරයේ වම් කෙළවරේ මුදුනේ සඳහන් කළ යුතුයි.

6. ටෙන්ඩරය දින දෙකක් ඇතුළතදී හෝ ටෙන්ඩරය භාරගත් දින සිට දින 7 ක් ඇතුළතදී වාහනය ගෙන යෑමට පෙර සම්පූර්ණ මුදල ගෙවිය යුතුයි.

ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය, සභාපති.
106, හැව්ලොක් පාර, කොළඹ 5.

5-362—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

### මුත්තුර් ජෙටියේ කාර්යාල සහ ගබඩා නිර්මාණය කිරීම

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මුත්තුර් ජැටියේ කාර්යාල සහ ගබඩා නිර්මාණය කිරීම සඳහා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1969 ජූනි මස 5 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් ටෙන්ඩර් පිළිබඳ ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී සහ චීන වරාය ත්‍රිකුණාමලය (? ) — ප්‍රිරුම කඳවුරේ නේවාසික ඉංජිනේරු තැනගේ කාර්යාලයේ දී පරීක්ෂා කළ හැක.

3. ටෙන්ඩර් කොන්දේසි අනුව රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා කොළඹ වරාය කොමසාරිස් තැනගෙන් ලබාගන්නා ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1969 ජූනි මස 4 වැනිදා දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. 1969 ජූනි මස 5 වැනිදා පස්වරු 2.30 ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණිය හැක.

එල්. එස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1969 මැයි 5 දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදීය.

5–381—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය, රත්මලාන

### අම්පාරේ ජලසම්පාදන යෝජනා ක්‍රමය (1 වෙනි පියවර)

අංක 14,845 හා 1969.3.14 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පලවූ ටෙන්ඩර් දැන්වීමට අමතරව ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීමේ දිනය හා ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනයන් පහත සඳහන් අයුරින් දීර්ඝකර ඇත.

(අ) ටෙන්ඩර් ලියකියවිලි 1969 මැයි 25 වැනි දින දහවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

(ආ) ටෙන්ඩර්පත්‍ර වෂී 1969 ජූලි 8 වැනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් විවෘත කිරීමට නියමිත එදිනම පස්වරු 2.35 ට එහි පැමිණ සිටිය හැක.

ආර්. වී. පෙරුමයිනාර්,
වැ. බ. අධ්‍යක්ෂ.

රත්මලාන, 6.5.69.

5–402—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය, රත්මලාන

### හපුතලේ ජලසම්පාදන යෝජනා ක්‍රමය

හපුතලේ ජලසම්පාදන යෝජනා ක්‍රමය එකතු කිරීම් හා වැඩිදියුණු කිරීම් සඳහා එවනු ලබන ටෙන්ඩර්පත්‍ර රත්මලානේ, ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වෂී 1969 ක්වූ ජූලි මස 1 වෙනි අඟහරුවාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර විවෘත කිරීමට නියමිත එදිනම පස්වරු 2.35 ට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැකිය.

2. මේ අංශයේ නිර්මාණ පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතු ආකෘතිපත්‍ර මගින් පිටපත් 2 කින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධවූ සියලු විස්තර හා තොරතුරු ද ඉහතකී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවන අතර මෙයට අදාළ සැලැස්මක් ද ඔහුගේ කායර්‍යාලයේදී බලාගත හැකි වන්නේය.

3. රජයේ දෙපාර්තමේන්තුවල හා සංස්ථාවල රු. 2,00,000 කට හෝ ඊට වැඩි ගණනක වැඩ සඳහා ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන් හා සමාන තත්වයේ සිටින විදේශීය හා දේශීය කොන්ත්‍රාත් කරුවන් ද පමණක් පහත සඳහන් ලියකියවිලි 1969 ජූනි මස 20 වෙනි සිකුරාදා දහවල් 12 ට පෙරාතුව ඉහතකී ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර්පත්‍ර එවීමට සුදුස්සන් වන්නේ ය :—

(අ) ලියාපදිංචිය පිළිබඳ සාක්ෂි, හා

(ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් එකසිය පණහක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය.

4. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලුම් කරන විට මේ හා සමාන වෙනත් වැඩ කර ඇති බවට හා යෝජිත වැඩය භාරගැනීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ඇති නිලධාරීන් තමන්ගේ කායර්‍ය මණ්ඩලයේ සිටින බව ටත්, සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් මෙම කායර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

6. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට හැකි පමණ ඉක්මණින් ඒවා ලබාගන්නා ලෙස ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ආර්. වී. පෙරුමසිනර්,
ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන
වැඩ අංශයේ වැඩ බලන අධ්‍යක්ෂ.

පළාත් පාලන අමාත්‍යාංශයේ,
ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය,
රත්මලාන. 1969 ක්වූ මැයි මස 6 වෙනි දින දීය.

3–403—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තු—යාපනය කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1969 ඔක්තෝබර් 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් 30 වන දයින් (දින දෙකත් ඇතුලුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර්පත්‍ර යාපනය සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර්පත්‍ර.**—ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ බදුල්ල, මඩකලපුව, අනුරාධපුර, කොළඹ, ගාල්ල, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියා යන ස්ථානයන්හි පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලවලින් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කම් විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම්කිරිමේදී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, යාපනය" කියා එවිය, යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ර්පත්මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුනු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස් විය හැක.

6. **ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර්පත් විවෘත කිරීම.**—ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කරගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස්කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය පිළිගත් දින සිට දින 10ක් ඇතුළත මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලිබලය, ජලය ආදී පහසුකම් සැලවුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටු රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

ඇස්. රාසරත්නම්,
සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය

යාපනය සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
1969 මැයි 6 වැනි දිනදීය.

## උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | මසකට රෙදි සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කැලි ගණන සාමාන්‍ය | ටෙන්ඩර් අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | | |
| **විසිල් රෝහල—කන්කසන්තුරේ :** | | | | | |
| 1 වෙනි කොටස—පිරිමි වාට්ටුව (වෛද්‍ය) ගැහැණු වාට්ටු (වෛද්‍ය, බාහිර රෝගීන්ගේ අංශය, ශල්‍ය කර්මාගාරය, ඇක්ස්රේ අංශය, රසායනාගාරය, මාතෘ වාට්ටු, මුළුතැන් ගෙය, දන්ත චිකිත්සාගාරය හා හෙදි නිවාසය, මානසික වාට්ටු (පිරිමි සහ ගැහැණු) | 50 ... | 100 ... | 4 ... | 2,200 | 1969.6.5 පෙරවරු 10 |
| 2 වෙනි කොටස—වාට්ටු අංක 1, (පිරිමි, ක්ෂය රෝග වාට්ටු) ... | 50 ... | 100 ... | 4 ... | 1,200 | |
| **රජයේ රෝහල—යාපනය :** | | | | | |
| 1 වෙනි කොටස—වාට්ටු 1 හා 2 (මාතෘ වාට්ටු) වාට්ටු 11 හා 15 (ළමා වාට්ටු) ... ... ... ... | 50 ... | 100 ... | 15 ... | 23,000 | |
| 2 වෙනි කොටස—වාට්ටු 3 (පිරිමි ශල්‍ය) වාට්ටු 4, 5 හා 6 (ගැහැණු වාට්ටු) | 50 ... | 100 ... | 4 ... | 8,600 | |
| 3 වෙනි කොටස—වාට්ටු 10, 12 හා 14, රෝග නිරෝධායන පරීක්ෂණාගාරය, ඇක්ස්රේ දෙපාර්තමේන්තුව, නේවාසික රෝගීන්ගේ දිස්පැන්සරිය, ලේ බැංකුව, බාහිර රෝගීන්ගේ අංශය, රෙදි කාමරය ... | 50 ... | 100 ... | 4 ... | 12,000 | |
| 4 වෙනි කොටස—ශල්‍ය කර්මාගාරය ... ... | 50 ... | 100 ... | 15 ... | 11,200 | |
| 5 වෙනි කොටස—වාට්ටු 7, 8, 9, 16 පපුරෝග වාට්ටුව ... | 50 ... | 100 ... | 4 ... | 7,100 | |

5–438—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කොළඹ රෝහල් මණ්ඩලය—කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්:**—1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් 30 වැනිදයින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුල, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ, රෝහල් මණ්ඩලයේ අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(1) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලටද තැන්පත් මුදල් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි කල අංකය පැහැදිළිව සඳහන් කළ යුතුය.

(II) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන්ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන් ගෙන්ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාර ගනු නොලැබේ.ටෙන්ඩර් ෆෝපරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා, අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම්, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලිප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛණයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරි'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවටද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි/ලේකම් මහතාට (හෝ මා හට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පෙනෙන උපලේඛනයේ 6 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**— ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ අසල සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින අයදුම්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිත යෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙන් පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(I) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලැස්වුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිළධාරිතුමා තක්සේරු කළ ගණන් වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

**(II) කිළිටි රෙදිවල විෂබීජ නැතිකිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම.**—යම් අවස්ථාවල කිළිටි රෙදි සේදීමට පළමු විෂබීජ නැතිකිරීම සඳහා වෙනම ස්ථානයකට ගෙන යාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙන යැමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

**(III) පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(IV) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

ඒ. නාගේන්ද්‍රන්,
කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරි.

කො.රෝ.ම. අධිකාරි කාර්යාලය,
මහ රෝහල, කොළඹ.
1969.5.6 දින.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍ය | (6) ටෙන්ඩර් භාරගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| (1) උණ රෝහල, අංගොඩ | 100 | 400 | 4 | 3,500 | 1969.6.19 දින පෙරවරු 10ට |
| (2) රෝගෝපසම නිවාසය, තලංගොල්ල, රාගම | 100 | 400 | 3 | 2,750 | |
| (3) පිළිකායතනය, මහරගම, I වැනි කොටස, වාට්ටුව | 100 | 400 | 4 | 3,500 | |
| (4) පිළිකායතනය, මහරගම, II වැනි කොටස, ශල්‍යාගාරය | 100 | 300 | 8 | 1,350 | |
| (5) කොළඹ කාසල් වීදියේ කාන්තා රෝහලේ දෙවෙනි කොටස, ශල්‍යාගාරය | 100 | 300 | 10 | 4,000 | |
| (6) කොළඹ කාසල් වීදියේ කාන්තා රෝහලේ තුන්වැනි කොටස, ළදරු ඒකකය | 100 | 300 | 10 | 9,000 | |
| (7) කොළඹ ද සොයිසා කාන්තා රෝහල, II වැනි කොටස, ශල්‍යාගාරය | 100 | 300 | 10 | 2,500 | |

5–429—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනය කොට්ඨාශය

### 1969–70 ගබඩා බඩු ඇදීම

**සේවය සහ ටැන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයින්.**—මේ කාර්යාලයයෙන් හෝ මෙහි මතු 2 වන ඡෙදයේ සඳහන් කාර්යාලවලින් හෝ ඉල්ලා ලබා ගතයුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි, 69.10.1 වනද සිට 1970.9.30 වනද දක්වා වකවානුව තුළැ දුම්රිය පොළෙන්/පොළවලින් පොළවලට/පොළට, ආයතනවලින්/ආයතනවලට/කාර්යාලයට/කාර්යාල යයෙන් ගබඩා බඩු ඇදීම සඳහා, ලාංකික වූ පුද්ගලයින්ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතනවලිනුත්, සමූපකාර සමිතිවලිනුත්, යාපනය සෞ. සේ අධිකාරි තැන ටැන්ඩර් බාරගනු ඇත.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලීද ඇතුළත් විය යුතුයි.

2. ටැන්ඩර් එවිය යුත්තේ ඊට නියමවූ ආකෘති පත්‍රය මතැයි. රු. 100 ක මුදලක් ළඟැම ඇති කච්චේරියේ යාපනය සෞ. සේ. අධිකාරි නමට තැන්පත් කොටැ එහි ලදුපත ලබාගෙන ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු සඳහා ටැන්ඩර කරු නිසි පරිදි අත්සන් කළ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ඒ ලදුපත සමග ඉදිරිපත් කළ යුතුයි. ටැන්ඩර් පත්‍ර 1969.6.10 වනද දහවල් 12 දක්වා මතු සඳහන් සෞ. සේ. අධිකාරි කාර්යාලවලින් ලබාගත හැකියැ :—

| | | | |
|---|---|---|---|
| අනුරාධපුර | ගාල්ල | කෑගල්ල | පුත්තලම |
| මඩකලපුව | යාපනය | කුරුණෑගල | රත්නපුර |
| බදුල්ල | කලුතර | මාතලේ | වවුනියා |
| කොළඹ | මහනුවර | මාතර | |

නියමිත ආකෘති පත්‍රයේ නොවන කිසිදු ටැන්ඩරයක් සැලකිල්ලට ලක් නොවේ.

3. තමන් දෙපාර්තමේන්තුව සමග කොන්ත්‍රාත්තුවකට බැඳී ඇතත් නැතත් සියලු ටැන්ඩර්කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගතුග සැපයිය යුතුයි. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර ඉහත 2 වන ඡෙදයෙන් කියැවුනු කවර හෝ සෞ. සේ. අධිකාරි කාර්යාලයයෙකින් ලද හැකි වේ.

4. එක් එක් පිටපතේ ටැන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ටැන්ඩර් පත්‍ර '' බඩු ඇදීම සඳහා ටැන්ඩරය '' යනුවෙන් වම්පැත්තේ උඩු කෙළවරේ සලකුණක් තබා යාපනය සෞ. සේ. අධිකාරි වෙත පිට නම් ලියූ කවරයක බහා අස් ඔබා (සීල් තබා) එවිය යුතුයි.

5. ටැන්ඩර් පත්‍ර 1969.6.13 වනද පෙරවරු 10ට පෙර යාපනය සෞ. සේ. අධිකාරි වෙත ලැබෙන සේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපැලෙන් එවිය යුතුය ; නැතහොත් සෞ. සේ. අධිකාරි කාර්යාලයයේ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුයැ. ටැන්ඩර්කරුවන් කැමැති නම්, ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවරවලින් යුක්, අස් එබූ (සීල් තැබූ) ටැන්ඩර් පත්‍ර ඒ ඒ සෞ. සේ. අධිකාරි කාර්යාලවලැ, ලේකම්/ගණකාධිකාරි වෙත බාරදී ඊට ලදු පතක් ලබාගැනීමට ටැන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට හෝ අවසර ඇත.

6. ටැන්ඩර් දමන මිළ ගණන් පැහැදිලි ඉලක්කමෙන් දක්වා වචන යෙන් ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරීම් සහ මකා දැමීම් සියල්ල ටැන්ඩර්කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටැන්ඩර් පත්‍රය නොසරුප් සේ සලකා පිටු දකිනු ලැබිය හැකිය.

7. බඩු ඇදීම සඳහා සෑහෙන තරම් ප්‍රවාහන පහසුකම් සැලසීමට ටැන්ඩර් කරුවන්ට පිළිවන්කම තිබිය යුතුයි. මේ මෙහෙය සඳහා යොදා ගැනීමට යන වාහනවල ස්වරූපය ටැන්ඩර් එවන විටැ දැක්විය යුතුයි.

8. ටැන්ඩර් පත්‍ර 1969.6.13 වනදා පෙරවරු 10 ට යාපනය සෞ. සේ. අධිකාරී කාර්යාලයයේදී විවෘත කරනු ඇත. ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරමලත් නියෝජිතයින්ට හෝ, තමන් කැමති නම් යාපනය සෞ. සේ. අධිකාරී සමග විධිවිධාන සලසා ගෙන ඔහුගේ අවසරය පිට ටැන්ඩර් විවෘත කරන විටැ පෙනී සිටිමින් තමන් අදිරිපත්කළ ටැන්ඩරයේ දෙවන පිටපත පිරික්සිය හැකිය.

9. ටැන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිළ ගණන්, ටැන්ඩර් බාරගැනීම අවසන් වන දවසේ සිටැ හය මාසයක් දක්වා පිළිගත හැකිසේ තබාගත යුතුයි. ඉදිරිපත් කළ ටැන්ඩර් පත්‍ර පසුවැ අස්කළ හැකි නොවේ.

10. යාපනය සෞ. සේ. අධිකාරී ඉල්ලා සිටියොත්, තමන් ගන්නා කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට තමන් පොහොසත් බවට සාක්ෂි හැටියට ලියකියවිලි හෝ වෙනත් සාධක හෝ ඉදිරිපත් කිරීමට ටැන්ඩර්කරුවන් සූදනමින් සිටිය යුතුයි.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ සිය කාරිය ඉටු කිරීමේදී ටැන්ඩර්කරු සේවයට ගත යුත්තේ ලාංකිකයන් පමණකි. මෙහිදී "ලාංකිකයා" යනුවෙන් හැඳින්වෙන්නේ පර්ම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් හෝ ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි. යාපනය සෞ. සේ. අධිකාරීගේ අව සරය සහ අනුදැනුම කලින් නොලැබ ලාංකික නොවන කම්කරුවන් සේවයට ගැනීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළාක් සේ සළකා, කොන්ත්‍රාත්තුව අවලංගු කොටැ එහි කොන්දේසි ප්‍රකාර දඩයන්ට කොන් ත්‍රාත්කරු යටත් කළ හැකි වරදකි.

12. 1934 අංක 19 දරන කම්කරු වන්දි මුදල් ආඥාපනත හෝ එහි සංශෝධන ලිහිල් කිරීම, එකතු කිරීම යන කීසිවක් හෝ යටතේ යම්කිසි සේවකයෙකු විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන යම් හිමිකමක් වෙතොත්, කොන්ත්‍රාත්කරු විසින් ඒ හැම දෙයකින්මැ ආණ්ඩුව මුදගත යුතුයි.

13. යාපනය සෞ. සේ. අධිකාරී තැන ඉල්ලා සිටින පරිදි මුළු කොන් ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් වෙනුවට රු. 500 කට නොවැඩි ඇප මුදල තැබීම අවශ්‍ය වනු ඇත.

14. තෝරාගනු ලබන ටැන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව සතුටුදයක ලෙස ඉටුකරන බවට සෞ. සේ. අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි. ටැන්ඩර්කරුගේ ටැන්ඩරය බාරගත් බව යාපනය සෞ. සේ. අධිකාරී විසින් හෝ ඔහුගේ නිසි වරම් දරන නියෝජිතයෙකු විසින් හෝ ටැන්ඩර් කරුට දන්වා දස දිනක් ඇතුළතදී කොන්ත්‍රාත්තුවකට අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල තැබීමට හෝ ටැන්ඩර්කරු මැලිවූවොත් හෝ අපොහො සත් වුවහොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තකවී, රජයේ ගිවිසුම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් කිරීමට ද හේතුවේ. ටැන්ඩරය බාරගත් බව දැක්වෙන නිවේදනය ටැන්ඩර් කරු සිය ටැන්ඩරයේ දී ඇති ලිපිනයට තැපෑලෙන් යවා තිබේ නම්, නැත හොත් ඒ ලිපිනය ඇති තැන දමා තිබේ නම්, එය ටැන්ඩර්කරුට ලැබුණු බව ගණන් ගනු ලැබේ.

15. යාපනය සෞ. සේ. අධිකාරීගේ අවසරය කලින් නොගෙන මේ කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට පැවරීම හෝ බෙදදීම හෝ නොකට යුතුයි. කොන්ත්‍රාත්කරුවෙකු තමන් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කරනු පිණිසැ අන් අයෙකුට බලය පවරමින් නිකුත් කළ ප්‍රතිනිධි බලය නොපිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

16. යාපනය සෞ. සේ. අධිකාරී තැන, සෑහෙතැයි තමන්ට පෙනෙන හේතු නිසා, තමා නම් සඳහන් කරන කිසියම් පුද්ගලයෙකු/පුද්ගලයින් කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීම ගැනැ සිය විරුද්ධත්වය ලියවිල්ල කින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටි කලැ ඒ කියන තැනැත්තා/තැනැත් තන් කිසිවෙකුත් කොන්ත්‍රාත්කරු විසින් සේවයට නොගත යුතුයි.

17. කිසිදු ප්‍රශ්නයක් නැතිවැ ටැන්ඩර් සියල්ලමැ හෝ ඉන් කිසිවක් හෝ පිටු දැකීමත් යම් ටැන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමත් රජය සතු අයිතියකි.

18. සෞ. සේ. අධ්‍යක්ෂක තැන සමග කොන්ත්‍රාත්කරු බැඳුණු ගිවිසුම කවරක් වුව ද, තමන් කැමැති අන්දමකින්, තමන් කැමැති කෙනෙකු ලවා එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස යාපනය සෞ. සේ. අධිකාරී වෙත තිබේ. එබඳු විටෙකැදී වැඩ නැතිවීම නිසා තමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ අලාභයක් හෝ අඩුකිරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකරුවෙක්ද නොවේ.

19. ඉහතකී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙන ගොස් බාරදීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වූවොත් නැත්නම් අපොහොසත් වූවොත් හෝ ඒ බඩු බාරදීමට පිට පිට අපොහොසත් වූවොත් හෝ එකී කොන්දේසි කිසිවක් කඩ කළොත් හෝ ඔහු කොන්ත්‍රාත්තුව ඉටු නොකළාක් සේ සළකනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුවේ ඉටු කරන බවට ඔහු ඇපයක් හැටියට තැන්පත් කළ මුදල ද රජය සතුවී, රජයේ කොන්ත්‍රාත්තුවකට හවුල්වීමට ඔහුට ඉඩක් නොලැබෙන පරිදි රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් වීමට ඉඩ තිබේ.

20. ලංකාණ්ඩුවේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදළ වෙයි.

21. ටෙන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දැන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිලි කිසි කළෙකත් සළකා බලනු නොලැබේ.

22. මෙහිලා සඳහන් සියලු කොන්දේසි අකුරට මැ සපුරා නැතහොත්, කිසිදු ටැන්ඩරයක් සළකා බලනු නොලැබේ.

23. ටැන්ඩර්කරුවන්ට දැනගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් වෙතොත්, ඉහත 2 වැනි ඡෙදයේ දැක්වෙන කාර්යාලවලින් ඉල්ලා ලබාගත හැකිය.

24. **දුර ප්‍රමාණ කිට්ටුවෙන්.**—දුම්රිය පොළවල/අතුරු පොළවල සිට ආයතනවලට/කාර්යාලවලට කොපමණ දුරක් තිබේ ද යන වග මේ සමග ඇති උපලේඛනයේ දැක්වේ. මෙහි දැක්වෙන දුර ප්‍රමාණය නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වග නොකියයි.

25. **ගබඩා/බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අය කිරීම.**—කොන්ත්‍රාත් කරු විසින් ගෙන ගොස් බාරදිය යුතු බඩුබාහිරාදිය හෝ ඉන් යමක් හෝ නැතිවූවොත් හෝ හොරකම් කරනු ලැබූවොත් හෝ බඩු බාහිරාදියට අලාභයක්-හානියක් සිදු වුවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දැරීමට සිදුවන රේගු බදු යනාදිය කිසිවක් වෙතොත් එය ද ඇතුළත් කොටැ අලාභ හානි සිදු වූ හෝ සොරකම් කරන ලද හෝ නැතිවූ බඩු බාහිරාදියෙහි මුළු වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමග දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

26. **දැක්විය යුතු මිළ ගණන්.**—(අ) (i) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10 ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන් බී-1 උප ලේඛණයෙහි දැක්විය යුතු :—

පළමුවැ රාත්තල් 28 දක්වා ද,
දෙවනුවැ රාත්තල් 28 ට වැඩියෙන් රාත්තල් 56 දක්වා ද,
තුන්වනුවැ රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වා ද,
සිව්වනුවැ රාත්තල් 84 ට වැඩි හොණ්ඩර 1 දක්වා ද,
පස්වනුවැ හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර $1\frac{1}{2}$ දක්වා ද,
හයවනුවැ හොණ්ඩර $1\frac{1}{2}$ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වා ද,
හත්වනුවැ හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර $2\frac{1}{2}$ දක්වා ද,
අටවනුවැ හොණ්ඩර $2\frac{1}{2}$ ට වැඩියෙන් හොණ්ඩර 3 දක්වා ද,
නමවනුවැ හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර $3\frac{1}{2}$ දක්වා ද,
දසවනුවැ හොණ්ඩර $3\frac{1}{2}$ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වා ද වේ.

(ii) එක් බඩු පොදියක් මුළු දුරමැ ගෙනැ යාම සඳහා එක් එක් බර-ගොල්ල උදෙසා මිල ගණන් දැක්විය යුතුයි.

(iii) මුදල් ගෙවනු ලබන්නේ, ඉහත වැටි ක්‍රමයේ දැක්වෙන බර කුමක් වුවද මුළු දුර ප්‍රමාණයමැ ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවයි.

(iv) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට අඩු නම්, ඒවායේ ගෙවීම බී-I උපලේඛනය යටතේ විය යුතුයි. එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට වැඩිවේ නම් ඒවායේ ගෙවීම තොග ප්‍රවාහණ ගෙවීම් යටතේ බී-II උපලේඛනය යටතේ විය යුතුයි.

(ආ) හොණ්ඩර 4 ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරමැ ගෙන යෑම සඳහා මතු සටහන් වැටි 4 යටතේ බී-II උප ලේඛන යෙහි මිළ ගණන් දැක්විය යුතුයි :—

(1) හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා ;

(2) හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා ;

(3) හොණ්ඩර 15 කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා ;

(4) ටොන් 1 කට වැඩියෙන්.

ටෙන්ඩරකරුවන් විසින් මුළු දුරමැ ගෙන යාම සඳහා ඒ ඒ වැටි යටතේ මිල ගණන් වෙන වෙනමැ දැක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුළු දුරමැ සඳහා හොණ්ඩරයකට දැක්වූ මිළ ගණන මතැ අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටස්ක් රාත්තල් 56 කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැළකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

(ඇ) සඳහන් කර ඇති මිළ ගණන් සාධාරණ විය යුතු අතර යාබද බර කාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩි විය යුතු නොවේ.

27. මේ දැන්වීම, මෙහි පහත තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයත් සමග යාපනය සෞඛ්‍ය සේවා අධිකාරී වෙත ආපසු එවිය යුතුයි.

එස්. රාසරත්තිනම්,
යාපනය සෞඛ්‍ය සේවා අධිකාරී.

1969 මැයි 5 වැනි දින දී ය.

————,
නිකුත් කරන නිලධාරියාගේ අත්සන.

දිනය : 1969..............

————
ටැන්ඩර්කරුගේ අත්සන.

දිනය : 1969..............

**1968–69 ගබඩා බඩු ඇදීම සඳහා ටෙන්ඩර් කොන්දේසිවල 24 වන ඡෙදයේ කියවෙන උපලේඛනය.**

| දුම්රිය පොළෙන්/ පොළට, දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ ස්ථානයට | ආයතනවලින්/ ආයතනවලට කාර්යාලවලින්/ කාර්යාලවලට | කිට්ටුවෙන් සැළකිය හැකි දුර |
|---|---|---|
| | " ඒ " කොටස | |
| | | හැ. |
| මාන්කුලම් | මල්ලාවි ප. ඒ. ... | 10 |
| | තුනුක්කායි ම. බෙ. හල | 13 |
| කිලිනොච්චිය | අකරායන්කුලම ම. බෙ. හල | 10 |
| | වන්නේරිකුලම් ම. බෙ. හල | 12 |
| | කිලිනොච්චිය ර. රෝ. | $\frac{3}{4}$ |
| | වඩ්ඩකච්චි ම බෙ. හල | $6\frac{1}{2}$ |
| | උරුත්තිරපුරම් ම. බෙ./මා. නි. | $6\frac{1}{2}$ |
| පරන්තන් | ධර්මපුරම් ම. බෙ. හල | 10 |
| | කිලිනොච්චිය සෞ. ඒකකය | $\frac{1}{4}$ |
| | කන්දවලෙයි ම. බෙ. හල | 8 |
| එලිපන්ට්පාස් | එලිපන්ට්පාස් ම. බෙ. හල | $\frac{1}{2}$ |
| පලෙයි | පලෙයි ප. ඒ. ... | 1 |
| | වෙන්පියන්පත්තු ග්‍රා. රෝ. | 8 |
| | මුල්ලියන් ම. බෙ. හල | 14 |
| කොඩිකාමම් | අම්බන් ම. බෙ. හා මා. නි. | 14 |
| | කරවෙඩ්ඩි ම. බෙ. හල | 11 |
| | කරවෙඩ්ඩි මා. නි. | 9 |
| | කොඩිකාමම් ම. බෙ. මා. නි. | 1 |
| | පේද්‍රුරුතුඩුව ම. බෙ. හල | 11 |
| | පේද්‍රුරු තුඩුව සෞ. ඒ. | 9 |
| | වරනි ම. බෙ. හා. මා. නි. | 4 |
| | පේද්‍රුරුතුඩුව ර. රෝ. | 9 |
| | " සී " කොටස | |
| කෝන්ඩාවිල් | කෝන්ඩාවිල් ම. බෙ. හල | $\frac{1}{2}$ |
| ඉනුවිල් ... | කෝප්පායි ප. ඒ. ... | 3 |
| | කෝප්පායි සෞ. ඒ. | $3\frac{1}{2}$ |
| | උඩුවිල් ම. බෙ. හල | $1\frac{1}{2}$ |
| | උරුම්පිරායි ම. බෙ. හල | 2 |
| | ඉනුවිල් ... | 2 |
| චුන්නාකම් | අලවෙඩ්ඩි ම. බෙ. හා මා. නි. | $3\frac{1}{4}$ |
| | අච්චුවේලි ග්‍රා. රෝ. | 8 |
| | චුන්කානෙයි ප. ඒ. | 8 |
| | චුන්නාකම් ම. බෙ. හල | $\frac{1}{4}$ |
| | පුන්නාලෙයිකඩ්ඩුවාන් ම. බෙ. | 3 |
| | පුත්තූර් ම. බෙ. හල | 6 |
| | පන්ඩතෙරිප්පු ග්‍රා. රෝ. | 6 |
| | | හැ. |
| චුන්නාකම් | තෝල්පුරම් ම. බෙ. හල | 7 |
| තෙල්ලිප්පලෙයි | තෙල්ලිප්පලෙයි සෞ. ඒ. | 1 |
| | මයිලිඩ්ඩි ම. බෙ. හල | $3\frac{1}{2}$ |
| කන්කසන්තුරෙයි | කන්කසන්තුරෙයි ර. රෝ. | 1 |
| | කන්කසන්තුරෙයි ළය රෝහල | 2 |
| | වැල්වෙට්ටිතුරෙයි ප. ඒ. | 10 |
| මල්ලාකම් | ඒලාලෙයි ම. බෙ. හල | $\frac{3}{4}$ |
| | " බී " කොටස | |
| චාවකච්චේරිය | චාවකාච්චේරි ර. රෝ. | 1 |
| | චාවකච්චේරි සෞ. ඒකකය | $\frac{1}{2}$ |
| | පූනකරි ප. ඒ. ... | $14\frac{1}{2}$ |
| | වේරවිල් ම. බෙ. හා මා. නි. | 30 |
| නාවක්කුලි | කයිතඩි ම. බෙ. ... | $\frac{1}{2}$ |
| යාපනය | අනලතිව් ම. බෙ. හා මා. නි. | 23 |
| | ඩෙල්ෆ්ට් ර. රෝ. | 23 |
| | කාරයිනහර් ම. බෙ. හා. මා. නි. | 13 |
| | කරෙයියූර් ම. බෙ. හා මා. නි. | 2 |
| | කයිට්ස් ර. රෝ. | 14 |
| | කයිට්ස් අයි. ඩී. එච්. | 15 |
| | යාපනය මහා රෝහල | 1 |
| | යාපනය පා. වෛ. නි. | 1 |
| | යාපනය අධි. වෛ. නි. | 1 |
| | යාපනය සෞ. සේ. අධි. | 1 |
| | යාපනය බන්ධනාගාරය | 2 |
| | යාපනය වරාය සෞ. නි. | 2 |
| | යාපනය දන්ත වි. ශා., වෙම්ඩි | 1 |
| | ඉරනෙයිතිව් ම. බෙ. හල | 23 |
| | මන්ඩතිව් ම. බෙ. හා මා. නි. | $7\frac{1}{2}$ |
| | නයිනතිව් ප. ඒ. ... | 26 |
| | පුංගුඩුතිව් ර. රෝ. | 20 |
| | වඩ්ඩුක්කෝට්ටෙයි ග්‍රා. රෝ. | $8\frac{1}{2}$ |
| | වේලනෙයි ම. බෙ. හා මා. නි. | 12 |
| | ළය චිකිත්සාගාරය | $2\frac{1}{2}$ |
| | කප්ට්ස් සෞ. ඒ. | 16 |
| කොකුවිල් | කොකුවිල් ම. බෙ. හල | 1 |
| | මානිපායි සෞ. ඒ. | 4 |
| | මානිපායි ම. බෙ. හා මා. නි. | 3 |

5–452—69 5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූනි මස 6 වැනි දින පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩෙහි ස්වභාවය |
|---|---|
| 1. කු/කුලියාපිටිය කණිෂ්ඨ විශ්ව විද්‍යාලය | (i) ගැලුම් 2000 වතුර ටැංකිය<br>(ii) ජලයන්ත්‍ර කාමරය<br>(iii) ජලය සැපයීම හා බෙදා හැරීම |
| 2. කු/ඉංගරදමුල ම. වි. ... | විද්‍යාගාරය |
| 3. කු/මොරගනේ ම. වි. ... | හස්ත කර්මාන්ත ශාලාව |
| 4. කු/කුලියාපිටිය ම. වි. ... | හස්ත කර්මාන්ත ශාලාව |
| 5. කු/පොතුහැර ම. වි. ... | හස්ත කර්මාන්ත ශාලාව |
| 6. කු/මලියදේව ම. වි. ... | හස්ත කර්මාන්ත ශාලාව |
| 7. කු/දඹදෙණිය ගුරු විද්‍යාලය | නඩත්තුව |
| 8. කු/පරණගම ප්‍රා. වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 9. කු/මාහොලොව වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 10. කු/කුලියාපිටිය ම. ම. වි. ... | පාසල් ගොඩනැගිල්ල |
| 11. කු/බම්මන්න මු. වි. ... | ගුරු නිවාස |

සංලක්ෂ්‍යය.—කු= කුරුණෑගල දිස්ත්‍රික්කය

කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 සඳහා පමණක් රු. 35,000 හෝ ඊට වැඩි ගණනකට, අංක 2 සිට 6 දක්වා රු. 30,000 හෝ ඊට වැඩි ගණනකට, අංක 7 සඳහා පමණක් රු. 25,000 හෝ ඊට වැඩි ගණනකට, අංක 8 සිට 10 දක්වා රු. 20,000 හෝ ඊට වැඩි ගණනකට, අංක 11 සඳහා පමණක් රු. 15,000 හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූනි මස 5 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්) චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

1969 අගෝස්තු මස 15 වන දින සිට මාස තුනක් ඇතුළත මසකට ටොන් 10,000 බැගින් කපා සකස් කර ගන්නා ලද, ඉස්තරම් වර්ගයේ, දුම්රිය ඇන්ජින් සඳහා පාවිච්චි කරන ගල්අඟුරු ටොන් 30,000 ක් මිළ හා වාහන කුලී සහිතව (නැව් කුලී සහිතව) සැපයීම සඳහා කොළඹ 7, පිහිටි ප්‍රවාහන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 ජූනි මස 20 වැනි දින පෙ. ව. 11 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. 1969 ජූනි 20 වැනි දින පෙ. ව. 11.05 ට ප්‍රවාහණ අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

3. 1969 ජූනි 19 වැනි දින දහවල් 12 තෙක්, ඉල්ලා සිටි විට මරදානේ දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ලියා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

4. සෑම ටෙන්ඩරයක්ම දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් බහා එවන කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ "ල. දු. දෙ. දුම්රිය ඇන්ජින් සඳහා වූ ගල්අඟුරු සැපයීම සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩරය—මී. හා වා.—1969" යන්න සඳහන් කළ යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් එවිය හැකිය. කිසියම් දේශීය ටෙන්ඩර්කරුවෙක් සවකීය ටෙන්ඩරය මේ අයුරින් නොඑවන්නේ නම් ඔහු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර (කවරයෙහි, ඉහත 4 වැනි ඡේදයේ සඳහන් විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුය). ප්‍රවාහන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත හෝ ටෙන්ඩර් ලැබීමට හා ඒවා ලැබුණ බව දැන්වීමට බලය පවරන ලද ඔහුගේ නියෝජිතයෙකු වෙත බාරදිය යුතුය.

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පළමුව ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 500 ක් මරදානේ, දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. මේ පිළිබඳ වැඩිදුර විස්තර මරදානේ දුම්රිය ගබඩා අධිකාරි ගෙන් ඉල්ලුම්කර ලබාගත හැක.

8. (1) විශේෂ ණය කොන්දේසි ක්‍රමයක් ඉදිරිපත් කිරීමට හැකි ටෙන්ඩර්කරුවන්ගෙන් පහත සඳහන් අයුරු විකල්ප දීමනා ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටිනු ලැබේ:—

(අ) සාමාන්‍ය ව්‍යවහාරයෙහි පවත්නා ගෙවීම් කොන්දේසි යටතේ ඉදිරිපත් කරන මිළ ගණනත් ;

(ආ) ඉදිරිපත් කර ඇති ණය කොන්දේසි යටතේ ගෙවිය යුතු මිළ ගණනත් ;

ණය කොන්දේසි පිළිබඳ සම්පූර්ණ විස්තර මතු දැක්වෙන තොරතුරුද සහිතව ඉදිරිපත් කළ යුතුය :—

(i) ණය ප්‍රභවය—එනම්, කෙළින්ම ටෙන්ඩර්කරුගෙන්ද එසේ නැතහොත් අපනයන ණය සහතික ක්‍රමයක් හෝ රක්‍ෂණ ක්‍රමයක් වැනි ආණ්ඩුවේ නැතහොත් ආයතනික ණය ක්‍රමයක් මගින්ද යන බව,

(ii) ණය කළ ප්‍රමාණය—(ආපසු ගෙවීමට නියමිත කාල සීමාව අවුරුදු 5 ට නොඅඩුවීම යෝග්‍යය),

(iii) පොළී ප්‍රමාණය.

(2) ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ මිළ ගණන්වලට ඇතුළත් වන රුපියල් වැය කොටස් සහ විදේශ විනිමය වැය කොටස් ප්‍රමාණය වෙන වෙනම සඳහන් කළ යුතුය.

එම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1969.5.9 දින;
කොළඹ දීය.

5-492—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## කටුනායක කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තීරු බද්දෙන් නිදහස් වෙළඳ සැල් පවත්වාගෙන යෑමේ වරප්‍රසාදය

කටුනායක කොළඹ ගුවන් තොටුපලේ පහත සඳහන් තීරු බද්දෙන් නිදහස් වෙළඳ සැල් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පවත්වාගෙන යෑමේ වරප්‍රසාදය පිරිනැමීම සඳහා 1969 ජූනි 1වන දින පෙ. ව. 10.00 තෙක්, "කොළඹ 1, තැ. පෙ. 535," යන ලිපිනයෙහි සිවිල් සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

වෙළඳ සැල—අංක : 1—තීරු බද්දෙන් නිදහස් මත්පැන් හා දුම් කොළ විකිණීම (මාසික අවම බදු කුලිය රු. 3,500.)

වෙළඳ සැල—අංක : 2—තීරු බද්දෙන් නිදහස් ස්වර්ණාභරණ, මැනික් හා ඔර්ලෝසු විකිණීම. (මාසික අවම බදු කුලිය රු. 1,500.)

වෙළඳ සැල—අංක : 3—තීරු බද්දෙන් නිදහස් කැමරා, සුවඳ විල වුන් ආදිය විකිණීම. (මාසික අවම බදු කුලිය රු. 2,000)

වෙළඳ සැල—අංක : 4—පොත්, සඟරා, හා පුවත්පත් ආදිය විකිණීම. (මාසික අවම බදු කුලිය රු. 125)

පූර්වෝක්ත වරප්‍රසාදයන් පිරිනමනු ලබනුයේ පටන්ගන්නා දින සිට දෙ වර්ෂයක කාල පරිච්ඡේදයක් සඳහා යි.

ටෙන්ඩර් කරුවන් අදාල වෙළඳාමෙහි යෙදී යටත්පිරිසෙයින් පස් වර්ෂයකවත් පලපුරුද්දක් ලබා සිටිය යුතුවාත් හැර, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගුවන් තොටුපල් තත්ත්වයන්ට අනුකූලව මෙම වෙළඳ සැල් පවත්වාගෙන යෑමට තමන් සතු සම්පත් හා හැකියාව ගැන සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ තැන සෑහීමට පත්කළ හැකි තත් වයක සිටිය යුතුය. විදේශීය ව්‍යවහාර මුදලින් ගනු දෙනු කිරීම සඳහා විනිමය පාලක තැනගේ අනුමැතිය ලැබීම මීට ඇතුළත්වේ.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කාර්යාලයක හෝ රු. 50 ක මුදලක් තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, 1969 මැයි 27 වැනි දින දහවල් 12.00 තෙක් සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල දෙපිටපතකින් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කල යුතුය.

වැඩි දුර විස්තර සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ.

තැ. පෙ. 535,
ලෝටස් පාර,
කොළඹ 1.

5-423—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

**ජිප්සම් ටොන් 10,000 ක් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි**

ජිප්සම් ටොන් 10,000 ක් සැපයීම සඳහා 1969 ජූනි මස 25 වෙනි දින සවස 2.30 දක්වා ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

සියලුම විස්තර සහ ටෙන්ඩර් පත්‍ර පෝරමයන් පහත දැක්වෙන ලිපිනයෙන් ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර රු. 100 ක මුදලක් තැන්පත් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර 1969 ජූනි මස 25 වෙනි දින දහවල් 12 වනතුරු නිකුත් කරනු ලැබේ.

ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය.

ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය,
තැ. පෙ. 1382,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.

5-486—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

ත්‍රිකුණාමල දිසත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1969 මැයි මස 30 වෙනි ද ප.ව. 2.30 දක්වා, කොළඹ, තැ.පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ප්‍රා.ආ.නි. කෝට්ඨාශය | ලියාපදිංචි විය යුතු මුදල<br>රු. |
| --- | --- | --- |
| අබේපුර පයිප්ලයින් අළුත්වැඩියා කිරීම | නගර හා කඩවත් ... | 16,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචිවී සිටින අයට 1969.5.26 දින ප.ව. 12.30 වනතෙක්, ත්‍රිකුණාමලේ දිසාපති කායභාලයේදී ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයින් විසින් ත්‍රිකුණාමලේ කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ත්‍රිකුණාමලේ දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක් පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී තිබේ නම් මෙහි වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකි වේ. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස් ය. එහෙත්, ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒ බවට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කොට අනු පිටපතක් ද සමග ලේඛන ගත තැපැලෙන් එවිය යුතුය. සීල් තබන ලද ටෙන්ඩරය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම ද ලිපිනය ද වැඩෙහි නම ද ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පත්‍ර තැපැලෙන් නොඑවන්නේ නම් ගාළු මුවදෙර පරණ මහා ලේකම් කායභාලයේ අංක 357 දරණ කාමරයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය.

6. 1969 මැයි මස 30 වෙනිද ප.ව. 2.30 ට ඉහතකී අංක 357 දර කාමරයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ පැමිණ සිටිය හැකිය.

7. ටෙන්ඩර් කරුවන් මෙම කොන්ත්‍රාත්තු යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟ විය යුතුය.

8. වැඩි විස්තර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපතිගෙන් ලබාගත හැකිය.

සී. ඒ. පෙරේරා,
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1969.5.6 දින,
ත්‍රිකුණාමලේ දිසාපති කායභාලයේ දී ය.

5–435—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

නැවත නිර්මාණය කිරීම හා සංවර්ධනය කිරීමේ ජාත්‍යන්තර බැංකුවේ සාමාජික රටවල හෝ ස්විට්සර්ලන්තයේ නිපදවන්නන්ගේ හෝ නියෝජිතයින්ගේ හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන්, ලංකාවේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ මහා මාර්ග උප දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා යන්ත්‍ර, උපකරණ හා ආයුධ සැපයීම සඳහාවූ ටෙන්ඩර්පත්, රජයේ වැඩ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 ක්වූ අගෝස්තු මස 15 වන සිකුරාදා පෙරවරු 10 වන තෙක් බාරගනු ලැබේ.

2. නැවත නිර්මාණය කිරීම හා සංවර්ධනය කිරීමේ ජාත්‍යන්තර බැංකුවේ සාමාජික රටවල හෝ ස්විට්සර්ලන්තයේ නිපදවන ලද උපකරණ සඳහා පමණක් ටෙන්ඩර්පත් සලකා බලනු ලැබේ.

3. (අ) මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ලබාගතහැකි, ර. වැ. දෙ. වේ මහා මාර්ග උප දෙපාතීමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂගෙන්,

(ආ) ලංකාවේ සිටින, නැවත නිර්මාණය කිරීමේ හා සංවර්ධනය කිරීමේ ජාත්‍යන්තර බැංකුවේ සාමාජික රටවල හා ස්විට්සර්ලන්තයේ නිල නියෝජිතයන්ගේ කාර්යාලවලින් හා

(ඇ) ලංකාවේ සිටින, නැවත නිර්මාණය කිරීමේ හා සංවර්ධනය කිරීමේ ජාත්‍යන්තර බැංකුවේ සාමාජික රටවල හා ස්විට්සර්ලන්තයේ, බලයලත් නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙළ කොට, අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි.

4. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ මහා මාර්ග උප දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ටෙන්ඩර්පත් තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය 1969 ක්වූ ජූලි මස 31 වෙනි බ්‍රහස්පතින්ද මධ්‍යම දාවල් 12 ට පෙර ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම් කරන ප්‍රාදේශීය ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

සී. එම්. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාතීමේන්තුව,
කොළඹ 1,
1969 මැයි 5.

5–426—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසිය

ත්‍රිකුණාමලයේ අඩවි වන නිලධාරි කාර්යාලයේ ඇති, ඝන අඩි 318.4 කට සමාන සල්මිල්ල, මිල්ල, බුරුත, වැවරණ, සූරියමාර යන වර්ග වලින් සමන්විත කඳන් 51ක් ද, ඝන අඩි 63.1 කට සමාන හල්මිල්ල, බුරුත, පලු, වැවරණ, මිල්ල යන වර්ග වලින් සමන්විත, ඉරූ ලී කෑලි 135ක් ද, I වන II හා III වන පංතිවලට අයත් කණු 995ක් ද, වට කණු 9ක් ද, දර ඝන යාර 10ක් ද, ඇටඹ බෝට්ටු 2ක් ද, පීහියා 3ක් ද, කඹ 7ක් ද, ගෝනි බෑග් 5ක් ද, ඇළුමිනියම් පිඟන් 3ක් ද, දිග කියත් 2ක් ද, පොරව 4ක් ද, කැන්වස් කෑලි 1 ක් ද, ඇළුමිනියම් කල 1ක් ද, පොල් ගාන හිරමණයක් ද, බුරුම එකක් ද, 1969.5.20 දින පෙරවරු 10 ට ත්‍රිකුණාමලයේ අඩවි වන නිලධාරි කාර්යාලයේ දී, ත්‍රිකුණාමලයේ දිශාවන නිලධාරි (උ.මැ.දි.) විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය ආරම්භ කිරීමට පෙරාතුව, දැව ද්‍රව්‍ය පරීක්ෂා කර බලන ලෙස ඉල්ලුම් කිරීමට බලාපොරොත්තුවන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ඉල්ලුම් කිරීමට බලාපොරොත්තුවන්නන් වෙන්දේසියට අදාල කොන්දේසිවලට අනුකූලතාවය දැක්විය යුතුය. වෙන්දේසිය පිළිබඳ වැඩිමනත් විස්තර සඳහා පහත අත්සන් කරන අයගෙන් හෝ ත්‍රිකුණාමලයේ අඩවි වන නිලධාරිගෙන් හෝ ලබා ගත හැකිය.

එච්. ආර්. පීරිස්,
දිශාවන නිලධාරි, උ.මැ.දි.

1969 අප්‍රේල් මස 14 වැනි දින,
ත්‍රිකුණාමලයේ,
දිශාවන නිලධාරි කාර්යාලයේ දීය.

5–434—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### දව වෙන්දේසිය

කැකිරාව අඩවි වන නිලධාරි කාර්යාලයේ ඇති ඝන අඩි 914.5 කට සමාන හල්මිල්ල කඳන් 128ක්ද, ඝන අඩි 23.9කට සමාන I වන II වන III වන පංතිවලට අයත් ඉරු ලී කෑලි පලල් මඟ සිල්පර කඳන් 50ක් හා I වන පංතියට අයත් තේක්ක කණු 1,750ක් 1969.5.21 දින පෙරවරු 10 ට කැකිරාව අඩවි වන නිලධාරි කාර්යාලයේදී ත්‍රිකුණාමලයේ දිශා වන නිලධාරි (උතුරු මැද දිසාව) විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය ආරම්භ කිරීමට පෙරාතුව කඳන් ඉරු ලී සහ කනු පරීක්ෂා කර බලන ලෙස ඉල්ලුම් කිරීමට බලාපොරොත්තුවන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

වෙන්දේසිය සම්බන්ධව වැඩිදුර විස්තර පහත අත්සන් කරන අයගෙන් හෝ, කැකිරාව අඩවි වන නිලධාරීන්ගෙන් හෝ ලබාගත හැකිය.

එච්. ආර්. පීරිස්,
දිශාවන නිලධාරි, උ.මැ.දි.

1969 අප්‍රේල් මස 14 වැනි දින,
ත්‍රිකුණාමලයේ,
දිශා වන නිලධාරි කාර්යාලයේ දී ය.

5–433—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව—දව වෙන්දේසියේ විකිණීම

නාඋල අඩවියේ ලේමන්කඩ වැඩබිමේ මාගීසන්න ගබඩාවේ ඇති බුරුත, මිල්ල, ඇටතිඹිරි වෑවරණ දාඹු, වෙලන්, හෙරලු, හැලඹ ආදී කඳන් 329 කින් යුක්ත ඝන අඩි 3,628.6ක් 1969 මැයි මස 25 දින පෙරවරු 10 ට නාඋල අඩවි කැලෑ කාර්යාලයේදී වයඹ දිසාකැලෑ නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට වෙන්දේසියට පෙර දැව පරීක්ෂාකර බැලිය හැක. වැඩි විස්තර සඳහා නාඋල අඩවි කැලෑ නිලධාරි හෝ වයඹ දිසා වන නිලධාරි විමසන්න.

ඊ. සී. ද ඉසෙඩ්. වීරවර්ධන,
වයඹ දිසාභාර වන නිලධාරි,
කුරුණෑගල.

1969 මාර්තු 21,
කුරුණෑගලදී.

5–431—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාවේ කඳන් වෙන්දේසියේ විකිණීම

රාජ්‍ය දැව සංස්ථාවේ කොළඹ ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි කැළණි වැලි දැව ගබඩාවේ ඇති ඝන අඩි 401.7 කින් සමන්විත තේක්ක කඳන් තොග 10 ක් 1969 මැයි මස 26 වැනි දින උදේ 10 ට එම ගබඩාවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ දැව මිලදී ගැනීමට අදහස් කරන අය වෙන්දේසියට කලින් එම ස්ථානයට ගොස් දැව පරීක්ෂා කර දැව වල තත්වය හා මිනුම් ප්‍රමානය ගැන සෑහීමට පත්විය යුතුයි. සෑම තොගයක් සඳහා වැඩිම ලංසුව තබන්නා එම විකුනුම අවසන් වූ වහාම දැව වෙන්දේසි කළ දින සිට සංස්ථාවේ වැඩ කරන දින තුනක් ඇතුලත දී දැව සම්පූර්ණයෙන් ඉවත් කර ගත යුතුයි.

වැඩි විස්තර කොළඹ, ප්‍රාදේශීය කළමනාකාර තැනගේ කාර්යාලය, කල්දෙමුල්ල පාර, රත්මලාන හෝ රාජ්‍ය දැව සංස්ථාවේ කැළණි වැලි ගබඩාවේ ගබඩා පාලකගෙන් විමසා දැන ගත හැක.

ඩබ්ලිව්. ඊ. ඇස්. ගුණවර්ධන,
ප්‍රාදේශීය කළමණාකාර තැන (කොළඹ).

5–453/1—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාවේ ඉරුලී වෙන්දේසියේ විකිණීම

රාජ්‍ය දැව සංස්ථාවේ වැල්ලම්පිටියේ අවිස්සාවේල්ල පාරේ පිහිටි ඌරුගොඩවත්ත මධ්‍යම දැව ගබඩාවේ දී ඝන අඩි 9,377.4 ක්ද කම්බි කණු 1,286 ක් හා දර ගෑල 16 කින් සමන්විත ඉරු දැව තොග 83 ක් 1969 මැයි 22 දින හා 28 දින උදේ 10 ට එම ගබඩාවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ දැව මිලදී ගැනීමට අදහස් කරන අය වෙන්දේසියට කලින් එම ස්ථානයට ගොස් දැව පරීක්ෂා කර දැව වල තත්වය හා මිණුම් ප්‍රමාණය ගැන සෑහීමට පත්විය යුතුයි. සෑම තොගයක් සඳහාම වැඩිම ලංසුව තබන්නා එම විකුණුම් අවසන් වූ වහාම දැව වෙන්දේසි කළ දින සිට සංස්ථාවේ වැඩ කරන දින තුනක් ඇතුලත දී දැව සම්පූර්ණයෙන් ඉවත් කර ගත යුතුයි.

වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය කළමනාකාර තැනගේ කාර්යාලය, කල්දෙමුල්ල පාර, රත්මලාන හෝ රාජ්‍ය දැව සංස්ථාවේ ඌරුගොඩවත්ත ගබඩාවේ ගබඩා පාලකගෙන් විමසා දැන ගත හැක.

ඩබ්ලිව්. ඊ. ඇස්. ගුණවර්ධන,
ප්‍රාදේශීය කළමණාකාර තැන,
කොළඹ.

5–453/2—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## පාවිච්චි කළ නොහැකි බඩු වෙන්දේසිය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ) රත්නපුර ළය චිකිත්සාගාරයේ පාවිච්චි කළ නොහැකි බඩු වෙන්දේසිය.

රත්නපුර ළය චිකිත්සාගාරයේ පාවිච්චියට ගත නොහැකි පහත සඳහන් බඩු 27.5.69 දින පෙරවරු 10.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

1. අංක: බීයූ 29803 දරන රළේ පාපැදි ... 1
2. පෑන් රාක්ක ... ... 2
3. සාමාන්‍ය ස්ටෙරලයිසර් (ම. සෞ. ප. සඳහා) ... 1
4. එක්සයිඩ් බැටරි වෝල්ට්ස් 12 සී. 5051 හා සී. 5092 ... 2
5. බී. සී. ජී. කිට් බෑග් ... ... 4
6. 600 × 16 ටයර් ... ... 3

විකුණන දිනට පෙර දින අ. භා. 1 සිට 4.30 දක්වා මෙම බඩු පරීක්ෂා කර බැලීමට ඉඩ ඇත.

මිලදී ගන්නා බඩු වෙනුවෙන් මුදල් ගෙවීම් එම ස්ථානයේදීම කළ යුතු අතර එදිනම සවස 4.30 කලින් එම බඩු ඉවත් කරගත යුතුය.

වෛද්‍ය ඒ. ඇම්. ඩී. රිචඩ්ස්,
ක්ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරී.

1969. 5. 4 වැනි දින,
කොළඹ 12 හි දීය.

5–447—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ ඊ 2 (විකිණීම) ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 මැයි මස 27 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 මැයි මස 26 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය. ඒ ඞී/විකිණීම්/100.
1969 මැයි මස 9 වැනි දින,
කොළඹ රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. ටයර් ... 48
2. යන්ත්‍රෝපකරණ පෙට්ටි 2
3. මෝටර් කාර් අමතර කොටස් පෙට්ටි 1
4. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1
5. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1
6. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1
7. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1
8. විදුලිය උපකරණ පෙට්ටි 1
9. ස්ප්‍රේ යර්ස් කාටුන් 5
10. පොත් කාටුන් 1
11. වයර් රීම් 1
12. පාට විදුලිය බුබුළු පෙට්ටි 2
13. සිල්ක් නූල් පෙට්ටි 1
14. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1
15. කුඩා පොත් (රථවාහන ගැන මුද්‍රණය කළ) පෙට්ටි 1
16. මහන නූල් බේල් 1
17. ඡායාරූප යන්ත්‍රෝපකරණ පෙට්ටි 2
18. පාටකරන ඩයි පෙට්ටි 1
19. වයර් රෝල් 8
20. පා පැදි අමතර කොටස් (පළුදු) කාටුන් 1
21. රථවාහන අමතර කොටස් පෙට්ටි 2
22. කඩදාසි බේල් 55
23. ටොයිලට් පිඟු කාටුන් 1
24. වීදුරු ලාම්පු කාටුන් 2
25. චිම්නි කාටුන් 2
26. සිල්ක් නූල් කොයිල් පෙට්ටි 4
27. හැදි ගෑරුප්පු කාටුන් 4
28. ටැනිස් බෝල කාටුන් 1
29. යකඩ—පෙට්ටි 1
30. කැළැන්ඩර කාටුන් 1
31. රසායනාගාර උපකරණ පෙට්ටි 1
32. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1
33. බොයිලේරු උපකරණ පෙට්ටි 3
34. යතුරු දම්වැල් පෙට්ටි 8
35. කපුරු කුඩු කාටුන් 9
36. කපු බේල් 1
37. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1
38. " බර්නිනා " මහන මැෂින් (පළුදු) 1
39. " ක්‍රෝම් " වායු සමීකරණ 1
40. සිල්ක් නූල් පෙට්ටි 1
41. වයර් කොයිල් 15
42. යන්ත්‍රෝපකරණ පෙට්ටි 4
43. විදුලිය උපකරණ කාටුන් 2
44. රසායන ද්‍රව්‍ය පෙට්ටි 1
45. රසායන ද්‍රව්‍ය කාටුන් 4
46. රථවාහන අමතර කොටස් පෙට්ටි 1
47. රථවාහන අමතර කොටස් කාටුන් 2
48. ඩයි-ඩරම් 4
49. රූෆිං ෂේපල්ව්ස් රෝල් 2
50. ටයර් 2
51. ටයර් 902

5-451—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## රා රේන්ද විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය, 1969–70

ඒ. එක්ස්. 3/68.

1969 මාර්තු මස 21 දින අංක 14,846 දරණ රජයේ ගැසට් පත්‍රයේ පෙනෙන, රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දක්වෙන තැබෑරුම්වල 1969 ඔක්තෝබර් මස 1 දින සිට 1970 සැප්තැම්බර් මස 30 දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පහත දක්වෙන කාර්‍යාලයන්ගෙන් ලබාගත හැකි නියමිත ෆෝර්ම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ, පහත පෙනෙන ''ජී'' තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රා. ආ. නි. ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමග ය. ප්‍රාදේශීය ආදයම් නිලධාරීන්ගෙන් ලබාගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපොලක් විකුණා නැතිනම්, එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ.

(ඒ) ඕනෑම කච්චේරියකින් ;

(බී) කොළඹ 7, සුරාබදු කොමසාරිස් කාර්‍යාලයෙන් ;

(සී) කොළඹ සුරාබදු මණ්ඩල කාර්‍යාලයය ;

(ඩී) කළුතර සුරාබදු මණ්ඩල කාර්‍යාලයය ;

(ඊ) හලාවත සුරාබදු මණ්ඩල කාර්‍යාලයය.

3. සීල් තබන ලද කවරයක බහාලූ එක් එක් ටෙන්ඩර් පත් ඇතුළත් කවරයේ උඩ වම්පස කෙළවරේ '' අංක ........... දරණ රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය—කොළඹ දිස්ත්‍රික්කය 1969/70 '' යනුවෙන් සඳහන්කර (අ) කොළඹ කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි තැපෑලෙන්, කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් උපලේඛනයේ ඒ ඒ තැබෑරුමට කෙළින් දක්වා ඇති වේලාවන් සහ දිනයන්හි දී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේ දී කච්චේරියට පැමිණ සිටිය යුතුය.

4. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දනුම් දෙන ලබන අතර, ඉහත පෙනෙන රා රේන්ද විකිණීම කොන්දේසි ප්‍රකාර, 9 වෙනි කොන්දේසිය යටතේ වරප්‍රසාද විකිණීමේ කොන්දේසිය අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල් වශයෙන් දිසාපතිතැනට ගෙවිය යුතුයි.

5. මිළයට ගන්නා හැටියට වරප්‍රසාදය ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නටද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින්, විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් මුදල් ආපසු දීම සහ ඉහත කී සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ආපසු ගෙවනු ලැබේ.

6. එකක් හෝ සියළුම ටෙන්ඩර්, එසේ කිරීමට කිසි කරුණක් නොදක්වාම ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත තුමාට තිබේ.

7. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ලබාගත හැක.

ඩී. ආර්. උමගිලිය,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කච්චේරිය,
කොළඹ, 1969 මැයි මස 9 වැනි දින.

ඉහත කී තැබෑරුම්වල

## අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව—කොළඹ දිස්ත්‍රික්කය

### කොළඹ නාගරික සභාව

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (ඊ) තැබෑරුම් විවෘත කරන වේලාව | (ඇෆ්) තැබෑරුම් වසන වේලාව | (ජී) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල | (එච්) විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| | | | පෙරවරු | පෙරවරු | පස්වරු | රු. | |
| 1 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර (කෝටබෝම්) | පෙදෙස මෙසේ සීමා වී තිබේ :—උතුරට : ස්කිනර් පාරේ දකුණු පෙදෙස් සන්ධියේ සිට, කෝටබෝම් වීදියේ සන්ධියට සහ ලැස්කැරින් වීදියේ සන්ධිය දක්වාත්ය ; නැගෙනහිරට : ලැස්කැරින් වීදියේ සිට බටහිර පැත්ත ස්කිනර් පාරේ (දකුණු) සන්ධියේ සිට පෙදෙස හා ජම්පටා වීදිය ; දකුණට : එහි සන්ධියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස, කෝටබෝම් වීදිය සහ ලැස්කැරින් වීදියේ සන්ධිය දක්වා පෙදෙස ; සහ බටහිරට : එකී සන්ධියේ සිට කෝටබෝම් වීදියේ නැගෙනහිර පෙදෙස, ජම්පටා වීදියේ සන්ධියේ සිට ස්කිනර් පාර (උතුරට) සන්ධිය දක්වාවූ පෙදෙසත්ය. | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 ... | 69.6.23 |
| 2 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර (ස්කිනර්ස් පාර) | එම සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ උතුරු පෙදෙස, පිකරින් පාරේ සහ කොට හේන වීදියේ සන්ධිය දක්වාවූ පෙදෙස . | 11.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 ... | එම |
| 3 ... | නො. 2 කොට්ඨාශය, මෝදර | (ඒ) ඉහළ වීදියේ ප්‍රදේශය, ඇන්ඩෲ පෙදෙසේ සන්ධිය දක්වා, අලුත් මාවත පාර සහ සාන්ත ඇන්ඩෲ පාරේ සන්ධිය දක්වා, (බී) සාන්ත ඇන්ඩෲ පාර පෙදෙසේ සන්ධිය දක්වා, ඉහළ සාන්ත ඇන්ඩෲ පෙදෙසේ සහ මාෂල් වීදියේ සන්ධිය දක්වා, (සී) මෝදර වීදියේ ප්‍රදේශ සහ එහි සන්ධිය දක්වා, මාෂල් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා, (ඩී) සාන්ත ජේම්ස් වීදියේ දෙපස එහි සන්ධිය දක්වා, මෝදර වීදියේ සහ අලුත්මාවත පාරේ සන්ධිය දක්වා, (ඊ) අලුත්මාවත පාරේ දෙපස සහ එහි සන්ධිය දක්වා, එලී පටුමග සහ පහළ සාන්ත ඇන්ඩෲ පෙදෙසේ සන්ධිය දක්වාත්ය. | දවල් 12.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 ... | එම |
| 4 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය (පර්ගියුෂන් පාර) | ප්‍රදේශය මෙසේ සීමාවී තිබේ :—උතුරට : පර්ගියුෂන් පාර දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ ගඟ දක්වා ; නැගෙනහිරට : ලූකස් පාරේ බටහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ; දකුණට : මාදම් පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා, ලූකස් පාරේ සහ දනියෙල් පාරේ සන්ධිය දක්වා ; බටහිරට : දනියෙල් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, මාදම්පිටිය පාරේ සහ හීනමුල්ල පටුමගේ සන්ධිය දක්වාත්ය. | පස්වරු 2.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 ... | එම |
| 5 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය ... | ප්‍රදේශය මෙසේ සීමාවී තිබේ :—උතුරට : පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්ධිය දක්වා ; නැගෙනහිරට : නාගලගම් වීදියේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා, පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ; දකුණට: මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා, නාගලගම් වීදිය සහ ලූකස් පාරේ සන්ධිය දක්වා ; බටහිරට : ලූකස් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වාය. | 3.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 ... | එම |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (ඊ) තැබෑරුම් විවෘත කරන වේලාව | (ඇෆ්) තැබෑරුම් වසන වේලාව | (ජී) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල | (එච්) විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| | | **කොළඹ දිස්ත්‍රික්කය (කොළඹ නාගරික පෙදෙසින් පිට)** | | | | | |
| | | | පෙ. ව. | පෙ. ව. | ප. ව. | | |
| 6 ... | හැඳල සුළු නගර සභාව, කොට්ඨාශ අංක 4 | හැඳල සු. න. අංක 4 කොට්ඨාශයේ තිඹිරිගස් යාය ගමේ පමණක් | 10.00 ... | 8.00 ... | 8.00 ... | 3,000 ... | 69.6.24 |
| 7 ... | දකුණු අළුත්කුරු කෝරළේ | උස්වැටකෙයියාව ගමේ පමණක් ... | 10.30 ... | 7.00 ... | 7.00 ... | 3,000 ... | එම |
| 8 ... | කඳාන සුළු නගර සභාව කොට්ඨාශ අංක 2 | කඳාන සු. න. අංක 2 කොට්ඨාශයේ කඳාන ගමේ පමණක් | 11.00 ... | 7.00 ... | 7.00 ... | 5,000 ... | එම |
| 9 ... | ජාඇල නගර සභාව කොට්ඨාශය අංක 6 | ජාඇල නගර සභාව කොට්ඨාශ අංක 6 හෙට්ටිගම-වැලිගම්පිටිය ගමේ පමණක් | 11.30 ... | 7.30 ... | 7.30... | 3,000 ... | එම |
| 10 ... | ජාඇල නගර සභාව කොට්ඨාශය අංක 1 | ජාඇල නගර සභාව කොට්ඨාශ අංක 1 කණුවන ගමේ පමණක් | දවල් 12.00 ... | 7.30 ... | 7.30 ... | 3,000 ... | එම |
| 11 ... | දකුණු අළුත්කුරු කෝරළේ | ඒකල-මෙගොඩ බෝලන්ද ගමේ පමණක් ... | පස්වරු 2.00 ... | 7.00 ... | 7.00 ... | 3,000 ... | එම |
| 12 ... | එම ... | බෝපිටිය ගමේ පමණක් ... | 2.30 ... | 7.00 ... | 7.00 ... | 1,500 ... | එම |
| 13 ... | එම ... | මහවත්ත ගමේ පමණක් ... | 3.00 ... | 7.00 ... | 7.00 ... | 1,500 ... | එම |
| 14 .. | එම ... | දඹුගම ගමේ පමණක් ... ... | 3.30 ... | 7.00 ... | 7.00 ... | 1,500 ... | එම |
| 15 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | සිත්තප්පාඩුව ගමේ පමණක් ... | 4.00 ... | 7.00 ... | 7.00 ... | 2,500 ... | එම |
| 16 ... | එම ... | බසියාවත්ත ගමේ පමණක් ... | පෙරවරු 10.00 ... | 7.00 ... | 7.00 ... | 1,500 ... | 69.6.25 |
| 17 ... | එම ... | පිටිපන ගමේ පමණක් ... ... | 10.30 ... | 7.00 ... | 7.00 ... | 3,000 ... | එම |
| 18 ... | එම ... | මූකලන්ගමුව ගමේ පමණක් ... | 11.00 ... | 7.00 ... | 7.00 ... | 4,000 ... | එම |
| 19 ... | එම ... | කටුනායක ගමේ පමණක් ... | 11.30 ... | 7.00 ... | 7.00 ... | 4,000 ... | එම |
| 20 ... | මීගමුව මහ නගර සභාව කොට්ඨාශය අංක 11 | මීගමුව මහ නගර සභාව කොට්ඨාශය අංක 11 කුරණ ගමේ පමණක් | දවල් 12.00 ... | 9.00 ... | 9.00 ... | 4,000 ... | එම |
| 21 ... | මීගමුව මහ නගර සභාව කොට්ඨාශය අංක 10 | මීගමුව මහ නගර සභාව කොට්ඨාශය අංක 10 මහ වීදියේ බෝලවලාන ගමේ පමණක් | පස්වරු 2.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 ... | එම |
| 22 ... | මීගමුව මහ නගර සභාව කොට්ඨාශය අංක 3 | මීගමුව මහ නගර සභාව කොට්ඨාශය අංක 3 කාමච්චෝඩි ගමේ පමණක් | 2.30 ... | 9.00 ... | 9.00 ... | 5,000 ... | එම |
| 23 ... | මීගමුව මහ නගර සභාව කොට්ඨාශය අංක 9 | මීගමුව මහ නගර සභාව කොට්ඨාශය අංක 9 උඩයාර්තෝප්පු ගමේ පමණක් | පස්වරු 3.00 ... | 9.00 ... | 9.00 ... | 3,000 ... | එම |
| 24 ... | මීගමුව මහ නගර සභාව කොට්ඨාශය අංක 5 | මීගමුව මහ නගර සභාව කොට්ඨාශ අංක 5 කුඩාපාඩුව ගමේ පමණක් | 3.30 ... | 9.00 ... | 9.00 ... | 3,000 ... | එම |
| 25 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | දළුපොතගමේ පමණක් ... | 4.00 ... | 7.00 ... | 7.00 ... | 3,000 ... | එම |
| 26 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | පෝරුතොට ගමේ පමණක් ... | පෙරවරු 10.00 ... | 7.00 ... | 7.00 ... | 2,500 ... | 69.6.26 |
| 27 ... | කොච්චිකඩේ සුළු නගර සභාව කොට්ඨාශය අංක 1 | කොච්චිකඩේ සු. න. සභාව අංක 1 කොට්ඨාශයේ සීමාව තුළ පමණක් | 10.30 ... | 7.00 ... | 7.00 ... | 4,000 ... | එම |
| 28 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | නැගෙනහිර පළගතුරේ ගමේ පමණක් ... | 11.00 ... | 7.00 ... | 7.00 ... | 3,000 ... | එම |
| 29 ... | එම ... | ඇත්ගාල ගමේ පමණක් ... ... | 11.30 ... | 7.00 ... | 7.00 ... | 2,500 ... | එම |
| 30 ... | එම ... | නැගෙනහිර කටාන ගමේ පමණක් ... | දවල් 12.00 ... | 7.00 ... | 7.00 ... | 3,000 ... | එම |
| 31 ... | එම ... | බම්බුකුලිය ගමේ පමණක් ... | පස්වරු 2.00 ... | 7.00 ... | 7.00 ... | 1,500 ... | එම |
| 32 ... | එම (බී) ... | දෙමන්හන්දිය ගමේ පමණක් ... | 2.30 ... | 7.00 ... | 7.00 ... | 3,000 ... | එම |
| 33 ... | එම (බී) ... | දගොන්න ගමේ පමණක් ... | 3.00 ... | 7.00 ... | 7.00 ... | 3,000 ... | එම |

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ වවුනියාව දිසාපති කායර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ, වවුනියාව දිසාපති තුමාට හෝ එතුමාගේ කායර්‍යාල සහකාර තැනට හෝ පුද්ගලිකව භාර දිය හැකි නමුත්, ටෙන්ඩර් පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් කෙළවරේ ටෙන්ඩරය එවනු ලැබූ තැබැරුමේ නම හා අංකය සඳහන් කර කවරය සීල් තබා එවිය යුතු ය. එක් එක් ටෙන්ඩරය සම්බන්ධයෙන් එක් ලියුම් කවරය බැගින් පාවිච්චි කළ යුතු අතර, එක් එක් ලියුම් කවරයේ ඉහතින් සඳහන් කර ඇති පරිදි තැබැරුමේ නම හා අංකය සඳහන් කළ යුතුය.

6. විකිණීමේ කොන්දේසි සපුරාලීම වශයෙන් සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම රුපියල් 1,000කට කච්චේරි කුවිතාන්සියක් ඇමිණිය යුතුයි. සියළුම තැන්පත් කිරීම් වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති නමින් විය යුතු ය. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමි වූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට ඉදිරිපත් නොවුවහොත් ඇප මුදල රාජසන්තක වේ.

7. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ බලය වවුනියාව දිසාපති තුමා සතුය.

8. සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරු රාජේන්ද්‍ර මිළට ගත් ලෙස ප්‍රකාශයට පත් කළ වහාම වවුනියාව දිසාපති තුමා විසින් ඇප මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල වහාම දිසාපති තුමා වෙත ගෙවිය යුතු අතර, ටෙන්ඩර්කරු විසින් අවශ්‍ය මුද්දර ඉදිරිපත් කර කොන්දේසි මාලාවකට හා වෙනත් කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතු ය.

9. සාර්ථක ලෙස ටෙන්ඩර් කරන ලද අය ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබැරුම පවත්වාගෙන යාමට තෝරා ගත් ස්ථානය දිසාපති තුමාට දැන්විය යුතු අතර, ඒ සඳහා එතුමාගෙන් අනුමැතිය ලබා ගත යුතු ය.

10. පූර්වෝක්ත විකිණීම සම්බන්ධ කොන්දේසි හා වෙනත් විස්තර සඳහා වවුනියාව දිසාපති කායර්‍යාලයට ලියා විමසන්න.

### උපලේඛනය

| අංකය හා ප්‍රදේශය | | තැබැරුම පිහිටි පළාත් පාලන කොට්ඨාශය | | ටෙන්ඩරය භාර ගන්නා අවසන් වේලාව |
|---|---|---|---|---|
| 1. මුලතිව් | ... | මුලතිව් සුළු නගර සභාව | ... | පෙ. ව. 9.30 |
| 3. මුල්ලියවලෙයි | ... | මුල්ලියවලෙයි ගම් සභාව | ... | පෙ. ව. 9.40 |
| 4. පුතුකුඩිඉරුප්පු | ... | පුතුකුඩිඉරුප්පු ගම් සභාව | ... | පෙ. ව. 9.50 |
| 5. පුදුමාතලන් | ... | පුදුමාතලන් ග්‍රාමය | ... | පෙ. ව. 10.00 |
| 7. වවුනියාව | ... | වවුනියා නගර සභාව | ... | පෙ. ව. 10.10 |
| 9. වට්ටුවාගල් | ... | වට්ටුවාගල් ග්‍රාමය | ... | පෙ. ව. 10.20 |

බී. සී. පෙරේරා,
වවුනියාවේ දිසාපති.

69.5.5,
වවුනියා දිසාපති කායර්‍යාලයේ දී ය.

5–400—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

---

## විවිධ දැන්වීම්

### ආයුර්වේද වෛද්‍යවරයන් ලියාපදිංචි කිරීම

1961 අංක 31 දරණ ආයුර්වේද පණතේ 55 (1) (ඉ) ඡේදය යටතේ පහත සඳහන් සුදුසුකම් ඇති පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරයන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1969. 12. 31 දින තෙක් දීර්ඝ කිරීමට ආයුර්වේද වෛද්‍ය සභාව තිරණය කර තිබේ.

සර්වාංග සහ කැඩුම්-බිඳුම්, ගෙඩි-වණ-පිළිකා, ළදරු රෝග, ගර්භණී හා සූතිකා රෝග, අක්ෂි රෝග, උම්තු රෝග, චර්ම රෝග යන විශේෂ අංශ සඳහා ඉදිරිපත් වන අයදුම් කරුවන් 1952. 12. 31 දිනට දස වසකට නොඅඩු කර්මාභ්‍යාස ලබා තිබිය යුතු වන අතර, වයස අවුරුදු 23 සම්පූර්ණ වී වෛද්‍ය වෘත්තියට බට බවට පිළිගත හැකි සාධක ද ඔප්පු කළ යුතුය. 1962. 10. 1 දිනට කර්මාභ්‍යාස වර්ෂ 10 සම්පූර්ණ වූවන් සහ වර්ෂ 10 සම්පූර්ණ නොවූවන් ලිඛිත පරීක්ෂණ වලට පෙනී සිටිය යුතුය. සර්පවිෂ අංශය සඳහා ඉදිරිපත් වන අයදුම් කරුවන්ට ඉහත සඳහන් කර්මාභ්‍යාස පිළිබඳ කොන්දේසි බලපානු ලබන අතර, ඔවුන් 1952. 12. 31 වෙනි දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වී වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටි බවට පිළිගත හැකි සාධක ඉදිරිපත් කළ යුතු වේ.

මේ සඳහා අවශ්‍ය සභාවේ මුද්‍රාව සහිත ඉල්ලුම් පත් ෆෝර්ම හා විෂය මාලාව ද එකකට රු. 1 බැගින් ගෙවා මෙම කායර්‍යාලයෙන් පැමිණ හෝ නියමිත මුදල තැපැල් හෝ මුදල් ඇනවුමකින් ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමෙන් ලබාගත හැක. මුද්දර භාරගනු නො ලැබේ.

ඩී. එච්. එදිරිසිංහ,
ලේඛකාධිකාරි,
ආයුර්වේද වෛද්‍ය සභාව.

325, කෝට්ටේ පාර,
කොළඹ 8, 1969 4. 29.

5–350—69.5.15 දින අංක 14,854 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය**

### උපලේඛනය

**1969**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 3. 1.69 | සිකුරාද | ... | 24.12.68 | අඟහරුවාද | ප.ව. | 3.30 |
| | | 9. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 3. 1.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 16. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 9. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 24. 1.69 | සිකුරාද | ... | 16. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 31. 1.69 | සිකුරාද | ... | 24. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි | ... | 7. 2.69 | සිකුරාද | ... | 31. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 14. 2.69 | සිකුරාද | ... | 7. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 2.69 | සිකුරාද | ... | 14. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ... | 20. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මාර්තු | ... | 7. 3.69 | සිකුරාද | ... | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 14. 3.69 | සිකුරාද | ... | 7. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 3.69 | සිකුරාද | ... | 14. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 28. 3.69 | සිකුරාද | ... | 21. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | ... | 3. 4.69 | බ්‍රහස්පතින්ද | ... | 27. 3.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 11. 4.69 | සිකුරාද | ... | 31. 3.69 | සඳුද | ප.ව. | 3.30 |
| | | 18. 4.69 | සිකුරාද | ... | 8. 4.69 | අඟහරුවාද | දවල් | 12.00 |
| | | 25. 4.69 | සිකුරාද | ... | 18. 4.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 30. 4.69 | බදාද | ... | 25 4.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| මැයි | ... | 9. 5.69 | සිකුරාද | ... | 30. 4.69 | බදාද | ප.ව | 3.30 |
| | | 16. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 9 5.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 22. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 15. 5 69 | බ්‍රහස්පතින්ද | දවල් | 12 00 |
| | | 30 5 69 | සිකුරාද | ... | 22. 5 69 | බ්‍රහස්පතින්ද | දවල් | 12 00 |
| ජූනි | ... | 6 6.69 | සිකුරාද | ... | 30 5.69 | සිකුරාද | දවල් | 12 00 |
| | | 13. 6.69 | සිකුරාද | ... | 6. 6.69 | සිකුරාද | දවල් | 12 00 |
| | | 20. 6.69 | සිකුරාද | ... | 13. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 27 6.69 | සිකුරාද | ... | 20 6.69 | සිකුරාද | ප ව | 3 30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්.
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1968 දෙසැම්බර් මස 20 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.